අධ්‍යාපන අමාත්‍යාංශය

# "අධ්‍යාපනය සඳහා සාධාරණ ඉඩහසරක්"

# අන්තර්කරණ අධ්‍යාපන මාර්ගෝපදේශය

නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය"
බත්තරමුල්ල

# “අධ්‍යාපනය සඳහා සාධාරණ ඉඩහසරක්”

# අන්තර්කරණ අධ්‍යාපන මාර්ගෝපදේශය

**සැකසුම:**

ජපන් අන්තර්ජාතික සහයෝගිතා ආයතනයේ REACH ව්‍යාපෘති
කණ්ඩායම සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව.


**මුද්‍රණය සඳහා අනුග්‍රහය:**

අධ්‍යාපන අමාත්‍යාංශය සහ සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEMP)

**අධ්‍යාපන අමාත්‍යාංශය** **GEMP**

**ඔබේ අවධානයට ...........**

සෑම ළමයෙකුගේම අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම උදෙසා ඔවුන්ට අධ්‍යාපන අවස්ථා සැලසීම සෑම පුරවැසියකුගේම යුතුකම හා වගකීම ද වන්නේ ය. එහි දී ළමයින්ගේ අධ්‍යාපන අවස්ථා අහිමිවීම හෝ අවමවීම සඳහා හේතුවී ඇති සාධක හඳුනාගනිමින් එම බාධක ඉවත් කරලීම හෝ අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු ය. එනම්, සෑම ළමයෙකුටම අධ්‍යාපනය ලැබීම සඳහා සාධාරණ ඉඩහසරක් ලබා දිය යුතු ය.

පවුලේ ආර්ථික අපහසුතා, දෙමව්පිය නොදැනුවත්භාවය, දෙමව්පියන්ගේ වෙන්වීම ඇතුලු නිවස පදනම් වූ ගැටලු රාශියක් හේතුවෙන් ළමයින්ගේ අධ්‍යාපන අවස්ථා අහිමිවී ඇත. එසේම පාසල ප්‍රියජනක ස්ථානයක් නොවීම, පාසල තුළින් මතුවන්නා වූ විවිධ තර්ජන හා පීඩාවන්, හිංසා, විෂයමාලා ගැටලු ආදි හේතු මත ද ළමයින්ගේ අධ්‍යාපන අවස්ථා අවමවී ඇත. තවද ආගම්, ජාති, කුල ආදි වූ සමාජ සාධක පදනම් කරගනිමින් ද විධිමත් අධ්‍යාපනයට ප්‍රවේශය, සහභාගිත්වය හා අධ්‍යාපනයේ සාධන අවස්ථා අහිමිවීම හෝ අවමවී ඇත. එසේම ළමයින් තුළ පවත්නා විවිධ දුබලතා, ආබාධ, රෝගී තත්ව වැනි පුද්ගල බද්ධ සාධක හේතුවෙන් ද ළමයින්ගේ අධ්‍යාපන අවස්ථා අහිමිවී ඇත. එසේම පාසල්වල පවත්නා විවිධත්වය, සම්පත් බෙදීයාමේ විෂමතාව වැනි රාජ්‍ය ප්‍රතිපත්තිමය සාධක හමුවේද අධ්‍යාපන අවස්ථා අහිමිවී ඇත. මෙම සියලු සාධක හේතුවෙන් ළමයින්ගේ අධ්‍යාපන අයිතිය අහිමිවී ඇත.

අනිවාර්ය අධ්‍යාපන වයසේ (අවුරුදු 5-16) සිටින සෑම ළමයෙකු ම විධිමත් අධ්‍යාපන ක්‍රියාවලියෙහි සිටිය යුතු ය. එහෙත් ඉහත සාධක මත එම වයසේ ළමයින්ගෙන් පිරිසක් විධිමත් අධ්‍යාපන ක්‍රියාවලියෙන් බැහැරව සිටිති.

මෙරට වාර්ෂිකව විධිමත් අධ්‍යාපනයට යොමුවිය යුතු ළමයින්ගෙන් 2%කට ආසන්න ප්‍රමාණයක් ප්‍රවේශ නොවන තත්වයක් පවතින අතර තවත් විශාල පිරිසක් අතරමග අධ්‍යාපනයෙන් ගිලිහෙන තත්වයක් පවතී. විශේෂයෙන් දුබලතා සහිත ළමයින් සහ අවාසි සහගත පරිසරවල සිටින ළමයින් මෙම තත්වයට බහුලව මුහුණ දී සිටන බව අනාවරණ වේ. දුබලතා සහිත ළමයින් පාසල් ප්‍රවේශයේ දී ප්‍රතික්ෂේපවීම බහුලව සිදු වේ. යම් හෙයකින් ප්‍රවේශ වුවද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඔවුන්ගේ සක්‍රිය සහභාගිත්වය ලබා ගැනීමට හා අපේක්ෂිත සාධන මට්ටම් වෙත ළමයින් ගෙන යාමේ පසුගාමීත්වයක් බොහෝ පාසල්වල දැකිය හැකි වේ.

යමෙකුගේ දුබලතාවක් හෝ වෙනයම් ගැටලුවක් පදනම්ව අධ්‍යාපන ක්‍රියාවලියෙන් ප්‍රතික්ෂේප කිරීමක්, බැහැර කිරීමක් හෝ වෙන්කිරීමක් නොකළ යුතු බව වර්තමානයේ ජාත්‍යන්තර පිළිගැනීම වේ. ඒ සඳහා අන්තර්කරණ අධ්‍යාපනය ඉතා පුළුල් ලෙස ලොව පුරා ක්‍රියාත්මක කරනු ලබයි. එහෙත් ශ්‍රී ලාංකික සමාජය තුළ තවමත් දුබලතා සහිත වූවන් ප්‍රතික්ෂේප කිරීම, වෙන්කර තැබීම බහුලව සිදු වේ. විශේෂයෙන් අධ්‍යාපන ක්‍රියාවලියේ දී දුබලතා සහිත ළමයින් සහ අවාසි සහගත පරිසරවල ජීවත්වන ළමයින් ප්‍රතික්ෂේප කිරීම මෙන්ම විශේෂ අධ්‍යාපන ඒකකවලට යොමුකිරීමේ ක්‍රියාවලිය තවදුරටත් සිදු වේ. මෙම පසුගාමී සංකල්පය කඩිනමින් බැහැර කළ යුතු අවධියකට අප ප්‍රවිෂ්ට වී ඇත. ඒ සඳහා තබන එක් පියවරක් ලෙස මෙම මාර්ගෝපදේශ සංග්‍රහය ඔබ වෙත ඉදිරිපත් කර ඇත. විශේෂයෙන් පාසල් අධ්‍යාපන ක්‍රියාවලිය සෑම ළමයෙකුගේම අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම උදෙසා සකස් විය යුතු ය. ඒ සඳහා මෙම උපදෙස් සංග්‍රහයේ ඇති මඟපෙන්වීම් අනුව දරුවන්ගේ අධ්‍යාපන අයිතිය සඳහා සාධාරණ ඉඩහසරක් ලබා දෙමින් අධ්‍යාපන ක්‍රියාවලිය සියලු ම අධ්‍යාපන වෘත්තිකයන් විසින් මෙහෙයවනු ඇතැයි අපි විශ්වාස කරමු.

## උපදෙස් සංග්‍රහය භාවිතයට මඟපෙන්වීම ......

මෙහි පළමු කොටස "විශේෂ අධ්‍යාපනය කලාප තක්සේරු කමිටුව මඟින් විශේෂ අවශ්‍යතා ඇති දරුවන් තක්සේරුව සඳහා අත්පොත" නමින් නම්කර ඇත. කිසිදු ළමයෙකු විශේෂ අවශ්‍යතා සහිත ළමයෙකු ලෙස නම් කිරීමට ගුරුවරුන්ට හෝ විදුහල්පතිවරුන්ට අවසරයක් නොමැත. යම් දුබලතා ලක්ෂණ ළමයෙකු තුළ පෙන්නුම් කරයි නම් දෙමව්පියන්, ගුරුවරුන් හෝ විදුහල්පතිවරුන් කළ යුත්තේ තම අධ්‍යාපන කලාපයේ තිබෙන විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුවට යොමුකර එය තහවුරු කර ගැනීමයි. අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 33/2022 චක්‍රලේඛය මඟින් ඊට අදාළ නීතිමය ප්‍රතිපාදන සහ ගත යුතු ක්‍රියාමාර්ග දක්වා ඇත. එම ක්‍රියාවලිය සහ නීතිමය තත්වය සාරාංශගත කොට පහසුවෙන් අවබෝධවන ලෙස මෙහි පළමුවන කොටස සකස්කර ඇත.

මෙම උපදෙස් සංග්‍රහයෙ දෙවන කොටස මඟින් විශේෂ අධ්‍යාපන ඒකකවල සිටින ළමයින්ගේ සහ සාමාන්‍ය පන්තිකාමරවල සිටින දුබලතා සහිත ළමයින්ගේ ඉගෙනුම් ක්‍රියාවලියට භාවිත කළ හැකි ඉගෙනුම් ආධාරක සහ ඒවා භාවිත කළ හැකි ආකාරය පිළිබඳ උපදෙස් සපයා ඇත. විශේෂයෙන් විවිධ දුබලතා සහිත තත්වයන්ට අනුව භාවිත කළ හැකි ඉගෙනුම් ආධාරක වර්ග සහ ඒවා භාවිත කළ හැකි ආකාරය පැහැදිලි කර ඇත.

"අන්තර්කරණ අධ්‍යාපනය ප්‍රවර්ධනය සඳහා අත්පොත" නමින් නම්කර ඇති අවසාන කොටස මඟින් අන්තර්කරණ අධ්‍යාපන සංකල්පය පැහැදිලි කිරීම, අන්තර්කරණ පාසලක් ගොඩනැගීමේ දී කළ යුතු ක්‍රියාකාරකම් පිළිවෙලට පෙළ ගැසීම සිදු කර ඇත.

නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය

## පටුන

**විශේෂ අධ්‍යාපනය කලාප තක්සේරු කමිටුව මගින් විශේෂ අවශ්‍යතා ඇති දරුවන් තක්සේරුව සඳහා අත්පොත** .......... 1

**පෙරවදන** .......... 2

1. **තක්සේරුකරණයේ අරමුණු** .......... 3
2. **කලාපයීය විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුව (ZACSE) පිළිබඳ දළ විශ්ලේෂණය** .......... 3

    **2.1 ZACSE යනු කුමක් ද?** .......... 3

    **2.2 ZACSE සාමාජිකයින් කවුද?** .......... 3

    **2.3** තක්සේරුකරණය සිදු කිරීමට හැකියාව ඇති වෙනත් ආයතන .......... 4

    **2.4** දුබලතා වර්ගීකරණය .......... 4

    **2.5** තක්සේරුකරණ ඉලක්කය .......... 5

    **2.6** තක්සේරුකරණ දින .......... 5

    **2.7** සුදුසු වේලාවක් වෙන් කර ගැනීම .......... 5

    **2.8** ස්ථානය .......... 5

    **2.9** රැගෙන ආ යුතු ලියකියවිලි .......... 5

3. **විශේෂ අවශ්‍යතා සහිත දරුවන් මුල් ළමා වියේ දී ලියාපදිංචි කිරීම සහ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ** .......... 6
4. **තක්සේරුකරණ ප්‍රවාහය** .......... 7
5. **තක්සේරුකරණයට පසු** .......... 8

**විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා ඉගෙනුම්-ඉගැන්වීම් ආධාරක එකතුව** .......... 9

හැඳින්වීම .......... 10

**ජීවන කුසලතා**

1. සපත්තු ලේස් ගැට ගසමු .......... 11
2. අපි දත් මදිමු .......... 12
3. ක්‍රියා පද භාවිත කරමු .......... 13
4. ඇඳුම් කට්ටලය .......... 14

**සන්නිවේදන කුසලතා**

5. සන්නිවේදන කාඩ්පත් .......... 15
6. ඔබ කැමති මොනවාට ද? .......... 16

**සමාජ කුසලතා**

7. එකට සෙල්ලම් කරමු ........................................17

8. මතක ක්‍රීඩා ........................................18

**මූලික සංකල්ප**

9. වර්ණ හඳුනා ගනිමු ........................................19

10. පාට ගළපමු ........................................20

11. පාට බොත්තම් වෙන් කරමු ........................................21

**පෙර ලිවීමේ කුසලතා**

12. කඩදාසි කෝප්ප සමඟ සෙල්ලම් කරමු ........................................22

13. ප්ලාස්ටික් හැඳි සමඟ සෙල්ලම් කරමු ........................................23

14. කාර් රථයට රෝද සවි කරමු ........................................24

15. හැඩයේ සීමාව තුළ වර්ණ ගැන්වීම ........................................25

16. වැලි පිල්ලේ අකුරු ලියමු ........................................26

**පෙර කියවීම/කියවීමේ කුසලතා**

17. අකුරු/වචන ඉගෙන ගනිමු ........................................27

18. රොකට්ටුවෙන් වචන හදමු ........................................28

19. රූපවාහිනී තිරයේ ඇති පින්තූර/වචන කියවමු ........................................29

**පෙර ගණිතය / ගණිත කුසලතා**

20. ඉලක්කම් කුළුණක් හදමු ........................................30

21. අංක ගළපමු ........................................31

22. අංක හඳුනා ගෙන ලියමු ........................................32

23. වැහි බිඳු ගණන් කරමු ........................................33

24. අපි ගණන් කරමු, ඉලක්කම් එකතු කරමු ........................................34

**පොදු ඉගෙනුම් ඉගැන්වීම් ආධාරක**

25. A ගේ සටහන ලියමු ........................................35

26. දෘශ්‍ය කාලසටහන ........................................36

**අන්තර්කරණ අධ්‍යාපනය ප්‍රවර්ධනය සඳහා අත්පොත** ........................................37

කෙටියෙදුම් ........................................38

1 වන පරිච්ඡේදය - හැඳින්වීම ........................................ 39

2 වන පරිච්ඡේදය - දේශීය මුලපිරීම් ශක්තිමත් කිරීම ....................................................................43

2.1 පාසල් ප්‍රජාව දැනුවත් කිරීම ....................................................................43

2.2 විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් බඳවා ගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා පද්ධතිය ශක්තිමත් කිරීම ....................................................................45

3 වන පරිච්ඡේදය - පාසල පුරා ප්‍රයත්න ශක්තිමත් කිරීම....................................................................48

3.1 පාසල තුළ සහය පද්ධතියක් ස්ථාපිත කිරීම ....................................................................48

3.2 පාසල් සංවර්ධන සැලසුම්වලට අන්තර්කරණ අධ්‍යාපනය අන්තර්ගත කිරීම ..............................50

3.3 පාසල්වල මූලික යටිතල පහසුකම් සංවර්ධනය....................................................................52

4 වන පරිච්ඡේදය - ගුරුවරුන්ගේ නිපුණතා සංවර්ධනය ....................................................................55

4.1 විශේෂ අධ්‍යාපන ඒකක ගුරුවරුන්ගේ නිපුණතා සංවර්ධනය ....................................................55

4.2 ප්‍රධාන ධාරාවේ ගුරුවරුන්ගේ නිපුණතා සංවර්ධනය....................................................................59

4.3 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ තුළ අන්තර්කරණ අධ්‍යාපනය ප්‍රධාන ප්‍රවණතාව ලෙස ......................64

# විශේෂ අධ්‍යාපනය කලාප තක්සේරු කමිටුව මඟින් විශේෂ අවශ්‍යතා ඇති දරුවන් තක්සේරුව සඳහා අත්පොත

# පෙරවදන

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2020 දෙසැම්බර් 3 වැනි දින නිකුත් කර අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ පල කර ඇති "විශේෂ අධ්‍යාපන අවශ්‍යතා හා විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා අධ්‍යාපන පහසුකම් සැලසීම ඇතුළු සියලු ම ළමයින් සඳහා අන්තර්කරණ අධ්‍යාපනය ලබා දීම පිළිබඳ චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහය" (යොමු අංක 37/2020) අනුව, විශේෂ අවශ්‍යතා ඇති සියලු ම දරුවන් සුදුසු අධ්‍යාපන අවස්ථා ලබා ගැනීම සඳහා අධ්‍යාපන තක්සේරුවකට භාජනය කිරීමට අවශ්‍ය වේ. මෙම චක්‍රලේඛයට අනුකූලව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සෑම කලාප අධ්‍යාපන කාර්යාලයක ම විශේෂ අධ්‍යාපනය සඳහා වූ "කලාපයීය විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුව" (ZACSE) පිහිටුවා එහි සාමාජිකයන් පුහුණු කර ඇත. එහි අරමුණ වන්නේ විශේෂ අවශ්‍යතා ඇති සෑම දරුවෙකුට ම ඇයගේ/ඔහුගේ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා නිවැරදිව හඳුනා ගෙන ඔවුන්ට වඩාත් උචිත ඉගෙනුම් ස්ථානය තීරණය කිරීම සහ ලබා දීම සඳහා අධ්‍යාපනික තක්සේරුවක් සිදු කිරීමයි. සෑම දරුවෙකුගේ ම අනන්‍ය අවශ්‍යතා අනුව අඛණ්ඩ සහ පුද්ගලානුබද්ධ සහය ලබා දීම සඳහා කමිටුව ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.



මෙම අත්පොත 2022 සැප්තැම්බර් 8 වැනි දින නිකුත් කර අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ පල කර ඇති "විශේෂ අධ්‍යාපන තක්සේරුකරණය පිළිබඳ චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහය" (යොමු අංක 33/2022) හි ZACSE හා සම්බන්ධ කොටස්වල උධෘත ඇතුළු වන සංක්ෂිප්තයකි. මෙම අත්පොත ZACSE සාමාජිකයින්ට, අධ්‍යාපන පරිපාලකයින්ට සහ ගුරුවරුන්ට පහසු පරිශීලනයක් සහ විශේෂ අවශ්‍යතා සහිත ළමුන් පාසල් ඇතුළත් කර ගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා වන තක්සේරුව පිළිබඳ ඉක්මන් තොරතුරු ලබා දීම සඳහා නිර්මාණය කර ඇත.

විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ට යෝග්‍ය ඉගෙනුම් අවස්ථා සහ ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා උපරිම ප්‍රවේශය ලබා දීමට අවස්ථාව සැලසෙන පරිදි මෙම අත්පොත උපරිමයෙන් භාවිත කරනු ඇතැයි බලාපොරොත්තු වේ.

දිනය: 2024.01.26

වසන්තා පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

## 1. තක්සේරුකරණයේ අරමුණු

අංක 33/2022 චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහයට අනුව, විධිමත් අධ්‍යාපන තක්සේරු ක්‍රමවේදයක් අවශ්‍ය දරුවන් හඳුනා ගැනීම, ඔවුන් පාසල්වලට ඇතුළත් කර ගැනීමට පහසුකම් සැලසීම සහ ඔවුන්ගේ සංවර්ධනයට සහාය වීම සඳහා පුද්ගලබද්ධ ඉගෙනුම් සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා එය නිකුත් කර ඇත. එනම්, චක්‍රලේඛයේ අරමුණ වන්නේ සුදුසු අධ්‍යාපන අවස්ථා සඳහා ප්‍රවේශය සහතික කිරීම සහ විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම මිස ළමයින් උපයා ගන්නා ලකුණු මත පදනම් ව යාන්ත්‍රිකව පාසල් වෙන් කිරීම නොවේ. තක්සේරු කිරීමේ දී පහත සඳහන් පරිදි අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයක් තිබේ.

1. දරුවාට කළ නොහැකි දෑ සොයනවාට වඩා, දරුවා සතුව ඇත්තේ කුමන ආකාරයේ ශක්තීන්ද සහ දරුවා සාමාන්‍ය පන්තියකට ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය සාධාරණ ඉඩ හසර මොනවා ද යන්න පිළිබඳ ව මනසේ තබා ගෙන තක්සේරුව සිදු කරන්න.
2. සම්පූර්ණ ලකුණු මත පමණක් නිර්දේශ පදනම් නොකරන්න. නිදසුනක් වශයෙන්, දරුවාට බුද්ධිමය දුබලතාවයක් නොමැති වුවද දළ හෝ සියුම් චාලක කුසලතා ඉටු කිරීමට නොහැකි නම් (උදා: ශාරීරික දුර්වලතා / අත් පා අඩු වීම හෝ අත් පා අහිමි වීම් නිසා ඇති වූ විකලාංග දුබලතා හේතුවෙන්), පොදු ඇගයීම් ආකෘතියේ ලකුණු අඩු විය හැකි ය. එවැනි අවස්ථාවක සාමාන්‍ය අධ්‍යාපන අවස්ථා සහ දුබලතා අවම කර ගැනීමට අවශ්‍ය පහසුකම් සපයා ඔවුන්ගේ ඉගෙනීමට අතහිත දීමට ගැලපෙන සේ නිර්දේශ ලබා දෙන්න.
3. පාසල් වර්ගය තීරණය කිරීමේ දී දරුවාගේ සහ දෙමාපියන්/භාරකරුවන්ගේ කැමැත්තට ගරු කිරීම අවශ්‍ය වේ. එනමුත් සෑම දරුවෙකුට ම ලබා දිය හැකි හොඳ ම අධ්‍යාපන ප්‍රවේශය තේරුම් ගැනීමට සහ හඳුනා ගැනීමට කමිටු සාමාජිකයින්ට හැකි විය යුතු අතර, තීරණයක් ගැනීමට පෙර දෙමාපියන්/භාරකරුවන්ට ඒ පිළබඳ ව පැහැදිලි කර දීම අත්‍යවශ්‍ය වේ.

## 2. කලාපයීය විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුව (ZACSE) පිළිබඳ දළ විශ්ලේෂණය (අංක 37/2020 සහ අංක 33/2022 චක්‍රලේඛ අනුව)

### 2.1 ZACSE යනු කුමක් ද?

ZACSE යනු ප්‍රදේශයේ විශේෂ අවශ්‍යතා ඇති ළමුන් පිළිබඳ තක්සේරුව සිදු කිරීම සහ එක් එක් දරුවාගේ අවශ්‍යතා අනුව සුදුසු අධ්‍යාපනික ප්‍රවේශය තීරණය කිරීම සඳහා සෑම අධ්‍යාපන කලාපයක ම පිහිටුවා ඇති කමිටුවකි.

### 2.2 ZACSE සාමාජිකයින් කවුද?

ZACSE හි සාමාජිකයින් පහත පරිදි වේ.

- විශේෂ අධ්‍යාපන - නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
- ප්‍රාථමික අධ්‍යාපන - නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
- විශේෂ අධ්‍යාපන ගුරු උපදේශකවරයකු
- ප්‍රාථමික අධ්‍යාපන ගුරු උපදේශකවරයකු
- විශේෂ අධ්‍යාපන ජ්‍යෙෂ්ඨ ගුරුවරයා

ඉහත කමිටු සාමාජිකයින්ගෙන් අවම වශයෙන් තිදෙනෙකු තක්සේරුව සිදු කරන අවස්ථාවේ දී සිටිය යුතු අතර ඔවුන් තිදෙනාගෙන් දෙදෙනෙකුට අනිවාර්යයෙන් ම විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෘත්තීය අත්දැකීම් තිබීම අත්‍යවශ්‍ය වේ.

විශේෂ අධ්‍යාපන තක්සේරුකරණ පුහුණුව ලැබූ සාමාජිකයින්ට වසර තුනක (03) කාලයක් සඳහා තක්සේරුකරණය සිදු කිරීමට බලය පවරමින් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් සහතිකයක් නිකුත් කරනු ඇත.

## 2.3 තක්සේරුකරණය සිදු කිරීමට හැකියාව ඇති වෙනත් ආයතන

ZACSE ට අමතරව, තක්සේරුකරණය කිරීම සඳහා පහත සඳහන් ආයතන ද නම් කර ඇත. තක්සේරුවෙන් පසුව, ඔවුන් තක්සේරු වාර්තාව ZACSE වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

(1) අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතන
(2) "ශිෂෝ්‍යාදා" විශේෂ හා අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ ආයතනය, වෙනිවැල්කොළ
(3) ඔටිසම් ළමා සංවර්ධන මධ්‍යස්ථානය, මහරගම
(4) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු මගින් පිහිටුවන ලද තක්සේරු කරන මධ්‍යස්ථාන
(5) පළාත් අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථාන

## 2.4 දුබලතා වර්ගීකරණය

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් දුබලතා සහිත ළමයින් පහත පරිදි කාණ්ඩ 14කට වර්ගකර ඇත.

(1) ඔටිසම් පරාසීය දුබලතාව / ඔටිසම් රේඛීය පරාසය - Autism Spectrum Disorder (ASD)
(2) සමස්ත සංවර්ධන ප්‍රමාදය - Global Development Delay
(3) බුද්ධිමය දුබලතා - Intellectual Disability
(4) මොළයට සිදු වූ හානි - Brain Injury
(5) පූර්ණ බිහිරි - Deafness හෝ ශ්‍රවණ ඌනතා - Hearing Impairment
(6) පූර්ණ අන්ධ - Blindness හෝ දෘෂ්ටි ඌනතා - Visual Impairment
(7) බහුවිධ දුබලතා - Multiple Disabilities
(8) ඩවුන්ගේ සහලක්ෂණය (ඩවුන් සින්ඩ්‍රෝමය - Down Syndrome) සහ ළමා රෝග විශේෂඥයන් විසින් නිර්දේශ වූ වෙනත් සහලක්ෂණයන්) සින්ඩ්‍රෝමයන්
(9) කායික ඌනතා - Orthopedic Impairment
(10) සුවිශේෂී ඉගෙනුම් දුබලතා - Specific Learning Disabilities
(11) චිත්තවේගී හැසිරීම(ගැටලුකාරී) – Emotional Behavior (Problamatic)
(12) අඳ බිහිරි-- Deaf-Blindness
(13) කථන හෝ භාෂණ දෝෂ - Speech or Language Disorder
(14) වෙනත් සෞඛ්‍ය ඌනතා - Other Health Impairment
උද්‍යායාකාරී බවඌන අවධානය සහිත අධි ක්‍රි -: - Attention Deficit Hyperactivity Disorder (ADHD)



වෛද්‍යවරයෙකු විසින් කරන ලද රෝග විනිශ්චය තුළ ඉහත වර්ග 14 හි නොමැති වුවහොත්, ඒ සඳහා සුදුසු වර්ගීකරණය සඳහා අංක 33/2022 චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහයේ උපලේඛන 03 පරිහරණය කර සුදුසු කාණ්ඩයට යොමු කිරීම අවශ්‍ය වේ.

## 2.5 තක්සේරුකරණ ඉලක්කය

මෙම තක්සේරුකරණය වයස අවුරුදු හතරේ (04) දී විශේෂ අවශ්‍යතා ඇති දරුවන් පාසල් ඇතුළත් කිරීමට සහය දැක්වීමට සහ ඔවුන් සඳහා සුදුසු අන්තර්කරණ අධ්‍යාපන අවස්ථා සහ ස්ථාන ගත කිරීම් හඳුනා ගැනීමට භාවිත කරයි. ඒ අතරම, දෙමාපියන්/භාරකරුවන්, ගුරුවරුන්, විදුහල්පතිවරුන්, නොවිධිමත් අධ්‍යාපන ව්‍යාපෘති නිලධාරීන් සහ සමාජ සේවා නිලධාරීන් විසින් යොමු කරන, අනිවාර්ය අධ්‍යාපන වයසේ සිටින විශේෂ අවශ්‍යතා ඇති සියලු ම දරුවන් සඳහා ද මෙම තක්සේරුකරණය යොදා ගත හැකිය.

## 2.6 තක්සේරුකරණ දින

සතියකට අවම වශයෙන් එක් දිනක්වත් තක්සේරුකරණය සඳහා වෙන් කරන්න. පෝස්ටර්, පත්‍රිකා සහ වෙබ් අඩවි හරහා එසේ වෙන් කරන ලද තක්සේරුකරණ දින පිළිබඳ ව ජනතාව දැනුවත් කිරීම සිදු කරන්න.

## 2.7 සුදුසු වේලාවක් වෙන් කර ගැනීම



අංක 33/2022 චක්‍රලේඛයට අනුව, වයස අවුරුදු තුනේ දී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් විශේෂ අවධානය යොමු කළ යුතු යැයි හඳුනා ගෙන ඇති දරුවන්ගේ දෙමාපියන්/භාරකරුවන් සම්මන්ත්‍රණ මාලාවක් මගින් දැනුවත් කරනු ලැබේ. දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ සඳහා සහභාගී නොවූ දරුවන් සඳහා, දුරකථනයෙන් හෝ කමිටු සාමාජිකයින් හමුවීමෙන් තක්සේරුකරණය සිදු කිරීම සඳහා වේලාවක් වෙන් කර ගැනීමේ ක්‍රමවේදයක් නිර්මාණය කිරීම ඉතා වැදගත් වන අතර එමගින් සුදුසු පරිසරයක් තුළ නියමිත කාලයක දී තක්සේරුව සිදු කළ හැකිය. සෑම දරුවෙකුට ම නිශ්චිත කාල සටහනක් සකස් කර එම වේලාවට පැමිණෙන ලෙස පැවසීමෙන් දරුවන්ට වැඩි වේලාවක් බලා සිටීමට සිදු නොවන අතර ZACSE සාමාජිකයින්ට තක්සේරුවක් කිරීමට හදිසි බවක් නොදැනෙනු ඇත.

## 2.8 ස්ථානය

කලාප අධ්‍යාපන බල ප්‍රදේශය තුළ සුදුසු ස්ථානයක් නම් කිරීම සහ තක්සේරුකරණය සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම ඉතා වැදගත් වේ. තක්සේරු කිරීමේ ස්ථානය ප්‍රසන්න සහ අවශ්‍ය පරිදි වෙනස් කර ගත හැකි විය යුතු අතර, තක්සේරුවට අවශ්‍ය උපකරණ, ඉගෙනුම් ආධාරක, සෙල්ලම් බඩු ආදිය ලබා ගැනීමට සහ නඩත්තු කිරීමට විධිමත් ක්‍රියා පටිපාටි තිබීම අවශ්‍ය වේ.

## 2.9 රැගෙන ආ යුතු ලියකියවිලි

දුරකථනයෙන්/සෘජු හමුවකින් හෝ 3 වන දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය පැවැත්වෙන අවස්ථාවේ දී හෝ තක්සේරුව සඳහා වේලාවක් ලබා ගැනීමේ දී, තක්සේරුකරණ ක්‍රියා පටිපාටිය සහ තක්සේරුකරණය සඳහා රැගෙන ආ යුතු ලිපි ලේඛන පිළිබඳ ව දෙමාපියන්/භාරකරුවන්ට දැනුම් දෙනු ලැබේ. දෙමාපියන්/භාරකරුවන් පහත ලියකියවිලි රැගෙන ඒම අවශ්‍ය වේ.

- අයදුම් පත්‍රය
- උප්පැන්න සහතිකය සහ ඡායා පිටපතක්
- පදිංචි සහතිකය හෝ පදිංචිය සනාථ කිරීම සඳහා ලේඛනයක්
- වෛද්‍ය සහතිකය
- වෛද්‍ය වාර්තා
- අතීත තක්සේරුකරණ වාර්තා (ඇත්නම්)

## 3. විශේෂ අවශ්‍යතා සහිත දරුවන් මුල් ළමාවියේ දී ලියාපදිංචි කිරීම සහ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ

පහත දක්වා ඇති පරිදි විශේෂ අවශ්‍යතා සහිත දරුවන් ලියාපදිංචි කිරීමේ දී සහ තක්සේරුකරණයේ දී සෞඛ්‍ය අංශය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම ඉතා වැදගත් වේ. පහත දක්වා ඇති ගැලීම් සටහන ආරම්භ වන්නේ වයස අවුරුදු තුනේ (03) දී ළමුන් ලියාපදිංචි කිරීමෙන් වන අතර, පසුව දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ තුන (03) ක් පැවැත්වීම සහ කලාපයීය විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුව විසින් තක්සේරුකරණය සිදු කිරීමෙනි.

**1 විශේෂ අවශ්‍යතා සහිත දරුවන් වයස අවුරුදු තුනේ (03) දී ලියාපදිංචි කිරීම**

සෑම වසරක ම ජනවාරි 31 වන දිනට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන් ලැබෙන තොරතුරු මත පදනම් ව, කලාප අධ්‍යාපන කාර්යාල මඟින් අංක 37/2020 චක්‍රලේඛයේ උපලේඛන 01 සම්පූර්ණ කිරීමෙන් වයස අවුරුදු තුන ට ළඟා වන විශේෂ අවශ්‍යතා ඇති සියලු ම දරුවන් ලියාපදිංචි කරයි. පහත සඳහන් පරිදි මෙම දරුවන්ගේ දෙමාපියන් සඳහා එක් අධ්‍යන වාර කාල සීමාවකට එක් වරක් වන සේ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ සංවිධානය කිරීමේ වගකීම කලාප අධ්‍යාපන කාර්යාල වෙත පැවරීම.

*විශේෂ අවශ්‍යතා සහිත තම දරුවන් කලාප අධ්‍යාපන කාර්යාලයේ ලියාපදිංචි කරන ලෙස දෙමාපියන්/භාරකරුවන්ගෙන් ඉල්ලා සිටිමින් එම ක්‍රියාවලිය පිළිබඳ ව ඔවුන් දැනුවත් කිරීම සඳහා මාධ්‍ය නිවේදනයක් ද අධ්‍යාපන අමාත්‍යංශය විසින් නිකුත් කෙරෙනු ඇත.*

**2 දෙමාපියන්/ භාරකරුවන් සඳහා 1 වන දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය**

මෙය පවත්වනු ලබන්නේ ප්‍රාදේශීය මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් අදාළ වෛද්‍ය වෘත්තිකයන් සහ චිකිත්සකයින් සමඟිනි. දරුවාට සුදුසු ප්‍රතිකාර/චිකිත්සක ක්‍රම, පවතින සෞඛ්‍ය පහසුකම් සහ සෞඛ්‍ය අංශ සහයෝගයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ ව දෙමාපියන් දැනුවත් කරනු ලැබේ. අධ්‍යාපන නිලධාරීන් විසින් දරුවන්ට අත්‍යවශ්‍ය ජීවන නිපුණතා ලබා ගැනීම සඳහා උපකාර කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව දෙමාපියන්ට තොරතුරු සපයයි.

**3 දෙමාපියන්/ භාරකරුවන් සඳහා 2 වන දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය**

දෙවන සම්මන්ත්‍රණයේ අවධානය යොමු වන්නේ රජයේ රෝහල්වලින් හෝ මධ්‍යස්ථානවලින් ලබා දෙන ප්‍රතිකාර, චිකිත්සක ක්‍රම, සෞඛ්‍ය පහසුකම් හෝ ප්‍රතිකාරවලට අදාළ ගැටලු විසඳීමට ය. එම අභියෝග ජය ගැනීම සඳහා උපාය මාර්ග සහ මග පෙන්වීම් සැපයීම අවශ්‍ය වේ. අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරීන් දෙමාපියන්ට/ භාරකරුවන්ට දෛනික ජීවිතයේ ක්‍රියාකාරකම්වල යහපත් පුරුදු ඇති කර ගැනීමේ වැදගත්කම, අධ්‍යාපනයේ වැදගත්කම මෙන්ම පාසල් අධ්‍යාපනය සඳහා ඇති විකල්පයන් පිළිබඳ ව අවධාරණය කිරීම අවශ්‍ය වේ.

**4 දෙමාපියන්/ භාරකරුවන් සඳහා 3 වන දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය**

තුන්වන සම්මන්ත්‍රණයේ දී, ZACSE විසින් දරුවා හඳුනා ගැනීම අවශ්‍ය වේ. වෛද්‍ය ප්‍රතිකාර පිළිබඳ පසු විපරමක් සිදු කළ යුතු අතරම, අධ්‍යාපන නිලධාරීන් විසින් දරුවාගේ හැසිරීම් සහ පෙනුම, පවුලේ සමාජ-ආර්ථික මට්ටම, පවුල් පසුබිම යනාදිය පිළිබඳ තොරතුරු ලබා ගනියි. ඒ අතර අධ්‍යාපනයේ වැදගත්කම සහ වටිනාකම මෙන්ම දරුවන් සඳහා පවතින අධ්‍යාපන අවස්ථා පිළිබඳ ව දෙමාපියන්ට / භාරකරුවන්ට පැහැදිලි කිරීම සිදු කරන්න.

**5 ZACSE මගින් දරුවාගේ තක්සේරුව**

3 වැනි සම්මන්ත්‍රණයෙන් පසු, ZACSE මගින් අධ්‍යාපනික දෘෂ්ටිකෝණයකින් දරුවා තක්සේරුකරණය සඳහා වෙනම දිනයක් වෙන් කිරීම අවශ්‍ය වේ. ඊළඟ වසරේ ජනවාරි මස බඳවා ගැනීම සහතික කිරීම සඳහා නොවැම්බර් මාසයට පෙර කාලෝචිත ලෙස තක්සේරුව සිදු කරන්න. තක්සේරුකරණයේ විස්තර සඳහා කරුණාකර ඊළඟ පිටුව බලන්න.


## 4. තක්සේරුකරණ ප්‍රවාහය

තක්සේරුකරණයට පෙර, ZACSE සාමාජිකයින් දරුවා පිළිබඳ ව වයස අවුරුදු 3 දී පුරවන ලද අංක 37/2020 චක්‍රලේඛයේ උපලේඛන 01 සහ සම්මන්ත්‍රණ තුනෙහි (03) වාර්තා වෙත පරිශීලනය කිරීම අවශ්‍ය වේ. මෙම තොරතුරු සහ තක්සේරුකරණ අවස්ථාවේ සම්මුඛ පරීක්ෂණය මත පදනම් ව, “පොදු තක්සේරු වාර්තාව” සාමාන්‍ය තොරතුරු පත්‍රිකාව පිරවීම අවශ්‍ය වේ. දරුවා යම් ඖෂධයක් ලබා ගන්නේ නම්, එය ද සටහන් කිරීම අවශ්‍ය වේ.

වයස අවුරුදු පහ (05) ට අඩු ළමුන් සඳහා, සාමාන්‍ය තක්සේරු පෝරමයේ තක්සේරු කළ නොහැකි නිර්ණායක තිබේ නම්, ඉවත් කරන ලද එක් එක් නිර්ණායක සඳහා ලකුණු හතර (04)ක් අඩු කළ යුතු අතර මුළු ලකුණු ප්‍රතිශතයක් බවට පරිවර්තනය කිරීම අවශ්‍ය වේ.




දරුවාට ස්වාධීනව කළ හැකි ක්‍රියාකාරකමකින් ආරම්භ කර, පොදු තක්සේරු වාර්තාවට අනුව දරුවා පළමු ව තක්සේරු කිරීම අත්‍යවශ්‍ය වේ. මෙහි සම්පූර්ණ ලකුණු සංඛ්‍යාව 368 කි. තක්සේරුව අවසන් වූ පසු, ලබා ගත ලකුණු මුළු ලකුණුවල ප්‍රතිශතයක් බවට පරිවර්තනය කර එම ප්‍රතිශත ලකුණු භාවිත කර



**2**

**විශේෂ තක්සේරු ආකෘති අනුව තක්සේරුව**

විශේෂ තක්සේරු ආකෘති සම්පූර්ණ කිරීම වෛද්‍ය නිර්දේශ, මාපිය හඳුනා ගැනීම් හෝ ZACSE විසින් හඳුනා ගන්නා ලද විශේෂ අවස්ථා මත පදනම් ව සිදු කිරීම අවශ්‍ය වේ. උදාහරණයක් ලෙස, ඔටිසම් සහිත දරුවන් සඳහා, ඔටිසම් සහිත දරුවන් සඳහා වන තක්සේරු පත්‍රය (අංක 33/2022 චක්‍රලේඛය, උපලේඛන අංක 05) භාවිත කළ යුතු අතර, දෘශ්‍යාබාධිත ළමුන් සඳහා දෘෂ්ටි ඌනතා සහිත ළමුන් සඳහා තක්සේරු පත්‍රය (අංක 33/ 2022 චක්‍රලේඛය, උපලේඛන අංක 07) භාවිත කරන්න.

**3**

**විශේෂ තක්සේරු ආකෘති අනුව තක්සේරුව**

තක්සේරු ප්‍රතිඵල පිළිබඳ ව දෙමාපියන්/භාරකරුවන්ට දැනුම් දිය යුතු අතර සම්පූර්ණ කරන ලද තක්සේරු පත්‍රිකා (හෝ පිටපතක්) ඔවුන්ට ලබා දීම අවශ්‍ය වේ. සම්පූර්ණ කරන ලද තක්සේරු පත්‍රිකා දරුවා ඇතුළත් කරන පාසලට භාර දෙන ලෙස ද දෙමාපියන්/භාරකරුවන්ට මතක් කරන්න. ZACSE සාමාජිකයින් විසින් සම්පූර්ණ කරන ලද තක්සේරු පත්‍රිකා කලාප අධ්‍යාපන කාර්යාලය වෙත ඉදිරිපත් කර එක් පිටපතක් තමන්ගේ වාර්තා සඳහා තබා ගැනීම අවශ්‍ය වේ.

## 5. තක්සේරුකරණයට පසු

තක්සේරුකරණයෙන් පසුව, ZACSE සාමාජිකයින්, ඔවුන් විසින් නිශ්චිතව දක්වා ඇති ආකාරයේ, දරුවාට ආසන්නතම පාසලට දරුවා සමඟ ගොස් තක්සේරු වාර්තාව ඉදිරිපත් කර පාසලට ඇතුළත් කිරීම සඳහා අයදුම් කරන ලෙස දෙමාපියන්/භාරකරුවන්ට උපදෙස් ලබා දෙන්න. අයදුම් කිරීමේ දී දෙමාපියන්/භාරකරුවන් සහ පාසල මෙම තක්සේරුකරණ ප්‍රතිඵල භාවිත කර පාසලේ දී දරුවා වෙනුවෙන් සකස් කළ යුතු සාධාරණ ඉඩ හසර (reasonable accommodation) ගැන සාකච්ඡා කරන්න.

මීට අමතරව, පෙර පාසල් ගුරුවරයාගේ අවසරය ඇතිව දරුවාගේ පෙර පාසල් ගුරුවරයාගේ දුරකථන අංකය ඔවුන්ගේ ප්‍රාථමික පාසල් ගුරුවරයාට ලබා දෙන ලෙස දෙමාපියන්/භාරකරුවන් ගෙන් ඉල්ලා සිටීමට ZACSE සාමාජිකයින් දිරිමත් කරනු ලැබේ. මෙමඟින් ගුරුවරුන් දෙදෙනාට පෙර පාසල් ගුරුවරයා සහ ප්‍රාථමික පාසල් ගුරුවරයා ප්‍රාථමික පාසලේ දී දරුවාට අවශ්‍ය විය හැකි අත්‍යවශ්‍ය උපකාර, ඵලදායී උපාය මාර්ග සහ සාධාරණ ඉඩ හසර(reasonable accommodatin) සාකච්ඡා කිරීමට ඉඩ සැලසෙන අතර මෙම දරුවන්ට පෙර පාසලේ සිට ප්‍රාථමික පාසලට බොහෝ විට අභියෝගාත්මක වන සංක්‍රමණය වඩාත් පහසු කරයි.

# විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා

# ඉගෙනුම්-ඉගැන්වීම් ආධාරක එකතුව

## හැඳින්වීම

විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට ඉගැන්වීම ප්‍රතිලාභ ගෙන දෙන නමුත් තරමක් අභියෝගාත්මක කාර්යයකි. විවිධ වයස් සහ හැකියා මට්ටම්වලට අනුගත වීම, පුද්ගල ශක්තීන් සහ දුර්වලතා හඳුනා ගැනීම, ජීවන කුසලතා සහ සමාජ කුසලතා වර්ධනයට සහාය වීම සහ චර්යාත්මක ගැටළු කළමනාකරණය කිරීම ආදිය ගුරුවරුන් විසින් දෛනික පදනමින් ආමන්ත්‍රණය කළ යුතු අභියෝග කිහිපයක් වේ. සමහර සිසුන් අකුරු සහ වචන හඳුනා ගැනීමට, කියවීමට, ගණන් කිරීමට හෝ ප්‍රකාශ කිරීමට මහත් වෙහෙසක් දරයි. මෙවැනි අභියෝග රාශියක් මධ්‍යයේ වුවද, ගුරුවරුන් ඔවුන්ගේ සියලු ම සිසුන්ට හැකි උපරිම ලෙස අධ්‍යාපනය ලබා දීමට කැප වී සිටින අතර, සෑම දරුවෙකු ම පාඩමට සහභාගී වන බව සහතික කිරීමට සහ පන්තිකාමරය තුළ දියුණු විය හැකි බව සහතික කිරීමට වෙහෙස නොබලා කටයුතු කරයි.

විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සිටින පන්ති සඳහා ඉගැන්වීමේ දී ගුරුවරුන් ඉගෙනුම් ඉගැන්වීම් ආධාරක (Teaching Learning Aids – TLA) භාවිත කරයි. මෙහිදී, පෙර සූදානම් කරණ ලද TLA සමඟ ඒකාකාරව අධ්‍යයනය කිරීමට වඩා, ඔවුන්ගේ මට්ටමට සුදුසු TLA භාවිත කරමින්, තමන් විසින් ම ඉගෙනීමට දරුවන්ට සහාය වන්නේ කෙසේද යන්න සලකා බැලීම වැදගත් වේ. TLAs හි අරමුණ වන්නේ සිසුන්ගේ පුද්ගල අවශ්‍යතා සඳහා අභිරුචිකරණය කරන ලද ව්‍යුහගත ඉගෙනුම් අත්දැකීමක් ලබා දීමෙන් එම සිසුන්ට ක්‍රියාශීලී ව ඉගෙනීමට සහ ඔවුන්ගේ හැකියාවන් උපරිම මට්ටමට වර්ධනය කිරීමට උපකාර කිරීමයි. එනම්, එක් එක් සිසුවාගේ තත්වය සහ මට්ටම් සලකා බලා එක් එක් සිසුවා සඳහා ගැළපෙන TLA තෝරා ගැනීම ගුරුවරුන් සතු වගකීමකි.

මෙහි ලැයිස්තුගත කර ඇති ඉගෙනුම් ඉගැන්වීම් ආධාරක, අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය එක්ව ක්‍රියාත්මක කරන ලද "අන්තර්කරණ අධ්‍යාපන ප්‍රවේශයක් හරහා විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා අධ්‍යාපනය ශක්තිමත් කිරීම පිළිබඳ ව්‍යාපෘතිය" (REACH-SS) ට සම්බන්ධ වූවන්ගේ දක්ෂතාවයෙන් සංවර්ධනය කරන ලද සහ සත්‍ය වශයෙන් ම පන්තිකාමරයේ භාවිත කරන ඉගෙනුම් ආධාරක වේ. මින් ඇතැම් ඉගෙනුම් ඉගැන්වීම් ආධාරක, සුකුබා විශ්ව විද්‍යාලයට අනුබද්ධ විශේෂ අවශ්‍යතා පාසල් පහක භාවිතයන් ගෙන් උපුටා ගත් පුළුල් පරාසයක ඉගෙනුම් ආධාරක අඩංගු *'විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා ඉගැන්වීම් ද්‍රව්‍ය සහ ක්‍රම පිළිබඳ දත්ත සමුදාය'* වෙත යොමු වෙමින් ගොඩ නගා ඇත.

සෑම දරුවෙකුට ම අනන්‍ය අවශ්‍යතා ඇති බැවින්, විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ට ඉගැන්වීම සඳහා තිබිය යුතු අත්‍යවශ්‍ය අයිතම නොමැති බව සඳහන් කළ යුතුය. එම නිසා, ඔබ ඔබේ පන්තිකාමරය තුළ ඔබේම භාවිතය සඳහා මෙමඟින් අදහස් ගෙන ඒවා උත්සාහ කරනු ඇතැයි අපගේ අපේක්ෂාවයි.

## 1. සපත්තු ලේස් ගැට ගසමු



| | |
|---|---|
| 1) දුෂ්කරතා | සපත්තු ලේස් ගැට ගැසීම, වස්තූන් හැසිරවීම, අවධානය වෙනතකට යොමු කිරීම, දුර්වල ඇස-අත සම්බන්ධීකරණය |
| 2) ඉලක්කය<br>(දුබලතා වර්ගය, වයස) | • ඔටිසම් පරාසීය දුබලතාව (ASD)<br>• බුද්ධිමය දුබලතා<br>• දෘෂ්ටි ඌනතා<br><br>• වයස අවුරුදු 5 – 8 |
| 3) අපේක්ෂිත බලපෑම් සහ ප්‍රතිඵල | ශිෂ්‍යයෙකුට සක්‍රීය ලෙස:<br>(1) ඔහුගේ/ඇයගේ සපත්තු ලේස් තනිව ගැට ගැසීමට පුරුදු වීම.<br>(2) සියුම් චාලක කුසලතා වර්ධනය කිරීම.<br>(3) හසුරු කුසලතාව වර්ධනය කිරීම.<br><br>සැබෑ සපත්තුවලට වඩා විශාල නිසා, පළමු පියවර ලෙස මෙම ඉගෙනුම් ඉගැන්වීම් ආධාරකය සමඟ ලේස් ගැට ගැසීම පුරුදු වීම පහසු වේ. |
| 4) භාවිත කරන ආකාරය | • සිසුවාට තනිව පුහුණු වීමට ඉඩ දෙන්න.<br>• හැකි නම්, ඔහුට/ඇයට ලේස් ගැට ගැසීමට හැකිදැයි බැලීමට ශිෂ්‍යයෙකුට අභියෝග දෙන්න.<br>• ලේස් ඇමිණීමට සහ ගැට ගැසීමට ඇති වෙනත් ක්‍රම උත්සාහ කරන්න<br><br>විවිධ ක්‍රම තිබෙන බවට ගුරුවරයා දැන සිටිය යුතුයි. |
| 5) අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ | • නූල<br>• හිල් විදිනය (බුරුමය) |

ආශ්‍රිතය: පිළියන්දල අධ්‍යාපන කලාපය


## 2. අපි දත් මදිමු






| | |
|---|---|
| 1) දුෂ්කරතා | නිවැරදිව දත් මැදීම, වස්තූන් හැසිරවීම, දුර්වල ඇස-අත සම්බන්ධීකරණය |
| 2) ඉලක්කය (දුබලතා වර්ගය, වයස) | • ඌන අවධාන අධි ක්‍රියාකාරිත්වය (ADHD)<br>• ඔටිසම් පරාසීය දුබලතා (ASD)<br>• සංවර්ධන ප්‍රමාදය<br>• බුද්ධිමය දුබලතා<br><br>• වයස අවුරුදු 4 – 6 |
| 3) අපේක්ෂිත බලපෑම් සහ ප්‍රතිඵල | ශිෂ්‍යයෙකුට සක්‍රීය ලෙස:<br>(1) සියුම් චාලක කුසලතා වර්ධනය කිරීම.<br>(2) ඇස - අත සමායෝජනය වර්ධනය කිරීම.<br>(3) දත් මදින ආකාරය ඉගෙන ගැනීම.<br>(4) හසුරු කුසලතාව වර්ධනය කිරීම.<br><br>සැබෑ ලෙස දත් මැදීමට වඩා මෙම ඉගෙනුම් ඉගැන්වීම් ආධාරකය භාවිත කර පුහුණු වීම වඩා සිත් ගන්නා සුළු නිසා පළමු ව පුහුණු වීම සඳහා මෙය යොදා ගන්න. |
| 4) භාවිත කරන ආකාරය | • මුද්‍රිත හෝ අතින් අඳින ලද දත්වල පින්තූරයක් සිසුවාට ලබා දෙන්න. ඉන් පසුව, ගුරුවරයෙකු පොලිතීන් ආවරණයක් මත ෆෙල්ට් පෑනක් භාවිත කර, දත්වල මැලියම්/පැල්ලම් සලකුණු කල යුතුය.<br>• සිසුවාට දත් බුරුසුවක් ලබා දී මැලියම්/පැල්ලම් ඉවත් කරන ලෙස ඔහුට/ඇයට කියන්න.<br>• ක්‍රමානුකූලව දත්වල ඇති මැලියම්/පැල්ලම් ඉවත් කිරීමට ඔහුට/ඇයට උදව් කරන්න.<br>• ඔහුගේ/ඇයගේ උත්සාහය අගය කරන්න. |
| 5) අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ | • A4 කඩදාසි<br>• A4 ප්‍රමාණයේ කාඩ්බෝඩ්<br>• ෆෙල්ට් පෑන (රතු සහ කළු)<br>• මැලියම්<br>• පොලිතීන් ආවරණය<br>• මුද්‍රිත මුඛය(දත්) පින්තූරය<br>• දත් බුරුසු<br><br>නැවත නැවත භාවිත කිරීම සඳහා ලැමිනේටඩ් කාඩ්පත් වඩාත් සුදුසුය. |

## 3. ක්‍රියා පද භාවිත කරමු




| | |
|---|---|
| 1) දුෂ්කරතා | අකුරු කියවීමට සහ ලිවීමට හැකි, නමුත් තනි වචන පමණක් කතා කිරීම. |
| 2) ඉලක්කය (දුබලතා වර්ගය, වයස) | • බුද්ධිමය දුබලතා<br>• වයස අවුරුදු 3-17 |
| 3) අපේක්ෂිත බලපෑම් සහ ප්‍රතිඵල | ශිෂ්‍යයෙකුට සක්‍රීය ලෙස:<br>(1) වචන දෙකේ වාක්‍ය ඛණ්ඩ ඉගෙන ගැනීමට.<br>(2) සන්නිවේදන කුසලතා වැඩි දියුණු කිරීම.<br><br>ක්‍රියා පද පින්තූර කාඩ්පත් භාවිත කිරීමෙන්, ඔහුට/ඇයට විවිධ ආකාරවලින් ඉගෙන ගත හැකිය. |
| 4) භාවිත කරන ආකාරය | • ගුරුවරයෙකු වචන සහිත පින්තූර කාඩ්පත් සකස් කර, හිස් අවකාශයේ වෙල්ක්රෝ කොටසක් දමයි.<br>• පළමු ව, ගුරුවරයා සිසුවාට පින්තූර කාඩ්පතක් පෙන්වයි, ඉන් පසු සුදුසු ක්‍රියා-පද කාඩ්පතක් අලවා, සම්පූර්ණ වාක්‍ය ඛණ්ඩය ශබ්ද නඟා කියවයි.<br>• ඉන් පසුව, ගුරුවරයා අනුගමනය කිරීමට සිසුවා දිරිමත් කරයි.<br>• ඔහුට/ඇයට කාර්යය සම්පූර්ණ කිරීමට හැකි නම්, ගුරුවරයා පින්තූර කාඩ්පත් කිහිපයක් පසෙකින් තබා, සුදුසු ක්‍රියා-පද කාඩ්පත තෝරා එය නියමිත ස්ථානයේ අලවන ලෙස ඔහුට/ඇයට පවසන්න.<br><br>ගුරුවරයා පින්තූර කාඩ්පතක් සමඟ ක්‍රියා-පද කාඩ්පත් කිහිපයක් සපයයි. එයින් පින්තූර කාඩ්පතට සුදුසු/ගැළපෙන ක්‍රියා-පද කාඩ්පතක් තෝරා එය ඇලවීම ඔහුට/ඇයට කළ හැක.<br><br>නැවත නැවත භාවිත කිරීම සඳහා ලැමිනේටඩ් කාඩ්පත් වඩාත් සුදුසු ය. |
| 5) අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ | • කාඩ්බෝඩ්, 20cm x 30cm<br>• පාට පෑන්<br>• වෙල්ක්රෝ<br>• කතුරු |

## 4. ඇඳුම් කට්ටලය






| | |
|---|---|
| 1) දුෂ්කරතා | තනිවම ඇඳුම් ඇඳීම, වැසිකිළි භාවිතය, පැන ඇල්ලීම |
| 2) ඉලක්කය<br>(දුබලතා වර්ගය, වයස) | • බුද්ධිමය දුබලතා<br><br>• වයස අවුරුදු 3-6 |
| 3) අපේක්ෂිත බලපෑම් සහ ප්‍රතිඵල | ශිෂ්‍යයෙකුට සක්‍රීය ලෙස:<br>(1) බොත්තම් පියවීම සහ ගැළවීම<br>(2) තමා විසින් ම ඇඳුම් ඇඳීම<br><br>ඇඳුම් කට්ටලය භාවිත කිරීමෙන්, ඔහුට/ඇයට ඇඳුම් අඳින ආකාරය මෙන් ම සියුම් චාලක කුසලතා ද ඉගෙන ගත හැකිය. |
| 4) භාවිත කරන ආකාරය | • සිසුවෙකුට කට්ටලය එකින් එක ලබා දෙන්න.<br>• ඔහුට/ඇයට බොත්තම්/ ගාංචු(බකල්) දැමීමට සහ ඉවත් කිරීමට පවසන්න.<br>• එය අවසන් කිරීමෙන් පසු ඔහුගේ/ඇයගේ උත්සාහය අගය කරන්න.<br>• ඔහුට/ඇයට ලී රාමු සහිත බොත්තම්/ ගාංචු(බකල්) කට්ටලය සමඟ ක්‍රියාකාරකම කිරීමට හැකි වූ පසු, බොත්තම්/ ගාංචු(බකල්) කබාය සමඟ කටයුතු කිරීමට යොමු කරන්න.<br><br>කබාය, සිප් (zip) සහ නූල් වැනි බහුවිධ අංගවලින් සමන්විත වේ. සිසුවා/සිසුවිය, කට්ටලය සමඟ මෙම ක්‍රියාකාරකම කිරීමට පුරුදු වූ පසු, සැබෑ ඇඳුම් ඇඳ ගැනීමට යොමු කරන්න. වැසිකිළි භාවිත කිරීමේ කුසලතාව, ඇඳුම් ඇඳීමේ කුසලතාව සමඟ සමීප ව සම්බන්ධ වේ. ඔහුට/ඇයට තනිව ම වැසිකිළි භාවිත කිරීමට නොහැකි සිසුවෙකු සිටින විට, මෙම කට්ටලය භාවිත කර ඔහුගේ/ඇයගේ අභියෝගය කොහිදැයි සොයා බලන්න. |
| 5) අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ | • පෙර සැකසූ හතරැස් දැව පටි<br>• රෙදි කැබලි<br>• බොත්තම්<br>• ප්ලාස්ටික් ගාංචු(බකල්) |


ආශ්‍රිතය: පිළියන්දල අධ්‍යාපන කලාපය

## 5. සන්නිවේදන කාඩ්පත්










| | |
|---|---|
| 1) දුෂ්කරතා | වචන දෙකේ වාක්‍ය භාවිතයෙන් කෙනෙකුගේ අභිප්‍රාය ප්‍රකාශ කිරීම, අන් අයගෙන් දේවල් ඉල්ලා සිටීම, වචන කථා කිරීම |
| 2) ඉලක්කය<br>(දුබලතා වර්ගය, වයස) | • ඔටිසම් පරාසීය දුබලතාව (ASD)<br>• බුද්ධිමය දුබලතා<br>• කථන ප්‍රමාදය<br>• වයස අවුරුදු 3-15 |
| 3) අපේක්ෂිත බලපෑම් සහ ප්‍රතිඵල | ශිෂ්‍යයෙකුට සක්‍රීය ලෙස:<br>(1) ඔහුගේ/ඇයගේ අවශ්‍යතා සහ හැඟීම් නිවැරදිව අන් අයට ප්‍රකාශ කිරීම (විශේෂයෙන් සහාය පුද්ගලයින් සමඟ).<br>(2) ස්වාධීනව අන් අය සමඟ සන්නිවේදනය කිරීම.<br>පින්තූර කාඩ්පත් භාවිතය ශිෂ්‍යයෙකුට පැහැදිලිව කතා කිරීමට නොහැකි වූ වි පවා, ඔහුට/ඇයට අන් අය සමඟ සන්නිවේදනය කිරීමට උපකාරී වේ. |
| 4) භාවිත කරන ආකාරය | • ශිෂ්‍යයෙකුට අවශ්‍ය වූ විට කාඩ්පත් ඉල්ලීමට පුරුදු කර, ඔහු/ඇයගේ හැඟීම් පින්තූර කාඩ්පත් (සන්නිවේදන කාඩ්පත්) මගින් ප්‍රකාශ කිරීමට හුරු වෙයි. උදා. "මට වැසිකිලියට යන්න ඕනේ" හෝ "මට තේරෙන්නේ නැහැ". ඔහු/ඇය සංවර්ධනය වන විට කාඩ්පත් ගණන වැඩි කළ හැක.<br>• අවසානයේ දී, ඔහුගේ/ඇයගේ අවශ්‍යතා සහ හැඟීම් කාඩ්පත් නොමැතිව ප්‍රකාශ කිරීමට ඔහු/ඇය දිරිමත් කරන්න. |
| 5) අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ | • 30cm x 20cm කාඩ්බෝඩ්<br>• පාට පෑන්<br>• කතුරු |

## 6. ඔබ කැමති මොනවාට ද?











| | | |
|---|---|---|
| 1) | දුෂ්කරතා | පන්තියේ මිතුරන් සමඟ සන්නිවේදනය, ස්වයං-තේරීම, ස්වයං-නිර්ණය, තමාගේ වාරය බලා සිටීම |
| 2) | ඉලක්කය<br>(දුබලතා වර්ගය, වයස) | • ඔටිසම් පරාසීය දුබලතාව (ASD)<br>• සංවර්ධන දුබලතා<br>• බුද්ධිමය දුබලතා<br>• වයස අවුරුදු 3 -15 |
| 3) | අපේක්ෂිත බලපෑම් සහ ප්‍රතිඵල | ශිෂ්‍යයෙකුට සක්‍රීය ලෙස:<br>(1) ඔහුගේ/ඇයගේ කැමැත්ත අන් අයට ප්‍රකාශ කිරීම (ඔහුගේ/ඇයගේ සහාය පුද්ගලයාට).<br>(2) ඔහුට/ඇයට අන් අයට පැවසිය හැකි වචන මාලාව සහ කැමති දේ වැඩි කිරීම.<br>(3) ඔහුගේ/ඇයගේ ම තේරීම් කිරීම.<br>(4) ස්වාධීනව අන් අය සමඟ සන්නිවේදනය කිරීම.<br>සමහර සිසුන් කාඩ්පත්වල ඉදිරිපත් කර ඇති අදහස් ගැන හුරුපුරුදු නොවිය හැකි වුවද, ඔවුන්ට අන් අයගෙන් ඉගෙන ගත හැකි අතර, මෙය එකිනෙකා වඩා හොඳින් දැන හඳුනා ගැනීමට අවස්ථාවක් වනු ඇත. |
| 4) | භාවිත කරන ආකාරය | • පළමු ව, ඔවුන්ට සුවපහසු ස්ථානයක සිසුන් වාඩි කරවන්න.<br>• කාඩ්පත් අතරින් එක් කාඩ්පතක් තෝරා ගැනීමට සිසුවෙකුට කියන්න.<br>• එම කාඩ්පතේ ඇති රූප දෙකෙන් ඔහු/ඇය කැමති රූපය කුමක් දැයි ඔහු/ඇයගෙන් විමසන්න.<br>• ඔහු/ඇය එයට කැමති ඇයි දැයි අසන්න. ඔහු/ඇය පිළිතුරු දීමට භාවිත කරන ක්‍රමය කුමක් ද යන්න ගැටළුවක් නොවේ; එය වචනවලින්, ඇඟිල්ල දිගු කිරීමෙන් හෝ යමෙකු දෙස බැලීමෙන් විය හැකිය.<br>• ඉන්පසු ඔහු/ඇය එයට කැමති වීමට සහ එය තෝරා ගැනීමට හේතු පැහැදිලි කරන ලෙස ඔහු/ඇයගෙන් අසන්න. එම ප්‍රශ්නය ඔහුට/ඇයට තමන් ගැන සිතීමට අවස්ථාව සැලසිය හැක. නමුත් ඔහුට/ඇයට පිළිතුරු දීමට බල කිරීමට අවශ්‍ය නැත.<br>• ඔහුට/ඇයට පිළිතුරු දිය නොහැකි අවස්ථාවක, ඔහුට/ඇයට, "පාස්!" යැයි පැවසිය හැක.<br>• ඉන් පසුව, ඊළඟ සිසුවාට ඔහුගේ/ඇයගේ කාඩ්පත තෝරා ගැනීමට අවසර ඇති අතර, ඉහත පියවර නැවත නැවතත් සිදු කෙරේ.<br>මෙම ක්‍රීඩාව ආහාර, පළතුරු, එළවළු, ක්‍රියාකාරකම්, ක්‍රීඩා යනාදී පින්තූර ඇතුළත් කාඩ්පත් සමඟ කළ හැකිය. වැඩිහිටියන්ට ද කණ්ඩායමට සම්බන්ධ විය හැකිය. |
| 5) | අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ | • 10cm x 30cm කාඩ් බෝඩ්<br>• පාට කඩදාසි<br>• පාට පෑන්<br>• කතුරු |

ආශ්‍රිතය: https://www.hyakuchomori.co.jp/toy/p/TB002.html

## 7. එකට සෙල්ලම් කරමු






| | |
|---|---|
| 1) දුෂ්කරතා | කණ්ඩායම් ක්‍රියාකාරකම් සිදු කිරීම, මිතුරන් ඇති කර ගැනීම, තමාගේ වාරය එන තෙක් බලා සිටීම, ඔවුන්ගේ එදිනෙදා වචන මාලාවේ ක්‍රියාවන්, වචන සහ වාක්‍ය බණ්ඩ පුහුණු වීම |
| 2) ඉලක්කය<br>(දුබලතා වර්ගය, වයස) | • ඔටිසම් පරාසීය දුබලතා (ASD)<br>• සංවර්ධන දුබලතා<br>• බුද්ධිමය දුබලතා<br>• වයස අවුරුදු 3 – 15 |
| 3) අපේක්ෂිත බලපෑම් සහ ප්‍රතිඵල | සිසුන්ට සක්‍රිය ලෙස:<br>(1) සන්නිවේදන කුසලතා වර්ධනය කිරීම.<br>(2) අවස්ථාවන් මාරුවෙන් මාරුවට ගැනීමේ වැදගත්කම තේරුම් ගැනීම.<br>(2) ඔවුන් අතර අන්තර් පුද්ගල සබඳතා ඇති කිරීම.<br>(3) මිතුරන් ඇති කර ගැනීමේ කලාව ඉගෙන ගැනීම.<br>මෙම කුසලතා ඔවුන්ගේ අධ්‍යාපන සාර්ථකත්වයට පමණක් නොව ඔවුන්ගේ පුද්ගලික වර්ධනයට සහ සංවර්ධනයට ද අත්‍යවශ්‍ය වේ. |
| 4) භාවිත කරන ආකාරය | • පළමු ව, සිසුන්ට සුවපහසු ස්ථානයක අසුන් ගන්වන්න.<br>• ඔවුන්ට දාදු කැට කට්ටලයක්, ක්‍රියාකාරකම් පුවරුව සහ බොත්තම් කිහිපයක් දෙන්න.<br>• දාදු කැටය පෙරළීමෙන් පසු ක්‍රියාකාරකම් පුවරුවේ අදාළ අංකයට බොත්තමක් තබන ආකාරය පැහැදිලි කරන්න.<br>• ඉන් පසු, ඔවුන්ට බොත්තම තැබූ ස්ථානයේ ක්‍රියාකාරකම සිදු කිරීමට උපදෙස් දෙන්න. පුවරුවේ ක්‍රියාකාරකම්වලට ගීත ගායනා කිරීම, මිතුරන් නම් කිරීම, ප්‍රියතම පලතුරු නම් කිරීම යනාදිය ඇතුළත් විය හැකිය.<br>• ඊළඟ සිසුවා දාදු කැටය පෙරළන අතර, පෙර පියවර නැවත සිදු කරයි. |
| 5) අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ | • බොත්තම් කිහිපයක්<br>• වර්ණ කඩදාසි<br>• පාට පෑන්<br>• දාදු කැටය<br>• මැලියම්<br>• කතුරු |

ආශ්‍රිතය: https://kyozaisupport.com/socialskill/

## 8. මතක ක්‍රීඩා



| | |
|---|---|
| 1) දුෂ්කරතා | අඩු ක්‍රියාකාරී මතකය, කණ්ඩායම තුළ ක්‍රියාකාරකම් කිරීම, මිතුරන් ඇති කර ගැනීම, වචන මාලාව වර්ධනය කිරීම, ඔවුන්ගේ වාරය එන තෙක් බලා සිටීම |
| 2) ඉලක්කය (දුබලතා වර්ගය, වයස) | • ඌන අවධාන අධි ක්‍රියාකාරීත්වය (ADHD)<br>• ඔටිසම් පරාසීය දුබලතා (ASD)<br>• සංවර්ධන දුබලතා<br>• බුද්ධිමය දුබලතා<br>• වයස අවුරුදු 4-7 |
| 3) අපේක්ෂිත බලපෑම් සහ ප්‍රතිඵල | සිසුන්ට සක්‍රිය ලෙස:<br>(1) වාග් මාලාව වර්ධනය කිරීම.<br>(2) සිසුන් අතර අන්තර් පුද්ගල සබඳතා ඇති කිරීම.<br>(3) අවස්ථාවන් මාරුවෙන් මාරුවට ගැනීමේ වැදගත්කම තේරුම් ගැනීම.<br>(4) මතකය වර්ධනය කිරීම<br>(5) මිතුරන් ඇති කර ගැනීමේ කලාව ඉගෙන ගැනීම. |
| 4) භාවිත කරන ආකාරය | • පළමු ව, සිසුන්ට සුවපහසු ස්ථානයක අසුන් ගන්වන්න.<br>• සියලු ම කාඩ්පත් මුනින් හරවා, ඒවා විහිදුවන්න.<br>• ඉන් පසුව, එක් එක් සිසුවා කාඩ්පත් දෙක බැගින් පෙරළමින් ගැළපෙන යුගලයක් සෙවීමට උත්සාහ කරයි.<br>• සිසුවෙකුට ගැළපෙන යුගලයක් ලැබෙන්නේ නම්, ඒවා තබා ගෙන ඔහු/ඇය තවත් කාඩ්පත් හැරවීමක් ගනී. කෙසේ වෙතත්, කාඩ්පත් දෙක නොගැළපේ නම්, ඒවා මුල් ස්ථානයට ආපසු මුනින් හරවා තබනු ලැබේ, ඊළඟ සිසුවා ඔහුගේ/ඇයගේ වාරය ගනී.<br>• සියලු ම කාඩ්පත් ගැළපෙන තෙක් ක්‍රීඩාව දිගටම පවතී.<br>• ක්‍රීඩාව අවසානයේ දී වැඩි ම කාඩ්පත් යුගල ඇති ක්‍රීඩකයා ජයග්‍රාහකයා වේ.<br><br>මෙම ක්‍රීඩාව සඳහා හැඩතල, එළවළු, අකුරු, වචන ආදිය ද භාවිත කළ හැක. |
| 5) අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ | • කාඩ්බෝඩ්<br>• පාට පෑන්<br>• මැලියම්<br>• පින්තූර<br>• කතුරු<br><br>නැවත නැවත භාවිත කිරීම සඳහා ලැමිනේටඩ් කාඩ්පත් වඩාත් සුදුසු ය |

## 9. වර්ණ හඳුනා ගනිමු





| | |
|---|---|
| 1) දුෂ්කරතා | වර්ණ හඳුනා ගැනීම, අවධානය වෙනතකට යොමු වීම, පැන්සලක් අල්ලා ගැනීම |
| 2) ඉලක්කය (දුබලතා වර්ගය, වයස) | • ඌන අවධාන අධි ක්‍රියාකාරීත්වය (ADHD)<br>• ඔටිසම් පරාසීය දුබලතා (ASD)<br>• සංවර්ධන දුබලතා<br>• බුද්ධිමය දුබලතා<br>• වයස අවුරුදු 4 – 6 |
| 3) අපේක්ෂිත බලපෑම් සහ ප්‍රතිඵල | ශිෂ්‍යයෙකුට සක්‍රීය ලෙස:<br>(1) සියුම් චාලක කුසලතා වර්ධනය කිරීම.<br>(2) අවධානය වැඩි දියුණු කිරීම.<br>(3) ඇස - අත සමායෝජනය වර්ධනය කිරීම.<br>(4) පැන්සල් ග්‍රහණය වර්ධනය කිරීම.<br>(5) වර්ණ ගැළපීම සහ හඳුනා ගැනීම.<br>(6) හසුරු කුසලතාව වර්ධනය කිරීම. |
| 4) භාවිත කරන ආකාරය | • සිසුවාට වර්ණ දෙකක රෙදි කටු සහ වර්ණ දෙකේ පෙට්ටියක් ලබා දෙන්න.<br>• පාට අනුව රෙදි කටු වෙන් කර ගන්නා ලෙස ඔහුට/ඇයට කියන්න.<br>• ඔහුට/ඇයට රෙදි කටු ගැළපෙන වර්ණයට සවි කරන ලෙස පවසන්න.<br>• ඔහුගේ/ඇයගේ උත්සාහය අගය කරන්න. |
| 5) අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ | • කාඩ්බෝඩ් පෙට්ටිය<br>• වර්ණ කඩදාසි<br>• රෙදි කටු<br>• මැලියම්<br>• කතුරු |

## 10. පාට ගළපමු

| | | |
|---|---|---|
| 1) | දුෂ්කරතා | වර්ණ හඳුනා ගැනීම, අවධානය වෙනතකට යොමු වීම |
| 2) | ඉලක්කය<br>(දුබලතා වර්ගය, වයස) | • ඌන අවධාන අධි ක්‍රියාකාරීත්වය (ADHD)<br>• ඔටිසම් පරාසීය දුබලතා (ASD)<br>• සංවර්ධන දුබලතා<br>• බුද්ධිමය දුබලතා<br>• වයස අවුරුදු 4 – 7 |
| 3) | අපේක්ෂිත බලපෑම් සහ ප්‍රතිඵල | ශිෂ්‍යයෙකුට සක්‍රිය ලෙස:<br>(1) සියුම් චාලක කුසලතා වර්ධනය කිරීම.<br>(2) ඇස් - අත් සම්බන්ධීකරණය වර්ධනය කිරීම.<br>(3) අවධානය වැඩි දියුණු කිරීම.<br>(4) වර්ණ ගැළපීම සහ හඳුනා ගැනීම.<br>(5) පැන්සල් ග්‍රහණය වර්ධනය කිරීම |
| 4) | භාවිත කරන ආකාරය | • සිසුවෙකුට බෝතල් මූඩි සහ පුවරුව ලබා දෙන්න.<br>• සුදුසු වර්ණය අනුව බෝතල් මූඩි තැබීමට ඔහුට/ඇයට කියන්න.<br>• ඔහු/ඇය වර්ණය හඳුනා ගන්නා තෙක් මෙම අභ්‍යාසය නැවත කරන්න.<br>• ඔහුගේ/ඇයගේ උත්සාහය අගය කරන්න. |
| 5) | අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ | • 40cm x 40cm ඝන කාඩ්බෝඩ්<br>• මූලික වර්ණවලින් කඩදාසි 5ක්<br>• වර්ණ 4ක බෝතල් මූඩි<br>• මැලියම්<br>• කඩදාසි කපනය<br>• කතුරු |

## 11. පාට බොත්තම් වෙන් කරමු



| | |
|---|---|
| 1) දුෂ්කරතා | වර්ණ හඳුනා ගැනීම, වර්ණ වෙන් කිරීම, අවධානය වෙනතකට යොමු කිරීම |
| 2) ඉලක්කය (දුබලතා වර්ගය, වයස) | • ඌන අවධාන අධි ක්‍රියාකාරීත්වය (ADHD)<br>• ඔටිසම් පරාසීය දුබලතා (ASD)<br>• බුද්ධිමය දුබලතා<br>• වයස අවුරුදු 4 – 7 |
| 3) අපේක්ෂිත බලපෑම් සහ ප්‍රතිඵල | ශිෂ්‍යයෙකුට සක්‍රීය ලෙස:<br>(1) සියුම් චාලක කුසලතා වර්ධනය කිරීම.<br>(2) ඇස් - අත් සම්බන්ධීකරණය වර්ධනය කිරීම.<br>(3) අවධානය වැඩි දියුණු කිරීම.<br>(4) වර්ණ ගැළපීම සහ හඳුනා ගැනීම.<br>(5) පැන්සල් ග්‍රහණය වර්ධනය කිරීම |
| 4) භාවිත කරන ආකාරය | • සිසුවෙකුට බොත්තම් සහ ප්ලාස්ටික් බඳුන් ලබා දෙන්න.<br>• බොත්තම් පාට අනුව ගැළපෙන පාට බඳුන්වලට දමන ලෙසට ඔහුට/ඇයට කියන්න.<br>• ඔහුට/ඇයට නිවැරදි බඳුන තෝරා ගැනීමට නොහැකි නම්, නිවැරදි අදාළ බඳුන තෝරා ගැනීමට ඔහුට/ඇයට සහාය වන්න.<br>• ඔහුගේ/ඇයගේ උත්සාහය අගය කරන්න.<br><br>ආරම්භයේ දී, මූලික වර්ණ 2 ක් පමණක් භාවිත කිරීම වඩා හොඳය. |
| 5) අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ | • මූලික වර්ණ 4ක බොත්තම්<br>• මූලික වර්ණ 4ක බඳුන්<br>• කපනය |

## 12. කඩදාසි කෝප්ප සමඟ සෙල්ලම් කරමු



| | | |
|---|---|---|
| 1) | දුෂ්කරතා | අවධානය වෙනතකට යොමු කිරීම, දුර්වල ඇස්-අත් සම්බන්ධීකරණය |
| 2) | ඉලක්කය<br>(දුබලතා වර්ගය, වයස) | • ඌන අවධාන අධි ක්‍රියාකාරීත්වය (ADHD)<br>• ඔටිසම් පරාසීය දුබලතා (ASD)<br>• සංවර්ධන දුබලතා<br>• බුද්ධිමය දුබලතා<br>• වයස අවුරුදු 3-6 |
| 3) | අපේක්ෂිත බලපෑම් සහ ප්‍රතිඵල | ශිෂ්‍යයෙකුට සක්‍රීය ලෙස:<br>(1) සියුම් චාලක කුසලතා වර්ධනය කිරීම.<br>(2) ඇස - අත සමායෝජනය වර්ධනය කිරීම.<br>(3) අවධානය වැඩි දියුණු කිරීම.<br>(4) ඇඟිලි සහ අත් ශක්තිමත් කිරීම. |
| 4) | භාවිත කරන ආකාරය | • කඩදාසි කෝප්ප එක මත තබා ගොඩ ගසන්නැයි ශිෂ්‍යයෙකුට කියන්න.<br>• කඩදාසි කෝප්පවල ඉහළ සහ පහළ මාරුවෙන් මාරුවට සිටින සේ කෝප්ප එක මත තැබීමට ඔහුට/ඇයට කියන්න.<br>• කෝප්ප කීයක් එක මත තැබීමට හැකිද යන්න බැලීමට ඔහු/ඇය දිරිමත් කරන්න.<br>• ඔහුගේ/ඇයගේ උත්සාහය අගය කරන්න. |
| 5) | අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ | • කඩදාසි කෝප්ප හෝ ප්ලාස්ටික් කෝප්ප |

ආශ්‍රිතය: Life Skill Development Through Playful Activities=Hiromichi Yuki, 2nd KCCP Training May 2023


## 13. ප්ලාස්ටික් හැඳි සමඟ සෙල්ලම් කරමු



| | |
|---|---|
| 1) දුෂ්කරතා | අවධානය වෙනතකට යොමු කිරීම, දුර්වල ඇස්-අත් සම්බන්ධීකරණය, දුර්වල සියුම් චාලක කුසලතා |
| 2) ඉලක්කය (දුබලතා වර්ගය, වයස) | • ඔටිසම් පරාසීය දුබලතා (ASD)<br>• සංවර්ධන දුබලතා<br>• බුද්ධිමය දුබලතා<br>• වයස අවුරුදු 3-7 |
| 3) අපේක්ෂිත බලපෑම් සහ ප්‍රතිඵල | ශිෂ්‍යයෙකුට සක්‍රීය ලෙස:<br>(1) සියුම් චාලක කුසලතා වර්ධනය කිරීම.<br>(2) ඇස් - අත් සම්බන්ධීකරණය වර්ධනය කිරීම.<br>(3) අවධානය වැඩි දියුණු කිරීම.<br>(4) පැන්සල් ග්‍රහණය වර්ධනය කිරීම.<br>(5) හසුරු කුසලතාව වර්ධනය කිරීම. |
| 4) භාවිත කරන ආකාරය | 1) ශිෂ්‍යයාට ප්ලාස්ටික් බෝතලයක් සහ ප්ලාස්ටික් හැඳි ලබා දෙන්න.<br>2) බෝතල් පියනේ ඇති සිදුරෙන් වරකට එක ප්ලාස්ටික් හැන්ද බැගින් ඇතුළු කිරීම පුරුදු වීමට ඔහු/ඇය දිරිමත් කරන්න.<br>3) ඔහුගේ/ඇයගේ උත්සාහය අගය කරන්න.<br><br>ඔහුට/ඇයට තනිව ම වැඩ කිරීමට නොහැකි වූ විට ඔහුට/ඇයට සහය ලබා දෙන්න. |
| 5) අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ | • පිහිය (බෝතල් පියනේ සිදුරක් සෑදීමට)<br>• ප්ලාස්ටික් බෝතලයක්<br>• ප්ලාස්ටික් බඳුන<br>• ප්ලාස්ටික් යෝගට් හැඳි |

ආශ්‍රිතය: පිළියන්දල අධ්‍යාපන කලාපය

## 14. කාර් රථයට රෝද සවි කරමු




| | | |
|---|---|---|
| 1) | දුෂ්කරතා | අවධානය වෙනතකට යොමු කිරීම, දුර්වල ඇස්-අත් සම්බන්ධීකරණය, දුර්වල සියුම් චාලක කුසලතා |
| 2) | ඉලක්කය<br>(දුබලතා වර්ගය, වයස) | • ඌන අවධාන අධි ක්‍රියාකාරීත්වය (ADHD)<br>• ඔටිසම් පරාසීය දුබලතා (ASD)<br>• සංවර්ධන දුබලතා<br>• බුද්ධිමය දුබලතා<br>• වයස අවුරුදු 3-7 |
| 3) | අපේක්ෂිත බලපෑම් සහ ප්‍රතිඵල | ශිෂ්‍යයෙකුට සක්‍රීය ලෙස:<br>(1) සියුම් චාලක කුසලතා වර්ධනය කිරීම.<br>(2) ඇස් - අත් සම්බන්ධීකරණය වර්ධනය කිරීම.<br>(3) අවධානය වැඩි දියුණු කිරීම.<br>(4) පැන්සල් ග්‍රහණය වර්ධනය කිරීම.<br>(5) හසුරු කුසලතාව වර්ධනය කිරීම. |
| 4) | භාවිත කරන ආකාරය | • ශිෂ්‍යයාට කාර් රථයක පින්තූරයක් සහ ප්ලාස්ටික් බෝතල් පියන් ලබා දෙන්න.<br>• රෝදය කරකවා එය සවි කිරීමට ඔහු/ඇය දිරිමත් කරන්න.<br>• ඔහුගේ/ඇයගේ උත්සාහය අගය කරන්න.<br><br>ඔහුට/ඇයට තනිව ම වැඩ කිරීමට නොහැකි වූ විට ඔහුට/ඇයට සහය ලබා දෙන්න. |
| 5) | අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ | • වර්ණ කඩදාසි<br>• මැලියම්<br>• ප්ලාස්ටික් බෝතල් පියන්<br>• කඩදාසි කපනය<br>• රළු කාඩ්බෝඩ්<br>• කතුරු |

## 15. හැඩයේ සීමාව තුළ වර්ණ ගැන්වීම





| | |
|---|---|
| 1) දුෂ්කරතා | සීමාව තුළ වර්ණ ගැන්වීම අපහසු වීම, අවධානය වෙනතකට යොමු වීම, දුර්වල ඇස්-අත් සම්බන්ධීකරණය, දුර්වල සියුම් චාලක කුසලතා |
| 2) ඉලක්කය (දුබලතා වර්ගය, වයස) | • ඌන අවධාන අධි ක්‍රියාකාරීත්වය (ADHD)<br>• ඔටිසම් පරාසීය දුබලතා (ASD)<br>• මස්තිෂ්ක ආඝාත (CP)<br>• සංවර්ධන දුබලතා<br>• බුද්ධිමය දුබලතා<br>• වයස අවුරුදු 3-7 |
| 3) අපේක්ෂිත බලපෑම් සහ ප්‍රතිඵල | ශිෂ්‍යයෙකුට සක්‍රීය ලෙස:<br>(1) සියුම් චාලක කුසලතා වර්ධනය කිරීම.<br>(2) ඇස - අත සමායෝජනය වර්ධනය කිරීම.<br>(3) අවධානය වැඩි දියුණු කිරීම.<br>(4) හැඩයේ සීමාව තුළ වර්ණ ගැන්වීම පුහුණු වීම.<br>(5) පැන්සල් ග්‍රහණය වර්ධනය කිරීම. |
| 4) භාවිත කරන ආකාරය | • සිදුරු සහිත කාඩ්පත කඩදාසි කැබැල්ලක් මත තබා රෙදි කටු හෝ කඩදාසි ඇමිණුම්වලින් එය සුරක්ෂිත කරන්න.<br>• ශිෂ්‍යයාට ඔහු/ඇය කැමති ම වර්ණයෙන් පාට කූරක් ලබා දෙන්න.<br>• හිඩැස තුළ වර්ණ ගැන්වීමට ශිෂ්‍යයා යොමු කරන්න<br>• ඔහුගේ/ඇයගේ උත්සාහය අගය කරන්න.<br><br>ඔහුට/ඇයට නිවැරදිව සීමාව තුළ වර්ණ ගැන්වීමට නොහැකි වූ විට ඔහුට/ඇයට සහාය ලබා දෙන්න. |
| 5) අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ | • පාට කූරු හෝ පාට පැන්සල්<br>• කඩදාසි කපනය<br>• විවිධ හැඩතල කපා ඉවත් කළ රළු කාඩ්බෝඩ් |

## 16. වැලි පිල්ලේ අකුරු ලියමු



| | |
|---|---|
| 1) දුෂ්කරතා | පැන්සල අතින් ඇල්ලීම, අකුරු ඉගෙනීම සහ ලිවීම |
| 2) ඉලක්කය (දුබලතා වර්ගය, වයස) | • ඔටිසම් පරාසීය දුබලතා (ASD)<br>• බුද්ධිමය දුබලතා<br>• දෘෂ්ටි ඌනතා<br>• වයස අවුරුදු 4-7 |
| 3) අපේක්ෂිත බලපෑම් සහ ප්‍රතිඵල | ශිෂ්‍යයෙකුට සක්‍රීය ලෙස:<br>(1) ස්පර්ශ සංජානනය වැඩි දියුණු කිරීම.<br>(2) අකුරු වල හැඩය ගැන හුරුපුරුදු වීම.<br>(3) අකුරු ඉගෙනීම පිළිබඳ තීක්ෂ්ණ බුද්ධිය වර්ධනය කිරීම |
| 4) භාවිත කරන ආකාරය | • වැලි පිල්ලේ ඇති වැලි මත අකුරු ලිවීමට ශිෂ්‍යයෙකුට පවසන්න.<br>• ඔහුගේ/ඇයගේ උත්සාහය අගය කරන්න.<br><br>ඔහුට/ඇයට වැලි මත අකුරු ලිවීමට නොහැකි වූ විට ඔහුට/ඇයට සහයෝගය දෙන්න. |
| 5) අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ | • ලී පටි 4: 12"x2" ලී පටි 2 සහ 8" x 2" ලී පටි 2<br>• තුනී ලෑලි පුවරුව<br>• ½" කම්බි ඇණ<br>• මිටිය<br>• කියත<br><br>ලබා දී ඇති ලී සහ ලෑලි භාවිත කර පිල්ල සාදන්න.<br>සකස් කරගත් වැලි පිල්ලේ අහල් 1/4ක් පමණ ඝනකමට වැලි අතුරන්න. |


ආශ්‍රිතය: පිළියන්දල අධ්‍යාපන කලාපය

## 17. අකුරු/වචන ඉගෙන ගනිමු




| | |
|---|---|
| 1) දුෂ්කරතා | අකුරු හඳුනා ගත හැකි නමුත් වචන ගොඩ නැගීමේ අපහසුතා ඇති සිසුන් |
| 2) ඉලක්කය<br>(දුබලතා වර්ගය, වයස) | • ඌන අවධාන අධි ක්‍රියාකාරීත්වය (ADHD)<br>• ඔටිසම් පරාසීය දුබලතා (ASD)<br>• සංවර්ධන දුබලතා<br>• මද බුද්ධිමය දුබලතා<br>• සුවිශේෂී ඉගෙනුම් දුබලතා<br>• වයස අවුරුදු 5-7 |
| 3) අපේක්ෂිත බලපෑම් සහ ප්‍රතිඵල | ශිෂ්‍යයෙකුට සක්‍රීය ලෙස:<br>(1) අකුරු හඳුනා ගැනීම.<br>(2) වචන හඳුනා ගෙන කියවීම.<br>(3) වාග් මාලාව ගොඩනැගීම<br>මෙය අකුරු හඳුනා ගැනීමේ සහ කියවීමේ කුසලතා වර්ධනය කර ගැනීමට ඔහු/ඇය දිරිමත් කිරීමට විනෝදජනක හා රසවත් ක්‍රමයකි.. |
| 4) භාවිත කරන ආකාරය | • ශිෂ්‍යයෙක්/ගුරුවරයෙක් කඩදාසි කෝප්ප දෙක භාවිත කරන ආකාරය පෙන්වයි.<br>• ඉන් පසු කෝප්ප කරකවමින් වචන කියවීමට තවත් සිසුවෙකු පොලඹවන්න.<br>• ඔහුගේ/ඇයගේ උත්සාහය අගය කරන්න.<br>කෝප්ප කරකැවීමෙන් ඔහුට/ඇයට වචන ගොඩනඟා ඒවා කියවිය හැකිය. |
| 5) අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ | • කඩදාසි හෝ ප්ලාස්ටික් කෝප්ප 2 ක්<br>• පාට පෑන<br>• මැලියම්<br>• කඩදාසි කපනය හෝ කතුර<br>• සුදු කඩදාසිය |

## 18. රොකට්ටුවෙන් වචන හදමු.



| | |
|---|---|
| 1) දුෂ්කරතා | අකුරු හඳුනා ගත හැකි නමුත් වචන ගොඩ නැගීමේ අපහසුතා ඇති සිසුන් |
| 2) ඉලක්කය<br>(දුබලතා වර්ගය, වයස) | • ඌන අවධාන අධි ක්‍රියාකාරීත්වය (ADHD)<br>• ඔටිසම් පරාසීය දුබලතා (ASD)<br>• සංවර්ධන දුබලතා<br>• මද බුද්ධිමය දුබලතා<br>• සුවිශේෂී ඉගෙනුම් දුබලතා<br>• වයස අවුරුදු 5-7 |
| 3) අපේක්ෂිත බලපෑම් සහ ප්‍රතිඵල | ශිෂ්‍යයෙකුට සක්‍රිය ලෙස:<br>(1) අකුරු හඳුනා ගැනීම.<br>(2) වචන හඳුනා ගෙන කියවීම.<br>(3) වාග් මාලාව ගොඩනැගීම<br>මෙම විනෝද ක්‍රියාකාරකම ඔහුට/ඇයට අකුරු වඩාත් පහසුවෙන් මතක තබා ගැනීමට උපකාරී වේ. |
| 4) භාවිත කරන ආකාරය | • ශිෂ්‍යයෙකුට වචනයක් සහිත කාඩ්පතක් සහ රොකට්ටුවක් ලබා දෙන්න.<br>• ඉන් පසු රොකට්ටුව භාවිත කර වචනයට ගැළපෙන අකුරු සොයන්න යැයි ඔහු/ඇයට පවසන්න.<br>• ඔහුට/ඇයට අදාළ අකුරට රොකට්ටුව ගෙන යාමට උදව් කරන්න.<br>• ඔහු/ඇය අකුරු සහ වචන හුරුපුරුදු වන තුරු මෙම ක්‍රියාකාරකම නැවත කරන්න.<br>• ඔහුගේ/ඇයගේ උත්සාහය අගය කරන්න.<br><br>විවිධ අකුරු සහ වචන පුහුණු කිරීම සඳහා කාඩ්පතේ ඇති වචන වෙනස් කිරීමට හැකි ය. |
| 5) අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ | • 30cm x 20cm ප්‍රමාණයේ ඝනකම කාඩ්බෝඩ් කැබැල්ලක්<br>• පාට කඩදාසි<br>• පාට පෑන්<br>• මැලියම්<br>• පෑන හෝ පැන්සල<br>• කතුර හෝ කඩදාසි කපනය |

## 19. රූපවාහිනී තිරයේ ඇති පින්තූර/වචන කියවමු






| | |
|---|---|
| 1) දුෂ්කරතා | පින්තූර සහ වචන හඳුනා ගැනීම |
| 2) ඉලක්කය<br>(දුබලතා වර්ගය, වයස) | • ඌන අවධාන අධි ක්‍රියාකාරීත්වය (ADHD)<br>• ඔටිසම් පරාසීය දුබලතා (ASD)<br>• සංවර්ධන දුබලතා<br>• මද බුද්ධිමය දුබලතා දෘෂ්ටි ඌනතා<br>• සුවිශේෂී ඉගෙනුම් දුබලතා<br>• වයස අවුරුදු 5-7 |
| 3) අපේක්ෂිත බලපෑම් සහ ප්‍රතිඵල | ශිෂ්‍යයෙකුට සක්‍රීය ලෙස:<br>(1) රූප හඳුනා ගැනීම.<br>(2) වචන හඳුනා ගැනීම සහ කියවීම.<br>(3) වචන මාලාව ගොඩනැගීම<br>මෙය ඔහුට/ඇයට පින්තූර සහ වචන හඳුනා ගැනීමට විනෝදජනක හා රසවත් ක්‍රමයකි. |
| 4) භාවිත කරන ආකාරය | • පින්තූර සහ වචන කියවීමට තිරයක් භාවිත කරන ආකාරය ශිෂ්‍යයෙකුට පැහැදිලි කරන්න.<br>• ඉන් පසු පින්තූර සහ වචන හඳුනා ගැනීමට සහ ඒවා කියවීමට ඉහළ තීරුව කරකැවීමට ඔහු/ඇය පොලඹවන්න.<br>• ඔහුගේ/ඇයගේ උත්සාහය අගය කරන්න. |
| 5) අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ | • 50cm x 30cm හිස් පෙට්ටිය<br>• 60cm දිග දඬු දෙකක්<br>• පාට පැන්<br>• සෙලෝ ටේප්<br>• කඩදාසි කපනය හෝ කතුර<br>• කඩදාසි රෝල |

ආශ්‍රිතය: කුරුණෑගල අධ්‍යාපන කලාපය

## 20. ඉලක්කම් කුළුණක් හදමු








| | |
|---|---|
| 1) දුෂ්කරතා | ගණන් කිරීම, සංඛ්‍යා අනුපිළිවෙල හඳුනා ගැනීම |
| 2) ඉලක්කය<br>(දුබලතා වර්ගය, වයස) | • ඌන අවධාන අධි ක්‍රියාකාරීත්වය (ADHD)<br>• ඔටිසම් පරාසීය දුබලතා (ASD)<br>• සංවර්ධන දුබලතා<br>• බුද්ධිමය දුබලතා<br>• වයස අවුරුදු 4-7 |
| 3) අපේක්ෂිත බලපෑම් සහ ප්‍රතිඵල | ශිෂ්‍යයෙකුට සක්‍රීය ලෙස:<br>(1) අවධානය වැඩි දියුණු කිරීම.<br>(2) ඉලක්කම් හඳුනා ගැනීම.<br>(3) ගණන් කිරීමේ කුසලතා වැඩි දියුණු කිරීම |
| 4) භාවිත කරන ආකාරය | • ශිෂ්‍යයෙකුට අංක සහිත කඩදාසි කෝප්ප ලබා දෙන්න.<br>• කුළුණක් නිර්මාණය කිරීම සඳහා සංඛ්‍යාත්මක අනුපිළිවෙළට කෝප්ප ගොඩ ගැසීමට ඔහුට/ඇයට පවසන්න.<br>• ඉන් පසු එක් එක් කෝප්පයේ සඳහන් අංක ගණන් කිරීමට ඔහු/ඇය දිරිමත් කරන්න.<br>• ඔහුගේ/ඇයගේ උත්සාහය අගය කරන්න |
| 5) අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ | • පාට පෑන්<br>• කඩදාසි හෝ ප්ලාස්ටික් කෝප්ප |

## 21. අංක ගළපමු




| | |
|---|---|
| 1) දුෂ්කරතා | සංඛ්‍යා සංකල්ප ග්‍රහණය කර ගැනීම |
| 2) ඉලක්කය<br>(දුබලතා වර්ගය, වයස) | • ඌන අවධාන අධි ක්‍රියාකාරීත්වය (ADHD)<br>• ඔටිසම් පරාසීය දුබලතා (ASD)<br>• සංවර්ධන දුබලතා<br>• බුද්ධිමය දුබලතා<br>• වයස අවුරුදු 5-7 |
| 3) අපේක්ෂිත බලපෑම් සහ ප්‍රතිඵල | ශිෂ්‍යයෙකුට සක්‍රිය ලෙස:<br>(1) අවධානය වැඩි දියුණු කිරීම.<br>(2) සංඛ්‍යා සහ සංඛ්‍යා සංකල්ප හඳුනා ගැනීම. |
| 4) භාවිත කරන ආකාරය | • ශිෂ්‍යයෙකුට සංඛ්‍යා සංකල්ප පුවරුවක් සහ අංක යෙදූ බෝතල් පියන් කට්ටලයක් ලබා දෙන්න.<br>• ගණිතමය සංකල්පය සමඟ අදාළ සංඛ්‍යා ගැළපීමට ඔහුට/ඇයට සහාය වන්න.<br>• ඔහුගේ/ඇයගේ උත්සාහය අගය කරන්න. |
| 5) අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ | • 30cm x 20cm ඝන කාඩ්බෝඩ්<br>• පාට කඩදාසි<br>• පාට පෑන්<br>• මැලියම්<br>• කතුරු<br>• යෝගට් කෝප්ප හෝ බෝතල් පියන්. |

## 22. අංක හඳුනා ගෙන ලියමු



| | | |
|---|---|---|
| 1) | දුෂ්කරතා | සංඛ්‍යා සංකල්පය ග්‍රහණය කර ගැනීම, සංඛ්‍යා ලිවීම |
| 2) | ඉලක්කය<br>(දුබලතා වර්ගය, වයස) | • ඌන අවධාන අධි ක්‍රියාකාරීත්වය (ADHD)<br>• ඔටිසම් පරාසීය දුබලතා (ASD)<br>• සංවර්ධන දුබලතා<br>• බුද්ධිමය දුබලතා<br>• වයස අවුරුදු 4-6 |
| 3) | අපේක්ෂිත බලපෑම් සහ ප්‍රතිඵල | ශිෂ්‍යයෙකුට සක්‍රීය ලෙස:<br>(1) 1 සිට 3 දක්වා සංඛ්‍යා සංකල්පය හඳුනා ගැනීම<br>(2) 1 සිට 3 දක්වා අංකය ලිවීමට පුරුදු වීම |
| 4) | භාවිත කරන ආකාරය | • සකස් කළ සංඛ්‍යා පුවරුවක් සහ කූරු ශිෂ්‍යයෙකුට ලබා දෙන්න.<br>• දී ඇති අංකයට අනුරූප වන කූරු ගැළපීමට ඔහුට/ඇයට පවසන්න. ඔහුට/ඇයට ඒවා ගැළපීමට නොහැකි නම් ඔහුට/ඇයට උදව් කරන්න.<br>• ඉන් පසු, සංඛ්‍යා ලිවීමට ඔහුට/ඇයට සහාය වන්න.<br>• ඔහුගේ/ඇයගේ උත්සාහය අගය කරන්න.<br><br>ඔහුට/ඇයට 3 දක්වා ලිවීමට හැකි වූ විට, තවත් සංඛ්‍යා සඳහා අලුත් පුවරුවක් සූදානම් කරන්න (උදා. 4 සිට 6 දක්වා). |
| 5) | අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ | • 30cm x 30cm ඝන කාඩ්බෝඩ්.<br>• කාඩ්බෝඩ් රෝල් 3ක් (හිස් වැසිකිළි කාඩ්බෝඩ් රෝල්)<br>• සෙලෝ ටේප්<br>• පාට කූරු<br>• මැලියම්<br>• කඩදාසි කපනය<br>• අයිස්ක්‍රීම් කෝටු<br>• කතුරු |

## 23. වැහි බිඳු ගණන් කරමු








| | |
|---|---|
| 1) දුෂ්කරතා | සංඛ්‍යා සංකල්පය ග්‍රහණය කර ගැනීම, සංඛ්‍යා ගැළපීම |
| 2) ඉලක්කය<br>(දුබලතා වර්ගය, වයස) | • ඌන අවධාන අධි ක්‍රියාකාරීත්වය (ADHD)<br>• ඔටිසම් පරාසීය දුබලතා (ASD)<br>• සංවර්ධන දුබලතා<br>• බුද්ධිමය දුබලතා<br>• වයස අවුරුදු 5-7 |
| 3) අපේක්ෂිත බලපෑම් සහ ප්‍රතිඵල | ශිෂ්‍යයෙකුට සක්‍රීය ලෙස:<br>(1) සියුම් චාලක කුසලතා වර්ධනය කිරීම.<br>(2) අවධානය වැඩි දියුණු කිරීම.<br>(3) ඇස - අත සමායෝජනය වර්ධනය කිරීම.<br>(4) සංඛ්‍යා සංකල්පය හඳුනා ගැනීම<br>(5) ගණන් කිරීමේ කුසලතාව දියුණු කර ගැනීම<br>1 සිට 20 දක්වා හෝ ඊට වැඩි සංඛ්‍යා සංකල්පය ඉගැන්වීම සඳහා මෙම ඉගෙනුම් ඉගැන්වීම් ආධාරකය සුදුසු ය. |
| 4) භාවිත කරන ආකාරය | • ශිෂ්‍යයෙකුට පින්තූරය පැහැදිලි කරන්න.<br>• පහතින් දැක්වෙන සංඛ්‍යාවට අනුරූප වන සේ කොටන් බඩ් (වැහි බිඳු) දැමීමට ඔහුට/ඇයට පවසන්න.<br>• පහතින් දැක්වෙන සංඛ්‍යාව වෙනස් කර, නව සංඛ්‍යාවට අනුව කොටන් බඩ් දැමීමට ඔහු/ඇය දිරිමත් කරන්න.<br>• ඔහුගේ/ඇයගේ උත්සාහය අගය කරන්න. |
| 5) අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ | • 30cm x 20cm ඝන කාඩ්බෝඩ්<br>• වර්ණ කඩදාසි<br>• පාට පෑන්<br>• කොටන් බඩ්<br>• මැලියම්<br>• කතුරු |

## 24. අපි ගණන් කරමු, ඉලක්කම් එකතු කරමු




| | |
|---|---|
| 1) දුෂ්කරතා | සංඛ්‍යා සංකල්ප, සරල එකතු කිරීම |
| 2) ඉලක්කය (දුබලතා වර්ගය, වයස) | • ඌන අවධාන අධි ක්‍රියාකාරීත්වය (ADHD)<br>• ඔටිසම් පරාසීය දුබලතා (ASD)<br>• සංවර්ධන දුබලතා<br>• බුද්ධිමය දුබලතා<br>• වයස අවුරුදු 5-7 |
| 3) අපේක්ෂිත බලපෑම් සහ ප්‍රතිඵල | ශිෂ්‍යයෙකුට සක්‍රීය ලෙස:<br>(1) සංඛ්‍යා සහ සංඛ්‍යා සංකල්ප හඳුනා ගැනීම.<br>(2) සරල එකතු කිරීම ඉගෙන ගැනීම. |
| 4) භාවිත කරන ආකාරය | • ශිෂ්‍යයෙකුට සකස් කළ පුවරුවක් ලබා දෙන්න.<br>• පුවරුවේ වම් පැත්තේ සඳහන් ඇති සංඛ්‍යාවට අනුව සංඛ්‍යා සංකල්පය සකස් කිරීමට ඔහුට/ඇයට කියන්න.<br>• ඔහු/ඇය සංඛ්‍යා සංකල්පය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගත් පසු, එකතු කිරීම ප්‍රගුණ කිරීමේ මෙවලමක් ලෙස ද පුවරුව භාවිත කළ හැක.<br>• පුවරුවේ සංඛ්‍යා ලියා ඒවා එකට එකතු කිරීමට ඔහුට/ඇයට මඟ පෙන්වන්න. |
| 5) අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ | • 30cm x 20cm ඝන කාඩ්බෝඩ්<br>• පාට කඩදාසි (වර්ණ දෙකක්)<br>• පාට පෑන්<br>• ඩබල් ටේප්<br>• මැලියම්<br>• කතුරු හෝ කඩදාසි කපනය |

## 25. A ගේ සටහන ලියමු






| | |
|---|---|
| 1) දුෂ්කරතා | ඔහුගේ/ඇයගේ හැඟීම් සහ අත්දැකීම් ගුරුවරුන් සහ දෙමාපියන් සමඟ වචන හෝ ක්‍රියාවන් මගින් ප්‍රකාශ කිරීම සහ බෙදා ගැනීම |
| 2) ඉලක්කය<br>(දුබලතා වර්ගය, වයස) | • ප්‍රධාන ධාරාවේ (සාමාන්‍ය) පන්තිවලට ඒකීකරණය කරන ලද විශේෂ අවශ්‍යතා ඇති සිසුන්.<br>• වයස අවුරුදු 7-14 |
| 3) අපේක්ෂිත බලපෑම් සහ ප්‍රතිඵල | ශිෂ්‍යයෙකුට සක්‍රීය ලෙස:<br>(1) දවස සඳහා පුද්ගලික ක්‍රියාකාරකම් කාලසටහන තහවුරු කිරීම.<br>(2) වචන හෝ ක්‍රියාවන් මගින් ගුරුවරුන්/දෙමව්පියන් සමඟ තම හැඟීම් සහ අත්දැකීම් ප්‍රකාශ කිරීම සහ බෙදා ගැනීම.<br>(3) ඔහුගේ/ඇයගේ වාචික සන්නිවේදනයට උපකාර කිරීම සහ වැරදි සන්නිවේදනය වැළැක්වීම.<br>දෙමාපියන්ට, ගුරුවරුන්ට සහ ගුරු උපදේශක වරුන්ට ශිෂ්‍යයාගේ ප්‍රගතිය සහ අභියෝග තේරුම් ගත හැක.<br>ඒ අනුව, මෙම වාර්තාව ගුරුවරුන්ට, ඔහුගේ/ඇයගේ අනාගතය සඳහා අවශ්‍ය නිරීක්ෂණ කිරීමට, සැලසුම් කිරීමට සහ සූදානම් කිරීමට සහාය විය හැක. |
| 4) භාවිත කරන ආකාරය | • පන්ති කාලසටහන පරීක්ෂා කිරීමට ශිෂ්‍යයෙකුගෙන් ඉල්ලා සිටින්න.<br>• ඉන් පසුව, දිවා කාලයේ ඔහුගේ/ඇයගේ උත්සාහයන් සහ සිදුවීම් කෙටි වාක්‍යයකින් ලිවීමට ඔහු/ඇය දිරිමත් කරන්න. ඔහුට/ඇයට වචන ලිවීමේ අපහසුවක් ඇත්නම්, ඔහුට/ඇයට රූප/සංකේත භාවිත කළ හැක.<br>• ඔහුගේ/ඇයගේ සටහන ගෙදර ගෙන ගොස් එය ඔහුගේ/ඇයගේ දෙමාපියන් සමඟ බෙදා ගන්නා ලෙස ඔහුට/ඇයට පවසන්න.<br>• ගුරුවරයා නිතර මෙම සටහන පරීක්ෂා කරන්න. |
| 5) අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ | • A4 ප්‍රමාණයේ ලිපි ගොනුව<br>• A4 කඩදාසි<br>• සටහන් පොත<br>• පෑන |

ආශ්‍රිතය: http://www.human.tsukuba.ac.jp/snerc/kdb/index.htm

## 26. දෘශ්‍ය කාලසටහන








| | |
|---|---|
| 1) දුෂ්කරතා | ඉදිරියට එන සිදුවීම් ගැන ඇති නොසන්සුන් බව, පළමු/නුහුරු ක්‍රියාකාරකම් වලට බිය වීම, සංක්‍රාන්ති ක්‍රියාකාරකම් පිළිබඳ ගැටලු |
| 2) ඉලක්කය<br>(දුබලතා වර්ගය, වයස) | • ඔටිසම් පරාසීය දුබලතා (ASD)<br>• සංවර්ධන දුබලතා<br>• බුද්ධිමය දුබලතා<br>• වයස අවුරුදු 5-15 |
| 3) අපේක්ෂිත බලපෑම් සහ ප්‍රතිඵල | ශිෂ්‍යයින්ට සක්‍රිය ලෙස:<br>(1) දවසේ ව්‍යුහය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.<br>(2) අධ්‍යාපනික ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමු කිරීම.<br>(3) එක් ක්‍රියාකාරකමකින් තවත් ක්‍රියාකාරකමකට සුමට ව මාරු වීම.<br>(4) තමන්ගේ ම කාලසටහන කළමනාකරණය කිරීම (කළ යුතු දේ සහ යා යුතු ස්ථානය).<br>(5) ස්වයං ස්වාධීනත්වය වර්ධනය කරන්න. |
| 4) භාවිත කරන ආකාරය | • පළමු ව, ගුරුවරයා එක් දිනක් සඳහා ඇතුළත් කළ යුතු ක්‍රියාකාරකම් ගණන තීරණය කරයි.<br>• ගුරුවරයා සිසුන්ට පහසුවෙන් තේරුම් ගත හැකි සුදුසු සන්නිවේදන ක්‍රමයක් (පින්තූර/ වචන/දෙකම) තෝරා ගනී.<br>• එක් එක් ක්‍රියාකාරකම අවසානයේ දී, අදාළ පින්තූරය/වචනය ඉවත් කර, 'අවසන්' ලෙස සලකුණු කර ඇති සාක්කුවේ තැබීමට ඔවුන් පුරුදු කරන්න.<br>දෘශ්‍ය කාලසටහනක් තනි ශිෂ්‍යයෙකුට හෝ සිසුන් කණ්ඩායමකට භාවිත කළ හැකිය. |
| 5) අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ | • කාඩ්බෝඩ්<br>• පාට කඩදාසි / රෙදි<br>• පාට පෑන්<br>• මැලියම්<br>• පොලිතින්<br>• කතුරු<br>• වෙල්ක්රෝ පටි හෝ කාන්දම් |

# අන්තර්කරණ අධ්‍යාපනය ප්‍රවර්ධනය සඳහා අත්පොත

**චක්‍රලේඛ (යොමු අංක 37/2020 සහ 33/2022) ක්‍රියාවට නැංවීම**

## කෙටි යෙදුම්

ADHD ඌන අවධානය සහිත අධි ක්‍රියාකාරිත්වය (Attention-Deficit Hyperactivity Disorder)

CRPD ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය(Convention on the Rights of Persons with Disabilities)

IE අන්තර්කරණ අධ්‍යාපනය (Inclusive Education)

IEP පුද්ගලබද්ධ අධ්‍යාපන සැලැස්ම (Individualized Educational Plan)

ILP පුද්ගලබද්ධ ඉගෙනුම් සැලැස්ම (Individualized Learning Plan)

ISA ගුරු උපදේශක (In-Service Advisor)

JICA ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (Japan International Cooperation Agency)

KOICA කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (Korea International Cooperation Agency)

MOE අධ්‍යාපන අමාත්‍යාංශය (Ministry of Education)

NIE ජාතික අධ්‍යාපන ආයතනය (National Institute of Education)

OOSC පාසලෙන් බැහැර දරුවන් (Out-of-School Children)

PDE පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව (Provincial Department of Education)

SAIP පාසල් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම (School Annual Implementation Plan)

SDC නිපුණතා සංවර්ධන මධ්‍යස්ථානය (Skills Development Center)

SDS පාසල් සංවර්ධන සමිතිය (School Development Committee)

SDGs තිරසාර සංවර්ධන අරමුණු (Sustainable Development Goals)

SEU විශේෂ අධ්‍යාපන අවශ්‍යතා (Special Educational Needs)

TLA ඉගෙනුම්-ඉගැන්වීම් ආධාරක (Teaching Learning Aids)

ZEO කලාප අධ්‍යාපන කාර්යාලය (Zonal Education Office)

## 1 වන පරිච්ඡේදය - හැඳින්වීම

අන්තර්කරණ අධ්‍යාපනය යනු සියලු ම දරුවන්ට සමාන ඉගෙනීමේ අවස්ථා ලබා දීමත් සහ ඔවුන්ට සඵල වීමට අවශ්‍ය කුසලතා වර්ධනය කිරීමත් සහ අවසානයේ දී සමාජයේ විවිධත්වය වැළඳ ගැනීමට උපකාරී වන ඵලදායී ක්‍රමයකි[1]. කෙසේ වෙතත්, ශ්‍රී ලාංකේය සමාජය තුළ, දුබලතාව පිළිබඳ සමාජ ආකෘති සංකල්පය පුළුල් ලෙස අවබෝධ වී නොමැති අතර, දුබලතා සහිත පුද්ගලයින් වෙන් කිරීම සහ ඔවුන්ට එරෙහිව අගතිය තවමත් පවතී. විශේෂ අධ්‍යාපන ඒකක (වි. අ. ඒකක) නොමැති රජයේ පාසල්වල, පාර්ශ්වකරුවන් අතර අවබෝධයක් නොමැතිකම, ගුරු කුසලතා නොමැතිකම සහ යෝග්‍ය පරිසරයක් නොමැති වීම තුළ ගුණාත්මක අන්තර්කරණ අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීම අභියෝගයක් වී ඇත.

ශ්‍රී ලංකා රජය 2016 දී ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (CRPD) අපරානුමත කරන ලද අතර ඒ සඳහා දරන ප්‍රයත්නයන් වැඩි කර ඇත. දැනට ක්‍රියාත්මක වන "ශ්‍රී ලංකාව: සාමාන්‍ය අධ්‍යාපන අංශයේ සංවර්ධන සැලැස්මේ (2020-2025)" හි කුළුණු හතරෙන් එකක් වන්නේ "ශ්‍රී ලංකාවේ සියලු ම ළමුන් සඳහා අධ්‍යාපනයේ ප්‍රවේශයේ සහ සහභාගීත්වයේ සමානාත්මතාව" වන අතර මෙම කුළුණේ එක් උපාය මාර්ගයක් වන්නේ "විශේෂ අධ්‍යාපනය, අන්තර්කරණ අධ්‍යාපනය සහ නොවිධිමත් අධ්‍යාපනය ශක්තිමත් කිරීමයි". මෙම උපාය මාර්ගය සාක්ෂාත් කර ගැනීම සඳහා අන්තර්කරණ අධ්‍යාපනය සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම සහ ගුරුවරුන්ගේ ධාරිතා වර්ධනය වැනි ක්‍රියාකාරකම් සැලසුම් කර ඇත.

විශේෂයෙන්, COVID-19 වසංගතය සහ ආර්ථික අර්බුදය නිසා වි. අ. ඒකකවල සිදු වූ අධ්‍යයන කාර්ය සාධනය නතර වීම/අඩු වීම සහ බඳවා ගත් ළමුන් අතර දුර්වල පැමිණීමේ අනුපාතය හේතුවෙන් දුබලතා සහිත ළමුන් සඳහා ඇති අධ්‍යාපනික පරිසරය වඩාත් අභියෝගාත්මක වී ඇත. මෙම පසුබිම යටතේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අන්තර්කරණ අධ්‍යාපනය වඩාත් සාක්ෂාත් කර ගැනීමේ ප්‍රතිපත්තිය පැහැදිලි කිරීම සඳහා "විශේෂ අධ්‍යාපන අවශ්‍යතා හා විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා අධ්‍යාපන පහසුකම් සැපයීම ඇතුළු සියලු ම ළමයින් සඳහා අන්තර්කරණ අධ්‍යාපනය ලබාදීම පිළිබඳ චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහය (37/2020)" සහ "විශේෂ අධ්‍යාපන තක්සේරුකරණය පිළිබඳ චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහ (33/2022)" නිකුත් කර ඇත.

කෙසේ වෙතත් මෙම චක්‍රලේඛ රට පුරා ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ දීමට වන අභියෝග රැසක් තවමත් පවතී. එබැවින්, අමාත්‍යාංශය, ස්වකීය ක්‍රියාකාරකම්වලට අමතර ව, ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA) සමඟ එක්ව පිළියන්දල, කුරුණෑගල සහ නිකවැරටිය යන අධ්‍යාපන කලාප තුනෙන් පාසල් හතර බැගින් පාසල් 12 ක අන්තර්කරණ අධ්‍යාපන ප්‍රායෝගික සහයක වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා නියමු ව්‍යාපෘතිය සිදු කර ඇත. ව්‍යාපෘතිය පුරා සිදු කළ අත්හදා බැලීම් සාර්ථක වූ අතර, ගුරුවරුන්, අන්තර්කරණ අධ්‍යාපන සම්බන්ධීකාරකවරුන්, විදුහල්පතිවරුන් සහ දෙමාපියන්ගේ/ භාරකරුවන්ගේ උනන්දුව සහ දක්ෂතාව නිසා අන්තර්කරණ අධ්‍යාපනයේ බොහෝ යහපත් භාවිතයන්[2] ඇති විය.

එහි සාර්ථකත්වය මත පදනම් ව, පුළුල් අන්තර්කරණ ප්‍රවේශ සහිත පාසල් නිර්මාණය කිරීම සඳහා ඵලදායී සහ වහාම ආරම්භ කළ හැකි ක්‍රියාකාරකම් පෙන්වීම සඳහා මෙම අත්පොත සකස් කර ඇත. අන්තර්කරණ අධ්‍යාපනයට විශාල මුදලක් අවශ්‍ය නොවේ; සිසුන්ගේ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා (SEN) සපුරාලීමෙන් සහ දෙමාපියන්ගේ/භාරකරුවන්ගේ සහය ඇතිව පාසල් යටිතල පහසුකම් ක්‍රමානුකූල ව වැඩිදියුණු කිරීම හරහා ඉගෙනුම් පරිසරය වැඩිදියුණු කිරීම සහ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්ට අනෙකුත් සිසුන් සමඟ ඉගෙනීමේ අවස්ථා වැඩි කිරීම මගින් අන්තර්කරණ පාසල් නිර්මාණය කළ හැකිය. මෙම අත්පොතෙහි ලැයිස්තු ගත කර ඇති මැදිහත් වීම් පහත පරිදි සාරාංශ කර ඇත.

---

[1] තිරසාර සංවර්ධන අරමුණු (SDGs) 4 වන අරමුණ "අන්තර්කරණය සහ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනය සහතික කිරීම"

[2] හොඳ භාවිතයන් පිළිබඳ උදාහරණ ලිපි මාලාවක් ලෙස සම්පාදනය කර අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කරන ලදී.
https://moe.gov.lk/2024/01/embracing-diversity-one-step-forwards-towards-a-more-inclusive-school/

**වගුව 1**: යෝජිත මැදිහත් වීම්වල සාරාංශය


| මැදිහත් වීමේ ක්ෂේත්‍රය සහ අරමුණ | අපේක්ෂිත ප්‍රතිඵල | පහසුකම් සලසන්නා | ඉලක්කය | යෝජිත ක්‍රියාකාරකම් සහ සඳහා පවතින සම්පත් | ක්‍රියාත්මක කිරීම සඳහා ඉඟි |
|---|---|---|---|---|---|
| I. දේශීය මුලපිරීම් ශක්තිමත් කිරීම | | | | | |
| I-1. පාසල් ප්‍රජාව දැනුවත් කිරීම | SEN සිසුන් මුහුණ දෙන දුෂ්කරතා සමස්ත ප්‍රජාවට ම අවබෝධ කර ගත හැකි අතර මෙම දුෂ්කරතා මඟ හරවා ගැනීමට ඔවුන්ට උපකාර කිරීමට පදනමක් සැපයිය හැකිය. | ගුරු උපදේශක, IE සම්බන්ධීකාරක, වි අ. ඒකක ගුරුවරයා | විදුහල්පති, ගුරුවරුන්, සිසුන්, SDS සාමාජිකයන් සහ ප්‍රාදේශීය ප්‍රජාව තුළ සිටින සුභ පතන්නන් | "දැනුවත් කිරීම සඳහා මෙවලම් කට්ටලය" භාවිත කරමින් දැනුවත් කිරීමේ වැඩමුළු | සම්බන්ධ පිරිසගේ මානසිකත්වය වෙනස් කිරීමට නොපසුබට උත්සාහය අවශ්‍ය වේ. දැනුම ලබා දීමෙන් නොනැවතී චර්යාත්මක වෙනසක් ඇති කරන වැඩමුළු අවශ්‍ය වේ. |
| I-2. SEN ළමුන් බඳවා ගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා පද්ධතිය ශක්තිමත් කිරීම | සාධාරණ ඉඩ හසර සඳහා නිර්දේශ සහිත ව තවතවත් SEN දරුවන් අධ්‍යාපනයට බඳවා ගනු ලැබේ. | අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | තක්සේරු කමිටු සාමාජිකයින් | 33/2022 චක්‍රලේඛයේ සහ "තක්සේරු කමිටුව සඳහා අත්පොතේ" පරිදි තක්සේරු කමිටුව නිතර රැස් වීම. | පාසල් ස්ථාන ගත කිරීම පිළිබඳ තීරණ ගැනීමේ දී SEN දරුවන්ගේ සහ ඔවුන්ගේ දෙමාපියන්ගේ/භාරකරුවන්ගේ දෘෂ්ටිකෝණයන් සලකා බැලීම. සෞඛ්‍ය සහ සමාජ සුබසාධන අංශ සහ පෙර පාසල් අධ්‍යාපනය සමඟ සහයෝගිතාව සලකා බැලීම. |
| II. පාසල පුරා ප්‍රයත්න ශක්තිමත් කිරීම | | | | | |
| II-1. පාසල් තුළ සහය පද්ධතියක් ස්ථාපිත කිරීම | තවත් SEN සිසුන්ට අන්තර්කරණ සැකසීමකින් ඉගෙන ගත හැකිය | අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කලාප අධ්‍යාපන කාර්යාලය, ගුරු උපදේශක | විදුහල්පති, IE සම්බන්ධීකාරක, උපදේශන ගුරුවරයා, SDS සාමාජිකයින් ආදි… | "IE සම්බන්ධීකාරක සජීවීකරණ සඳහා මෙවලම් කට්ටලය" භාවිත කරන වැඩමුළු | IE සම්බන්ධීකාරකවරයාට පමණක් අපේක්ෂිත කාර්ය භාරය ඉටු කිරීමට අපහසු වන අතර විදුහල්පතිවරයාගේ සහ පුළුල් පාසල් ප්‍රජාවේ සහයෝගය (කණ්ඩායම් ප්‍රවේශය) වැදගත් වන බව අවබෝධ කර ගැනීම |
| II-2. පාසල් සංවර්ධන සැලසුම්වලට අන්තර්කරණ අධ්‍යාපනය ඇතුළත් කිරීම | IE ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාකාරකම් පාසල් ප්‍රජාව තුළ ප්‍රධාන ප්‍රවාහය වන අතර වැඩි සහයෝගයක් අපේක්ෂා කෙරේ. | අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කලාප අධ්‍යාපන කාර්යාලය, ගුරු උපදේශක | විදුහල්පති, IE සම්බන්ධීකාරක, ගුරුවරුන්, SDS සාමාජිකයින් | IE ප්‍රවර්ධනය කිරීම සඳහා බොහෝ පැති ඇති බව තේරුම් ගැනීමට පුහුණු කිරීම. පාසලට වි අ. ඒකකයක් තිබේ නම්, එක් ඒකාබද්ධ ක්‍රියාකාරකම් සහ ඉගෙනීම ක්‍රියාකාරකමක් මනාව සැලසුම් කර පවත්වන්න. | කළ නොහැකි ක්‍රියාකාරකම් ලැයිස්තු ගත කරනවාට වඩා, එක් ගුණාත්මක ක්‍රියාකාරකමක් පැවැත්වීමෙන් ආරම්භ කරන්න, එවිට බොහෝ දෙනෙකුට ප්‍රතිලාභ අත්විඳිය හැකි අතර ක්‍රමයෙන් ක්‍රියාකාරකම්වල ගුණාත්මකභාවය සහ ප්‍රමාණය වැඩි කරන්න. |

| මැදිහත් වීමේ ක්ෂේත්‍රය සහ අරමුණ | අපේක්ෂිත ප්‍රතිඵල | පහසුකම් සලසන්නා | ඉලක්කය | යෝජිත ක්‍රියාකාරකම් සහ සඳහා පවතින සම්පත් | ක්‍රියාත්මක කිරීම සඳහා ඉඟි |
|---|---|---|---|---|---|
| II-3. පාසල් මූලික යටිතල පහසුකම් සංවර්ධනය | පාසලට පැමිණෙන සියලු දෙනාටම ප්‍රතිලාභ සැලසෙන පරිදි ප්‍රවේශ්‍යතාව වැඩිදියුණු කෙරේ | අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කලාප අධ්‍යාපන කාර්යාලය, ගුරු උපදේශක | විදුහල්පති, IE සම්බන්ධීකාරක, ගුරුවරුන්, SDS සාමාජිකයින් | "පාසල් යටිතල පහසුකම් සහ පාරිසරික විධිවිධාන පිළිබඳ මාර්ගෝපදේශය" (අංක 02/2024 චක්‍රලේඛය) පිළිබඳ සම්මන්ත්‍රණය | විශාල මුදල් ප්‍රමාණයක් අවශ්‍ය නොවන සේ කළ හැකි ප්‍රතිසංස්කරණවලින් පටන් ගෙන පාසල් පරිසරය ක්‍රමානුකූල ව වැඩිදියුණු කිරීම, සියලු දෙනාට ම සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකිය. |
| III. ගුරුවරුන්ගේ නිපුණතා සංවර්ධනය | | | | | |
| III-1. වි. අ. ඒකක ගුරුවරුන්ගේ නිපුණතා සංවර්ධනය | වි. අ. ඒකක ගුරුවරුන්ට තනි තනි සිසුන්ගේ අවශ්‍යතා අනුව පාඩම් සැලසුම් කිරීමට සහ පැවැත්වීමට හැකිය. | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කලාප අධ්‍යාපන කාර්යාලය, ගුරු උපදේශක | වි. අ. ඒකක ගුරුවරු | 1) "IEP සකස් කිරීම සඳහා මෙවලම් කට්ටලය" භාවිත කරමින් IEP සංවර්ධනය කිරීම, 2) "විශේෂ අවශ්‍යතා ඇති සිසුන් සඳහා ඉගෙනුම්-ඉගැන්වීම් ආධාරක එකතුව" වෙත යොමු කිරීමෙන් සුදුසු TLA හඳුන්වා දීම සහ 3) මේස සැකැස්ම වැනි පන්ති කාමර පරිසරය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම. | IEPs සහ ආධාරක යනු තනි ශිෂ්‍ය අධ්‍යාපනය වැඩිදියුණු කිරීමේ මෙවලම් පමණක් මිස නිර්මාණ නොවන බව මතක තබා ගැනීම. |
| III-2. ප්‍රධාන ධාරාවේ ගුරුවරුන්ගේ නිපුණතා සංවර්ධනය | ප්‍රධාන ධාරාවේ ගුරුවරුන්ට අනෙකුත් සිසුන්ගේ ඉගෙනීමට බාධා නොවන පරිදි පන්ති කාමරයේ දී SEN සිසුන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ හැකිය | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කලාප අධ්‍යාපන කාර්යාලය, ගුරු උපදේශක | ප්‍රධාන ධාරාවේ ගුරුවරු | ප්‍රධාන ධාරාවේ ගුරුවරුන් "UDL පුහුණු කිරීම සඳහා මෙවලම් කට්ටලය" භාවිත කරමින් UDL පුහුණු වීම අරඹන්න | UDL යනු SEN සිසුන් සඳහා පමණක් නොව, පන්ති කාමරය පුරා සිසුන්ගේ ඉගෙනීම වැඩිදියුණු කිරීම සඳහා භාවිත කළ හැකි බව අවබෝධ කර ගැනීම. |
| III-3. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ තුළ අන්තර්කරණ අධ්‍යාපනය ප්‍රධාන ප්‍රවණතාව ලෙස | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ තුළ අන්තර්කරණ අධ්‍යාපනය, ප්‍රධාන ප්‍රවණතාව ලෙස උගන්වන අතර, පාසලට පත් වීම් ලබා දුන් විට ඔවුන් එය ප්‍රායෝගිකව භාවිත කිරීමට සූදානම් ය. | අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන ආයතනය හෝ විශ්වවිද්‍යාල | පීඨාධිපති/උප පීඨාධිපති, සියලු ම විෂය කථිකාචාර්යවරු, සහ අනෙකුත් කාර්ය මණ්ඩලය | ලබාගත් දැනුම ප්‍රායෝගික ව වර්ධනය කිරීම සඳහා දේශන සහ වැඩමුළුවකින් සමන්විත පුළුල් වැඩසටහනකි. | විශේෂ අධ්‍යාපන සහ ප්‍රාථමික අධ්‍යාපන දේශන පමණක් ඉලක්ක කර ගැනීමෙන් අපේක්ෂිත ප්‍රතිඵල අත් වන්නේ නැත. NCoE හි සමස්ත කාර්ය මණ්ඩලය වෙත මෙය ළඟා විය යුතු ය. |

මෙහි ඇති වැදගත් පණිවිඩය නම්, අන්තර්කරණ පාසල කෙරෙහි එක් වරක් පමණක් සිදු වන මැදිහත් වීම්වල බලපෑම සීමිත වන බවත්, පොදු දැක්මක් ඇති පාර්ශ්වකරුවන්ගේ බහු-ස්ථර මැදිහත් වීම් ඒ කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි බවත්, එය අන්තර්කරණ පාසල් සාක්ෂාත් කර ගැනීමට හේතු විය හැකි බවත්ය.

විශේෂයෙන්, පහත දැක්වෙන අනුපිළිවෙළ සලකා බලනු ලැබේ. පළමු ව පුළුල් පරාසයක පාර්ශවකරුවන් සඳහා දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් ප්‍රමුඛ වශයෙන් ක්‍රියාත්මක කළ යුතු ය. ඊට අමතරව, පාසල තුළ සහය පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා එහි හරය වන අන්තර්කරණ අධ්‍යාපන සම්බන්ධීකාරකවරුන් සමඟ වැඩ කිරීම අවශ්‍ය වේ. පාසල තුළ සහය පද්ධතියක් ක්‍රියාත්මක වූ පසු, තක්සේරු කමිටුවේ නිර්දේශ අනුව විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ට සක්‍රිය ව පහසුකම් සැපයීමට පමණක් නොව, මෙම දරුවන්ගේ ඉගෙනීම සහතික කිරීම සඳහා සාධාරණ ඉඩ හසර සැපයීමට ද හැකි වනු ඇත. මෙම අවස්ථාවෙහි දී, සහයෝගිතා ක්‍රියාකාරකම්, ඉගෙනීම සහ පාසල පුරා ප්‍රවේශ වීමේ හැකියාව වැනි අන්තර්කරණ ක්‍රියාකාරකම් ඇතුළත් පාසල් සැලැස්මක් නිර්මාණය කරමින් තවත් පියවරක් ඉදිරියට යාමට හැකි වේ. සත්‍ය වශයෙන් ම, සිසුන්ගේ පුද්ගලික අවශ්‍යතා සපුරාලීම සඳහා වි. අ. ඒකක ගුරුවරුන් පමණක් නොව, ප්‍රධාන ධාරාවේ ගුරුවරුන් ද ඇතුළත් සමස්ත ගුරු මණ්ඩලයේ ම ඉගැන්වීමේ කුසලතා වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍ය වේ. එවැනි උත්සාහයන් ඒකරාශී කිරීම අන්තර්කරණ පාසල්වලට වඩාත් තුඩු දෙනු ඇත.

සත්‍ය වශයෙන් ම, පවතින සම්පත් පුළුල් ලෙස වෙනස් වන බැවින්, සියලු ම පාසල් එකම ගමන් පථයක් අනුගමනය නොකරයි. මේ අනුව කලින් කලට සමබර මැදිහත් වීම් අවශ්‍ය බව කිව යුතු ය.




**රූප සටහන 1** : අන්තර්කරණ අධ්‍යාපන ප්‍රවේශ සංකල්පය

මෙම අත්පොත ව්‍යාපෘති අත්දැකීම් මත පදනම්ව සකස් කර ඇති බැවින්, ක්‍රියාත්මක කරන ආයතනය 'ව්‍යාපෘතිය' වේ. කෙසේ වෙතත්, මෙතැන් සිට ක්‍රියාකාරකම් ක්‍රියාවට නංවන්නේ ඔබ බැවින්, එක් එක් ක්‍රියාකාරකම තුළ එහි සන්දර්භය අනුව "ව්‍යාපෘතිය" වෙනුවට "කවුරුන්ද" ලෙස වෙනස් කළ යුතු ආකාරය ගැන සිතමින් මෙම අත්පොත කියවන්න.

ශ්‍රී ලංකාවේ සියලු ම පාසල් අන්තර්කරණ අධ්‍යාපනය සඳහා එක් පියවරක් හෝ ඉදිරියට තැබීමට මෙම අත්පොත උපකාරී වනු ඇතැයි අධ්‍යාපන අමාත්‍යාංශය හා ජයිකා විශේෂඥ කණ්ඩායම බලාපොරොත්තු වේ.

## 2 වන පරිච්ඡේදය - දේශීය මුලපිරීම් ශක්තිමත් කිරීම

මැදිහත් වීමේ පළමු කුළුණ වන්නේ "දේශීය මුලපිරීම ශක්තිමත් කිරීම" ය. මෙම කුළුණ සංරචක දෙකකින් සමන්විත වේ: 1) "පාසල් ප්‍රජාව දැනුවත් කිරීම" සහ 2) "විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් බඳවා ගැනීම ප්‍රවර්ධනය කිරීමේ පද්ධතිය ශක්තිමත් කිරීම".

### 2.1 පාසල් ප්‍රජාව දැනුවත් කිරීම

අන්තර්කරණ අධ්‍යාපනය පදනම් වී ඇත්තේ සමාන අයිතිවාසිකම් සහ දුබලතාව පිළිබඳ සමාජ ආකෘතිය මත බවට කිසිදු ගැටලුවක් නොමැත[3]. අනෙක් අතට, දුබලතාව යනු පුද්ගලයා තුළ ඇති දෝෂයක් ලෙස හෝ සුව කළ යුතු අසාමාන්‍ය තත්ත්වයක් ලෙස සලකන සාම්ප්‍රදායික චින්තන ක්‍රමයක් ද පවතින බව සත්‍යයකි. පොදුවේ ගත් කල, දුබලතා සහිත දරුවන් යනු තවමත් සමාන අයිතිවාසිකම් හිමි පුද්ගලයන්ට වඩා, අනුකම්පාවට ලක් වන අසරණ වස්තූන් පමණි. එබැවින්, අන්තර්කරණ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ පළමු පියවර වන්නේ පාසල් ප්‍රජාවගේ මානසිකත්වය වෙනස් කිරීම සඳහා දුබලතාව පිළිබඳ දැනුවත් කිරීම වන අතර මෙය නිරන්තරයෙන් කළ යුතු උත්සාහයකි.

#### 2.1.1 වර්තමාන තත්ත්වය

37/2020 චක්‍රලේඛය[4] අනුව, දුබලතා සහිත ළමයින් වයස අවුරුදු හතරේ දී විශේෂ අධ්‍යාපන ඒකකයට (SEU) ඇතුළත් කිරීම අවශ්‍ය වේ. චලනය, අවධානය, සංජානන, භාෂාමය සහ ජීවන රටා පුරුදු වැනි මූලික කුසලතා වර්ධනය කිරීම තුළින් මෙම සිසුන්ට පාසල් අධ්‍යාපනය පිළිබඳ පූර්ව අත්දැකීම් ලබා දීමට අවශ්‍ය වේ[5]. වි. අ. ඒකක වෙත ඇතුළු වන සියලු ම සිසුන් උපරිම වසර දෙකක් තුළ, වි. අ. ඒකකයේ දී සංවර්ධනය කිරීමෙන් පසු ප්‍රාථමික අධ්‍යාපනයේ පළමු අවධිය වන 1 ශ්‍රේණිය වෙත අන්තර්කරණය හෝ ඒකීකරණය කිරීම අවශ්‍ය වේ [6]. එයින් ඇඟවෙන්නේ, ශ්‍රී ලංකාව තුළ වි. අ. ඒකක "විධිමත් අධ්‍යාපනයට සූදානම් කිරීමේ පන්තියක්" ලෙස ස්ථාන ගත කර ඇති අතර, දුබලතා සහිත දරුවන්ට 1 ශ්‍රේණියේ ශිෂ්‍යයෙකු ලෙස ඇතුළත් වීමට අවශ්‍ය කුසලතා ලබාගෙන ඇති බව සලකන තෙක් පිළියම් කරනු බවයි.

ප්‍රධාන ධාරාවේ/සාමාන්‍ය පන්ති කාමරවල සිටින දුබලතා සහිත සිසුන් සඳහා සම්පත් කාමර[7] ලෙස ද වි. අ. ඒකක ක්‍රියා කළ හැකි නමුත්, බොහෝ නියමු පාසල්වල එවැනි භාවිතයක් නිරීක්ෂණය වී නොමැත. බොහෝ විට ප්‍රධාන ධාරාවේ එනම් සාමාන්‍ය පාසලේ වි. අ. ඒකක පිහිටා නොමැත. මෙම කරුණු අනුව වි. අ. ඒකක සැලසුම තුළ, දුබලතා සහිත දරුවන් අනෙක් දරුවන් සමඟ සමානව ඉගෙනීමට තරම් "සුදුසුකම්" නොමැති බව සහ සෑම දරුවෙකු ම "සාමාන්‍ය" අධ්‍යාපනයේ පෙරනිමි මාවතක සිටිය යුතු බව අන්තර්ගත වන බව සනාථ වේ.

වි. අ. ඒකක සිසුන්ගේ දෙමාපියන්/භාරකරුවන් ද තම දරුවන් ප්‍රධාන ධාරාවේ පන්තිවලට ඇතුළත් කිරීමට බලාපොරොත්තු දක්වති. දරුවන්ගේ ඒකාකාරී හා සමජාතිය සංවර්ධනයට අනුබල දෙන අධ්‍යාපනය පිළිබඳ ඒකාකාරී දැක්ම ශ්‍රී ලංකාවේ දැඩි ලෙස පවතින බව පැවසිය හැකිය. මෙය අන්තර්කරණ අධ්‍යාපනය සඳහා අත්‍යවශ්‍ය වන, එක් එක් විශේෂ අවශ්‍යතා මත පදනම් වූ අධ්‍යාපනය පිළිබඳ දැනුවත් භාවය සහ ඉගැන්වීමේ කුසලතා ලබා ගැනීමේ දී ගුරුවරුන්ට බාධාවක් විය හැකිය.

[3] එය පුද්ගල දුර්වලතා සහ සමාජීය හා ද්‍රව්‍යමය පරිසරය අතර අන්තර්ක්‍රියාවේ සමාජ බලපෑම ලෙස දුබලතාව අර්ථකථනය කරන ලෝක ව්‍යාප්ත සංකල්පයකි.
[4] 24 වගන්තිය, 37/2020 චක්‍රලේඛය
[5] 7.1 වගන්තිය, 37/2020 චක්‍රලේඛය
[6] 7.2 වගන්තිය, 37/2020 චක්‍රලේඛය
[7] 10.5 සහ 14.2 වගන්ති, 37/2020 චක්‍රලේඛය


### 2.1.2 එලදායී මැදිහත් වීම්

ව්‍යාපෘතිය විසින් ආදි ශිෂ්‍ය සංගමය/පාසල් සංවර්ධන සමිතිය, සිසුන් (ශිෂ්‍ය නායක සාමාජිකයන්), ගුරුවරුන් (වි. අ. ඒකක සහ ප්‍රධාන ධාරාවේ) සහ විදුහල්පති/උප විදුහල්පතිවරුන් ඇතුළු පාසල් ප්‍රජාව පුළුල් ලෙස ඉලක්ක කර ගනිමින් සෑම නියමු පාසලක ම දැනුවත් කිරීමේ වැඩමුළුවක් පවත්වා ඇත. එහි දී පහත අරමුණු හතර ආවරණය වන පරිදි සහභාගිවන්නන්ට ක්‍රියාශීලී ව සිතීමට සහ සාකච්ඡා කිරීමට ඉඩ සලසන, සහභාගිත්ව ආකාරයෙන් වැඩමුළු සෑම නියමු පාසලක ම පවත්වන ලදී. එම අරමුණු:

1. දුබලතා සහිත/රහිත දරුවන්ගේ සමාන අයිතිවාසිකම් සහ දුබලතා සංකල්පය අවබෝධ කර ගැනීම
2. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා අවබෝධ කර ගැනීම
3. අන්තර්කරණ අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීමේ දී පාසල් ප්‍රජාවේ භූමිකා අවබෝධ කර ගැනීම
4. නිශ්චිත ක්‍රියාවන් සඳහා භූමිකාව සහ අදාළ වගකීම් සම්බන්ධ කිරීම.

<u>**වැඩමුළුවේ පෙළ ගැස්ම**</u>


වැඩමුළුවේ හැඳින්වීමේ දී, පහසුකම් සලසන්නා විසින් රෝද පුටුවක සිටින ගැහැණු ළමයෙකුගේ රූප සටහනක් පෙන්වමින් සහභාගිවන්නන් වෙත ප්‍රශ්න යොමු කරයි, එමගින් පුද්ගලයා තුළ ඇති ඌනතාවයක් කෙරෙහි අවධානය යොමු කිරීමේ සිට, සමාජය සංවිධානය වී ඇති ආකාරය නිසා දුබලතාව ඇති වේ යන අදහසට මානසිකත්වය වෙනස් කිරීමට දිරි ගන්වයි. ඉන් පසුව, පහසුකම් සලසන්නා විසින් පාසල් සැකසුම් තුළ විවිධ අභියෝග නිරූපණය කරන සමස්ත නිදර්ශන රූප සටහනක් පෙන්වන අතර, කුඩා කණ්ඩායම් වශයෙන් ඒවා හඳුනා ගැනීමට සහභාගි වන්නන්ගෙන් ඉල්ලා සිටී. මෙම ක්‍රියාකාරකම මගින් මිනිසුන්ගේ දුබලතා ඇති වන්නේ භෞතික බාධකවලින් පමණක් නොව විවිධාකාර හේතු සහ ක්‍රියාකාරකම් නිසා බව හඳුනා ගැනීමට උපකාරී වේ.



**රූප සටහන 2**: දුබලතාව ඇත්තේ කොහේ ද?

කණ්ඩායම් සාකච්ඡාවේ ප්‍රතිඵල කෙටියෙන් බෙදා ගැනීමෙන් පසු, පහසුකම් සලසන්නා විසින් දුබලතාව පිළිබඳ සමාජ ආකෘතිය පැහැදිලි කරයි. එමගින්, අවට පරිසරය සීමාකාරී වන විට සහ මෙම බාධක ඉවත් කිරීමට විශේෂ ක්‍රමවේදයක් නොමැති විට ඌනතා සහිත පුද්ගලයින්, දුබලතා සහිත පුද්ගලයින් බවට පත්වන අතර අධ්‍යාපනය සඳහා සහභාගීත්වය ප්‍රතික්ෂේප වේ. මෙය දුබලතා සහිත පුද්ගලයින් සඳහා විශේෂ ක්‍රමවේද අවශ්‍ය වන්නේ ඇයිද යන්න පැහැදිලි කිරීමේ එක් කොටසකි. මෙම තර්කය, සෑම කෙනෙකුට ම ගෞරවය සහ වටිනාකම ඇති බවත්, සෑම කෙනෙකුට ම ප්‍රමාණවත් ජීවන තත්ත්වයක් සඳහා හිමිකම් ඇතැයි බවත් යන මානව හිමිකම් මූලධර්මය මත පදනම් වී ඇත. යථාර්ථය වන්නේ, ඉහත විස්තර කර ඇති ආකාරයට හට ගත් දුබලතාව වැනි අසමාන තත්ත්වයන් හේතුවෙන් අනෙක් අය හා සමාන අයිතිවාසිකම්වලට ප්‍රවේශ වීමට සහ භුක්ති විඳීමට නොහැකි ඇතැම් පුද්ගලයන් සිටීමයි. එම නිසා, ඔවුන්ට සමාන අවස්ථා ඇති බව සහතික කිරීම සඳහා සහයෝගය ලබා දීම සාධාරණීකරණය කළ හැක. මීට අමතරව, දුබලතා සහිත සිසුන් එකම පන්ති

කාමරයේ සිටින ("ඒකීකරණය") නමුත් ඔවුන්ට අවශ්‍ය සහාය නොලැබෙන අවස්ථා නිරූපණය කිරීම මගින් "අන්තර්කරණය" සහ "අන්තර්කරණය නොකිරීම" අතර වෙනස පැහැදිලි කෙරේ. එනම්, ඔවුන් ව නිවැරදිව අන්තර්කරණය කිරීම සඳහා අවශ්‍ය සහාය තිබිය යුතු අතර, සිසුන්ට නිවැරදිව සහාය නොලැබෙන තත්ත්වය අන්තර්කරණය නොවේ[8].




**රූප සටහන 3**: අන්තර්කරණය නොවන්නේ කුමක් ද?

දුබලතා සහිත සිසුන් සඳහා සමාන සහභාගීත්වයක් ලබා ගත හැක්කේ පුද්ගලබද්ධ සහාය තිබේ නම් පමණක් බව අවබෝධ කර ගනිමින්, සහභාගිවන්නන් නැවතත් කුඩා කණ්ඩායම් වශයෙන් ඉහත එක් එක් අවස්ථාවන්හි දී පාසල විසින් ලබා දිය හැකි සහාය සලකා බැලීමට කටයුතු කරයි. කණ්ඩායම් සාකච්ඡා මත පදනම් ව බාධක ඉවත් කිරීම සඳහා එක් එක් පාසල් ප්‍රජාවට කළ හැකි කාර්යභාරය පිළිබඳ පූර්ණ සාකච්ඡාවකින් වැඩමුළුව අවසන් වේ. විස්තර සඳහා, කරුණාකර උප ග්‍රන්ථය I “දැනුවත් කිරීම සඳහා මෙවලම් කට්ටලය” බලන්න.





දැනුවත් කිරීමේ වැඩමුළුව

ව්‍යාපෘතියේ අනෙකුත් මැදිහත් වීම් වලින්, මෙම දැනුවත් කිරීමේ වැඩමුළුව පාසල් ප්‍රජාවේ මානසිකත්වයේ/චින්තන රටාවේ වෙනස්කම් ඇති කර ඇති බව පෙනේ. වි. අ. ඒකක ගුරුවරුන්ට තනි සිසුන් කෙරෙහි අවධානය යොමු කිරීමට සහ තනි තනිව ඉගැන්වීම සඳහා පන්ති කාමර පරිසරයට නිරායාසයෙන් හැඩගැසීමට හැකි වේ. තවද සමහර නියමු පාසල් දුබලතා සහිත සිසුන් සඳහා පාසල් පරිසරය වැඩිදියුණු කිරීමට උත්සාහ දරයි.

## 2.2 විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් බඳවා ගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා පද්ධතිය ශක්තිමත් කිරීම

1997 දී පාර්ලිමේන්තු පනතක් මගින්, 1998 වසරේ සිට ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 5 සිට 14 දක්වා ළමුන් සඳහා පාසල් අධ්‍යාපනය අනිවාර්ය කරන ලදී. පසුව අනිවාර්ය අධ්‍යාපන කාලය වයස අවුරුදු 5 සිට 16 දක්වා සංශෝධනය කර ඇත. මෙය ශ්‍රී ලංකාවට සාර්ව ප්‍රාථමික අධ්‍යාපනය ආසන්න වශයෙන් සාක්ෂාත් කර ගැනීමට ඉවහල් වුවද, විශේෂ අවශ්‍යතා සහිත දරුවන් ඇතුළු පාසල් වියේ සිටින බොහෝ දරුවන් විවිධ හේතූන්

[8] එක් එක් පුද්ගලයන් සඳහා අවශ්‍ය මෙම සහාය, වෙනස් කිරීම් හෝ ගැළපීම තාක්ෂණික ව "සාධාරණ ඉඩ හසර" ලෙස හැඳින්වේ.

මත පාසලෙන් බැහැරව සිටිති. විශේෂ අවශ්‍යතා සහිත දරුවන් තක්සේරුවට හා ඔවුන් රජයේ පාසල්වලට ඇතුළත් කර ගැනීමට සහාය වීමට නිසි ක්‍රමවේදයක් නොමැති වීම එයට එක් හේතුවකි. එවැනි ක්‍රමයක් නොමැති විට, උපදෙස් සඳහා යොමු විය යුත්තේ කොතැනට දැයි දෙමාපියන් / භාරකරුවන් නොදන්නා අතර, එය දරුවන්ට පාසලට පැමිණීම අත්හැරීමට හේතු විය හැක. මීට අමතරව, විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ පාසල් අධ්‍යාපනය පිළිබඳ තීරණ වෘත්තීය සහ විෂයානුබද්ධ විශ්ලේෂණයකින් තොර ව අත්තනෝමතික ලෙස ගැනීමට ඉඩ ඇත. මෙම හේතූන් නිසා, අන්තර්කරණ අධ්‍යාපනය සාක්ෂාත් කර ගැනීමේ ප්‍රවේශ මාර්ගයක් ලෙස විධිමත් ක්‍රමවේදයක් තිබීම අත්‍යවශ්‍ය වේ.

### 2.2.1 වර්තමාන තත්ත්වය

ව්‍යාපෘතියේ මූලික සමීක්ෂණයෙන් හෙළි වූයේ බොහෝ අධ්‍යාපන කොට්ඨාශ සහ කලාපවල සිසුන්ගේ පැමිණීම සහ අනිවාර්ය අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා පත් කරන ලද කමිටුවක් ඇති බවයි. කෙසේ වෙතත්, එවැනි කමිටුවක ඉලක්කය විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන්ට පමණක් සීමා වී නැති බව සොයා ගන්නා ලදී. පාසලෙන් බැහැරව සිටින හෝ අධ්‍යාපනය හැර යාමේ වැඩි අවදානමක් ඇති සියලු ම දරුවන් මෙම කමිටුව විසින් ආවරණය කර ඇත. නමුත්, විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන් නිසි ලෙස තක්සේරු කිරීමට සහ දෙමාපියන්ට/භාරකරුවන්ට සුදුසු උපදෙස් ලබා දීමට ක්‍රමවේදයක් හෝ විශේෂඥතාවක් මෙම කමිටුවට නොමැත.

37/2020 චක්‍රලේඛයට අනුව, දුබලතා සහිත දරුවන් පිළිබඳ තොරතුරු වයස අවුරුදු තුනේ දී සෞඛ්‍ය අංශයෙන්[9] ලබා ගෙන, කලාප තක්සේරු කමිටුව මගින් එම ළමයින් හඳුනා ගැනීම සහ ලියාපදිංචිය කිරීම අවශ්‍ය වේ. ඉන් පසුව ලියාපදිංචි වූ දරුවන්ගේ දෙමාපියන්/භාරකරුවන් දැනුවත් කිරීමේ රැස්වීම්, එක් පාසල් වාරයකට වරක් බැගින් වසරකට තුන් වරක් පැවැත්විය යුතු ය. එම රැස්වීම් සඳහා ප්‍රදේශයේ සෞඛ්‍ය සේවා නිලධාරියෙකු, ළමා රෝග විශේෂඥ වෛද්‍යවරයෙකු, මනෝ වෛද්‍යවරයෙකු, කථන, වෘත්තීය හා භෞත චිකිත්සක වැනි චිකිත්සකයින්, විශේෂ අධ්‍යාපන සහ ප්‍රාථමික අධ්‍යාපන නිලධාරීන් සහ විශේෂ අධ්‍යාපන ගුරුවරුන් ඇතුළු අදාළ සියලු පාර්ශ්වයන්ගේ සහභාගීත්වය සහතික කිරීම අවශ්‍ය වේ. පළමු රැස්වීම අතරතුර, දරුවාගේ වෛද්‍ය වාර්තාව දෙමාපියන්ට/භාරකරුවන්ට, ගුරුවරුන්ට සහ අධ්‍යාපනඥයින්ට පැහැදිලි කිරීම අවශ්‍ය වේ. ඊට අමතරව පවුල සහ ඥාතීන් විසින් ඉටු කළ යුතු වගකීම්, වෛද්‍ය සහය සහ ප්‍රතිකාර, උපදෙස් ලබාගත හැකි ස්ථාන සහ ආයතන පිළිබඳ ව දෙමාපියන්/භාරකරුවන් වෙත පැහැදිලි කරනු ලැබේ. රජයේ රෝහල්වල සහ ප්‍රතිකාර මධ්‍යස්ථානවල තම දරුවාට ප්‍රතිකාර, චිකිත්සා සහ වෙනත් සෞඛ්‍ය සේවා/ප්‍රතිකාර ලබා ගැනීමේ දී දෙමාපියන්/භාරකරුවන් කිසියම් දුෂ්කරතාවකට මුහුණ දෙන්නේ නම්, දෙවන දැනුවත් කිරීමේ රැස්වීම හරහා ඔවුන්ට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සහාය ලබා ගැනීම සඳහා යොමු කෙරේ. තුන්වන දැනුවත් කිරීමේ රැස්වීමේ දී තක්සේරු කමිටුව දරුවා හඳුනා ගන්නා අතර කමිටුව අධ්‍යාපනික තක්සේරුව සඳහා වෙනම දිනයක් වෙන් කිරීම අවශ්‍ය වේ[10].

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල සහ කලාප අධ්‍යාපන කාර්යාලවල පහත සඳහන් වෘත්තිකයන්ගෙන් අවම වශයෙන් තිදෙනෙකු, අධ්‍යාපන තක්සේරුව සඳහා සහභාගී විය යුතු බව 37/2020 චක්‍රලේඛය සඳහන් කරයි [11].

- නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂක/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂක - විශේෂ අධ්‍යාපන
- නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂක/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂක - ප්‍රාථමික අධ්‍යාපන
- ගුරු උපදේශක - විශේෂ අධ්‍යාපන
- ගුරු උපදේශක - ප්‍රාථමික අධ්‍යාපන
- විශේෂ අධ්‍යාපන ජ්‍යෙෂ්ඨ ගුරුවරයෙකු

[9] 3.3 වගන්තිය, 37/2020 චක්‍රලේඛය
[10] 3.5 වගන්තිය, 37/2020 චක්‍රලේඛය
[11] 4.2.4 වගන්තිය, 37/2020 චක්‍රලේඛය

### 2.2.2 ඵලදායී මැදිහත් වීම්

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2022 වසරේ අගභාගයේ දී තක්සේරු කමිටු පිහිටුවා, පුහුණු කිරීමෙන් පසුව, ව්‍යාපෘතිය මගින් 2023 වසරේ මුල් භාගයේ සිට මැද භාගය දක්වා පිළියන්දල, කුරුණෑගල සහ නිකවැරටිය යන ප්‍රදේශවල ළමුන් හත් දෙනෙකුගේ තක්සේරු ක්‍රියාවලිය අධීක්ෂණය කරන ලදී. බොහෝ දරුවන් වෛද්‍යවරයෙකුගේ සටහනක් නොමැතිව ඇගයීමට පැමිණෙන බව ව්‍යාපෘතිය විසින් සොයා ගන්නා ලදී. KOICA හි තාක්ෂණික සහාය ඇතිව, අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ කථිකාචාර්යවරු, ජාතික අධ්‍යාපන ආයතනය සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු නිලධාරීන්ගෙන් සමන්විත කණ්ඩායමක් විසින් තක්සේරුකරණ මාර්ගෝපදේශ සහ ආකෘති සකස් කරන ලදී. 2023 දී තක්සේරුකරණ මාර්ගෝපදේශ සංග්‍රහය සහ ආකෘති මුද්‍රණය කර බෙදා හැරීම සහ සියලු ම පළාත්වල අදාළ කමිටු සාමාජිකයින් පුහුණු කර අවසන් කර ඇත. ඒ අනුව 2024 සිට, කමිටුව රටපුරා සක්‍රියව ක්‍රියාත්මක කර ඇත.



නිකවැරටිය අධ්‍යාපන තක්සේරු කමිටුව විසින් පිරිමි දරුවෙකු තක්සේරුව



කුරුණෑගල අධ්‍යාපන තක්සේරු කමිටුව විසින් ගැහැණු දරුවෙකු තක්සේරුව

ව්‍යාපෘතියේ මැදිහත් වීම හරහා, වයඹ පළාත් සමාජ සේවා අංශය සහ අධ්‍යාපන ක්ෂේත්‍රය අතර නිපුණතා සංවර්ධන මධ්‍යස්ථානවලින්[12] ප්‍රාථමික පාසල් වෙත සුමට සංක්‍රමණයක් වැඩිදියුණු කරමින් පවතී. එසේම, විශේෂ අවශ්‍යතා සහිත පාසලෙන් බැහැරව සිටින ළමයින් පිළිබඳ දත්ත භූවමාරු කර ගැනීමේ අරමුණින් සහයෝගිතාවක් ගොඩනැගෙමින් පවතී. විශේෂයෙන්ම, 2023 ඔක්තෝබර් මස ආරම්භයේ දී අධ්‍යක්ෂවරුන් ඇතුළු ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ පැවති රැස්වීමකින් පසු, ප්‍රාථමික/වි. අ. ඒකක ගුරුවරුන්ට සහ නිපුණතා සංවර්ධන මධ්‍යස්ථාන සේවා සහ අධ්‍යාපන කාර්ය මණ්ඩලයට, එක් එක් අංශයේ ක්‍රියාකාරකම් පිළිබඳ අන්‍යෝන්‍ය අවබෝධය ගැඹුරු කිරීමට සහ අනාගත සහයෝගිතාව සාකච්ඡා කිරීම සඳහා සම්මන්ත්‍රණයක් වාරියපොල දී පැවැත්විණ. එබැවින් විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමයින්ගේ අධ්‍යාපන අවස්ථා සැලසීම පිළිබඳ වයඹ පළාතේ සමාජ සේවා අංශය සහ අධ්‍යාපන ක්ෂේත්රය අතර සහයෝගිතාව වර්ධනය වෙමින් පවතී.

[12] මෙම නිපුණතා සංවර්ධන මධ්‍යස්ථාන (SDC) පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වේ. සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත අඛණ්ඩව යවන ලද JICA ස්වේච්ඡා සේවකයන්ගේ කැපවීමෙන් වැඩ කිරීම තුළින් SDCs දැනුම සහ භාවිත රැස් කර ගෙන ඇත. මෙය වයඹ පළාතට පමණක් ආවේණික වූ වැඩපිළිවෙළක් වන අතර අනෙකුත් පළාත්වල එවැනි පහසුකම් නොමැත.

## 3 වන පරිච්ඡේදය - පාසල පුරා ප්‍රයත්න ශක්තිමත් කිරීම

මැදිහත් වීමේ දෙවන කුළුණ වන්නේ "පාසල පුරා ප්‍රයත්න ශක්තිමත් කිරීම" ය. මෙම කුළුණ සංරචක තුනකින් සමන්විත වේ: 1) “පාසල තුළ සහය පද්ධතියක් ස්ථාපිත කිරීම", 2) “පාසල් සංවර්ධන සැලසුම්වලට අන්තර්ගත කිරීම" සහ 3) “මූලික පාසල් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම".

### 3.1 පාසල තුළ සහය පද්ධතියක් ස්ථාපිත කිරීම

අන්තර්කරණ අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීම විශේෂඥයින්ගේ කාර්යයක් පමණක් නොවන අතර, ඒ සඳහා මුළු පාසල් ප්‍රජාවගේ ම සහයෝගය අත්‍යවශ්‍ය වේ. විශේෂ අවශ්‍යතා සහිත දරුවන් ඇතුළත් වන ආකාරයට පාසල තුළ ගම්‍යතාවක් සහ ක්‍රමවේදයක් නොමැති නම් තිරසාර අන්තර්කරණ අධ්‍යාපනයක් ක්‍රියාත්මක කළ නොහැක. මේ සඳහා, පාසල තුළ සිටින පාර්ශ්වකරුවන් (විදුහල්පතිවරු, ගුරුවරු, පාසල් උපදේශකයින් ඇතුළු පිරිස) සමඟ සහයෝගයෙන් කටයුතු කරන සහ පාසලෙන් පිටත පාර්ශ්වකරුවන් (දෙමාපිය/භාරකරුවන්, කලාප අධ්‍යාපන කාර්යාල, ගුරු උපදේශකයින්) සමඟ සම්බන්ධීකරණය සිදු කරන සම්බන්ධීකාරකවරයාගේ කාර්යභාරය අතිශයින් වැදගත් වේ. නිදසුනක් වශයෙන්, අන්තර්කරණ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා, එක් එක් දරුවාගේ විශේෂ අවශ්‍යතා හඳුනා ගෙන IEP සංවර්ධනය කිරීම සඳහා කණ්ඩායමක් ලෙස වැඩ කිරීමේ ක්‍රියාවලිය වැදගත් වේ. කෙසේ වෙතත්, මෙම IEP සංවර්ධනය කිරීම විශේෂඥයින් විසින් පමණක් සිදු කරන්නේ නම් එහි වැදගත්කම අඩු වේ. එය කණ්ඩායමක් ලෙස සාකච්ඡා කිරීම, නිර්මාණය කිරීම සහ අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. මේ අනුව, අන්තර්කරණ පාසලක් නිර්මාණය කිරීම සඳහා පාසල තුළ උපකාරක පද්ධතියක් ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය වේ.

#### 3.1.1 වර්තමාන තත්ත්වය

37/2020 චක්‍රලේඛය මගින් ශ්‍රී ලංකාවේ සියලු ම පාසල්වලට සම්බන්ධීකාරකවරයෙකු[13] සිටිය යුතු බවට නියම කර ඇත. චක්‍රලේඛයට අනුව, විදුහල්පති සමඟ සහයෝගයෙන් පාසල් ප්‍රජාව සහ බාහිර පාර්ශව දැනුවත් කිරීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට අදාළ ගැටලු සඳහා සහාය සැපයීම, සංචාරක ගුරුවරුන්ගේ කාලසටහන් සැකසීම, IEP/ILP සංවර්ධනය සඳහා සම්බන්ධීකරණය සහ එහි අධීක්ෂණය, ඒකාබද්ධ ඉගෙනුම් ක්‍රියාකාරකම් හරහා ගුරුවරුන් සහ සිසුන් සඳහා සමාජ-චිත්තවේගී කුසලතා වැඩිදියුණු කිරීම, හිරිහැර මඟ හරවා ගැනීම සඳහා වැළැක්වීමේ පියවර ගැනීම ආදිය සම්බන්ධීකාරකයාගේ කාර්යභාරය ලෙස ලැයිස්තු ගත කරයි. චක්‍රලේඛයට අනුව සම්බන්ධීකාරකවරුන් පත් කර, ඇතැම් පළාත්වල ඔවුන්ට පුහුණුව ලබා දුන්න ද යථාර්ථය නම් බොහෝ අවස්ථාවල පාසල් තුළ අන්තර්කරණ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ අපේක්ෂිත කාර්ය භාරය ඉටු කිරීමට සම්බන්ධීකාරකවරුන්ට නොහැකි වී ඇත. දැනුම සහ කුසලතා නොමැතිකම මෙයට යම් වශයෙන් හේතු වී ඇති නමුත්, සම්බන්ධීකාරකවරුන්ට ක්‍රියාත්මක වීමට පාසල තුළ ආධාරක පද්ධතියක් නොමැතිකම වඩා බලපායි.

[13] 21 වගන්තිය, 37/2020 චක්‍රලේඛය


### 3.1.2 ඵලදායී මැදිහත් වීම්

ශ්‍රී ලංකාවේ පාසල් තුළ සහය පද්ධතිය තවමත් ක්‍රියාත්මක වී නොමැති අතර, පාසලේ අදාළ පාර්ශ්ව සමඟ සහයෝගිතා කණ්ඩායමක් ලෙස එක්ව කටයුතු කිරීම ක්‍රියාත්මක නොවේ. නියමු පාසල් අධීක්ෂණය කිරීමේ දී, SEU ගුරුවරුන් පුද්ගලිකව ප්‍රාථමික ගුරුවරුන් සමඟ සමීපව කටයුතු කිරීම සහ IEP සකස් කිරීමේ දී දෙමාපියන්ගේ/ භාරකරුවන්ගේ කැමැත්ත සැලකිල්ලට ගැනීම වැනි තනි පුද්ගල උත්සාහයන් මත පදනම් වූ සහයෝගිතා කටයුතු පාසල් කිහිපයක නිරීක්ෂණය විය. තනි පුද්ගල උත්සාහයන් මත රඳා නොසිට, පාසල තුළ තිරසාර සහය පද්ධතියක් ගොඩනැගීම යෝග්‍යය යන දෘෂ්ටි කෝණයෙන්, ව්‍යාපෘති කණ්ඩායම පාසල් නිරීක්ෂණ චාරිකාවල දී අන්තර්කරණ අධ්‍යාපන සම්බන්ධීකාරකවරුන් සමඟ ඔවුන්ගේ භූමිකාවන් පැහැදිලි කර ගැනීම සඳහා සාකච්ඡා කරන ලදී. එසේම, අන්තර්කරණ අධ්‍යාපන සම්බන්ධීකාරකවරුන්ට ක්‍රමානුකූල ව සහාය දෙන ආකාරය පිළිබඳ ව විදුහල්පතිවරුන්ට නිශ්චිත උපදෙස් ලබා දීම සිදු විය.


මෙම ප්‍රයත්නවල අවසන් ප්‍රතිඵලය ලෙස, සමස්ත පාසල් ප්‍රජාවේ ම සහයෝගය අත්‍යවශ්‍ය බව අවධාරණය කිරීම සඳහා අන්තර්කරණ අධ්‍යාපන සම්බන්ධීකාරක පමණක් නොව, විදුහල්පති/නියෝජ්‍ය විදුහල්පති, ගුරුවරුන් (වි. අ. ඒකක සහ සාමාන්‍ය පන්ති), උපදේශන ගුරුවරුන් සහ දෙමාපියන්/භාරකරුවන්ට ද ආරාධනා කරමින් නියමු පාසල් සඳහා වැඩමුළුවක් සැලසුම් කර පැවැත්වීමට ව්‍යාපෘතිය තීරණය කළේ ය. ඒ අනුව, ව්‍යාපෘතිය මඟින් දේශනයක් සහ සහභාගිවන්නන් සඳහා භූමිකා රංගන ලෙස මෙම වැඩමුළුව පහත අරමුණු හතර ආවරණය වන සේ, කොටස් දෙකකින් සමන්විත ව ක්‍රියාත්මක කරන ලදී.

1. අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ දැනුවත් කිරීම;
2. "කණ්ඩායම් ප්‍රවේශය" වැදගත්කම අවබෝධ කර ගැනීම;
3. විශේෂ අවශ්‍යතා සිසුන් හඳුනාගැනීම සමඟ අන්තර්කරණ පන්ති කළමනාකරණය සම්බන්ධ කරන ආකාරය ඉගෙන ගැනීම; සහ
4. භූමිකා රංගන තුළින් ඔබ උගත් දේ ප්‍රතිදානය කිරීම

මෙම වැඩමුළුවේ දී, දුබලතාව සහ අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ මූලික සංකල්ප, සම්බන්ධීකාරක විසින් මෙහෙයවන "කණ්ඩායම් ප්‍රවේශයක" වැදගත්කම, විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා සාධාරණ ඉඩ හසර සහ IEP සහ මූලික පාරිසරික විධිවිධාන පිළිබඳ ව අනුපිළිවෙළින් ඉගෙන ගත් අතර, පසුව තෝරා ගත් අවස්ථා පදනම් ව, කණ්ඩායම් සාකච්ඡා පවත්වා, භූමිකා රංගන ඉදිරිපත් කෙරුණි. විස්තර සඳහා, කරුණාකර උපග්‍රන්ථය II "IE සම්බන්ධීකාරක සජීවිකරණ සඳහා මෙවලම් කට්ටලය" වෙත යොමු වන්න.




රූප සටහන 4: IE සම්බන්ධීකාරක සමඟ සහයෝගිතාව




රූප සටහන 5: අවස්ථා සඳහා උදාහරණ

මෙය ව්‍යාපෘතිය මඟින් කළ නව අත්හදා බැලීමක් වූ අතර, සහභාගිවන්නන් තමන් ඉගෙන ගත් දේ ප්‍රතිදානය කිරීම සඳහා භූමිකා රංගන සැලසුම් කර රඟ දැක්වූ අතර, සහභාගීවූවන්ගෙන් බහුතරයක් පෙන්වා දුන්නේ "කණ්ඩායම් ප්‍රවේශයේ" වැදගත්කම තමන් වටහා ගෙන ඇති අතර අනාගත භාවිතය සඳහා ඔවුන්ට භාවිත කළ හැකි ක්‍රමවේද ලබා ගත් බවයි.





IE සම්බන්ධීකාරකවරුන් සජීවිකරණ සඳහා වැඩමුළුව

ව්‍යාපෘති කණ්ඩායම මඟින් සිදු කරන ලද නිරන්තර පාසල් නිරීක්ෂණ චාරිකා සහ පුහුණු අවස්ථා ඇතුළත් මැදිහත් වීම් තුළින්, වර්තමානය වන විට නියමු පාසල්වල, සමස්ත පාසල ම අන්තර්කරණය කිරීමේ වැදගත්කම පිළිබඳ IE සම්බන්ධීකාරක ප්‍රමුඛ පාසල් ප්‍රජාවේ අවබෝධය ගැඹුරු වී ඇති බව දැකීම මෙන්ම කණ්ඩායම් ප්‍රවේශයක් මත පදනම් වූ පාසල තුළ සහය පද්ධතියක් ආරම්භ වී ඇති බව දැකීම ද සතුටට කරුණකි.

පාසල්වල අන්තර්කරණ අධ්‍යාපන සම්බන්ධීකාරකවරුන් පත් කිරීම තවමත් ශ්‍රී ලංකාවට අලුත් ය. පාසල් ප්‍රජාවේ ප්‍රයත්න විසින් අන්තර්කරණ අධ්‍යාපන සම්බන්ධීකාරක විසින් මෙහෙයවනු ලබන පාසල තුළ සහය පද්ධතිය ක්‍රමානුකූල ව ශක්තිමත් කරන්නේ නම්, ශ්‍රී ලංකාවේ පාසල් අනාගතයේ දී අන්තර්කරණ පාසල් පරිසරයක් සාක්ෂාත් කර ගැනීමට තවත් සමීප වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 3.2 පාසල් සංවර්ධන සැලසුම්වලට අන්තර්කරණ අධ්‍යාපනය අන්තර්ගත කිරීම

අන්තර්කරණ අධ්‍යාපනය සාක්ෂාත් කර ගැනීම සඳහා, එම සංකල්ප පාසල් මට්ටමින් ක්‍රියාකාරකම් බවට පරිවර්තනය කිරීම අත්‍යවශ්‍ය වේ. එබැවින් අන්තර්කරණ අධ්‍යාපනය සමස්ත පාසලේ ම වගකීමක් ලෙස පිළිගෙන, අදාළ ගැටලු ක්‍රමානුකූල ව හා උපක්‍රමශීලී ව විසඳා ගැනීම සඳහා අන්තර්කරණ අධ්‍යාපන ඉලක්ක පාසලේ පස්-අවුරුදු ක්‍රියාකාරී සැලැස්මේ සහ පාසල් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ පැහැදිලිව දැක්වීම සහ ඊට අදාළ ක්‍රියාකාරකම් ලැයිස්තු ගත කර ඇති බවට වග බලා ගැනීම අවශ්‍ය වේ.

### 3.2.1 වර්තමාන තත්ත්වය

මූලික සමීක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස, බොහෝ නියාමන පාසල් විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරකම් රැසක් සැලසුම් කර නොමැති බව සහ ඔවුන්ගේ පාසල් වාර්ෂික ක්‍රියාකාරී සැලසුම්වල අන්තර්කරණ අධ්‍යාපනය ඇතුළත් නොවන බව සොයා ගන්නා ලදී. පාසල් මට්ටමින් විවිධ ක්‍රීඩා තරඟ සංවිධානය කිරීම සහ වාර්ෂිකව ජාතික මට්ටමින් රට පුරා පවත්වන ක්‍රීඩා උත්සවය විශේෂ අවශ්‍යතා සහිත දරුවන් වෙනුවෙන් සැලසුම් කර තිබූ ප්‍රධානතම ක්‍රියාකාරකම විය.

### 3.2.2 ඵලදායී මැදිහත් වීම්

මෙම ව්‍යාපෘතිය මගින් 2022 ජූලි මාසයේ දී "අන්තර්කරණ-දිශානතිව පාසල් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සඳහා වැඩමුළුව" පවත්වන ලදී. මෙම වැඩමුළුවේ දී, ඒකාබද්ධ ක්‍රියාකාරකම් සහ ඉගෙනීම, අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය, විශේෂ අවශ්‍යතා සහිත පාසලෙන් බැහැරව සිටින ළමයින් හඳුනා ගැනීම සහ පාසල් යටිතල පහසුකම් සහ පාරිසරික විධිවිධාන යන පාසල් වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට ඇතුළත් කළ යුතු මාතෘකා හතරක් ආවරණය කරන ලදී. නියාමන පාසල් වැඩමුළුව අතරතුර එක් එක් මාතෘකාව යටතේ ඉදිරි වසර සඳහා තම ක්‍රියාකාරකම් සැලසුම් සකස් කළහ. වැඩමුළුවෙන් පසුව, මෙම ක්‍රියාකාරකම් පාසල් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට සහ ඊළඟ වසර සඳහා පස්-අවුරුදු ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීම සහතික කිරීම සඳහා ව්‍යාපෘතිය සියලු ඉලක්ක ගත පාසල් වෙත පසු විපරම් චාරිකා සිදු කළේ ය.

ව්‍යාපෘතිය විසින් 2023 දී "ඒකාබද්ධ ක්‍රියාකාරකම් සහ ඉගෙනීම සැලසුම් කිරීම සඳහා වූ වැඩමුළුව" නමින් තවත් වැඩමුළුවක් පවත්වන ලදී. මෙම වැඩමුළුව පවත්වන ලද්දේ පෙර වැඩමුළුව මගින් යෝජනා කළ පරිදි 2023 වසර සඳහා ඔවුන්ගේ සැලසුම්වලට ඒකාබද්ධ ක්‍රියාකාරකම් සහ ඉගෙනීම ඇතුළත් කිරීම ප්‍රවර්ධනය නොකළ බව පෙනී ගිය බැවිනි. මෙම වැඩමුළුව ඒකාබද්ධ ක්‍රියාකාරකම් සහ ඉගෙනීම සඳහා පමණක් වෙන් වූ අතර, සහභාගිවන්නන්ගේ අවබෝධය වැඩි කිරීම සඳහා ජපානයෙන් සංයුක්ත උදාහරණ හඳුන්වා දීම සහ සහභාගිවන්නන් විසින් උදාහරණ මත පදනම් ව සැබෑ පාඩම් සැලසුම් නිර්මාණය කිරීම සිදු විය. තවද, ව්‍යාපෘතිය විසින් ක්‍රියාකාරකම් සඳහා සැබෑ ක්‍රියාත්මක කිරීමේ දිනයක් (ඔක්තෝබර් 2, එනම් ළමා දිනයෙන් පසු ඊළඟ වැඩ කරන දිනය) යෝජනා කළ අතර වැඩමුළුව අතරතුර ඔවුන් සැලසුම් කළ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට පාසල් දිරිමත් කරන ලදී. ව්‍යාපෘතිය පාසල් සමඟ පසු විපරම් කළ අතර ක්‍රියාකාරකම් සැබෑ ලෙස ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කළේය.



වැඩමුළුවට සහභාගිවන්නන් විසින් පාඩම් සැලැස්ම සංවර්ධනය කිරීම



සතුන් සාදන ආකාරය ගැන වි. අ. ඒකක සිසුන් සහ ප්‍රධාන ධාරාවේ පන්තියේ සිසුන් එකිනෙකාගෙන් ඉගෙන ගනී



ප්‍රධාන ධාරාවේ පන්තියේ සිසුන් වි. අ. ඒකක ශිෂ්‍යයෙකුට කඩදාසි පලතුරු, කූඩයේ ඇලවීමට සහාය වේ



වි. අ. ඒකකයේ සහ ප්‍රධාන ධාරාවේ පන්තියේ සිසුන් එක්ව තම අත්ලෙහි ජලය රැගෙන යමින්, බෝතලයට කොපමණ ජලය රැගෙන යා හැකිද යන්න තරඟ කරති

සමහර පාසල් අන්තර්කරණ අධ්‍යාපනය ආශ්‍රිත ක්‍රියාකාරකම් නම්‍යශීලී ව අන්තර්ගත කළ අතර අනෙක් පාසල් එසේ නොකළහ. විශේෂයෙන් විශාල පාසල්වලට ක්‍රියාකාරී සැලසුමට ඇතුළත් කිරීමට බොහෝ ක්‍රියාකාරකම් ඇති බැවින් ඔවුන් බොහෝ විට මුදල් අවශ්‍ය නොවන ක්‍රියාකාරකම් සැලසුමට ඇතුළත් නොකරයි. පළාත්/කලාප අධ්‍යාපන කාර්යාලය විසින් ඒවා ඇතුළත් කිරීමට නියෝග නිකුත් කරන්නේ නම් මිස අන්තර්කරණ අධ්‍යාපනය සම්බන්ධ ක්‍රියාකාරකම් ලැයිස්තු ගත නොකරන බව සමහර පාසල් ප්‍රකාශ කළහ.

වැඩමුළුව පැවැත්වීමෙන් පසු බොහෝ පාසල්වල ඒකාබද්ධ ක්‍රියාකාරකම් සහ ඉගෙනීම ක්‍රියාත්මක විය. සෑම පාසලක ම සාමාන්‍යයෙන් සිදු කෙරෙන සහයෝගිතා ක්‍රියාකාරකම් හා සසඳන විට, මෙම නව ක්‍රියාකාරකම් හොඳින් සැලසුම් කර සකස් කර ඇති අතර, ළමුන් අතර අන්තර්ක්‍රියා සහ සහයෝගිතාවට ස්වාභාවික ව අනුබල දෙන සේ සැලසුම් කර ඇත. ඊට අමතරව, ක්‍රියාකාරකම් අන්තර්ගතය විෂයයට සම්බන්ධ වන සේ අන්තර් විෂය (කලාව සහ පරිසරය වැනි) විය. වෙනත් වචන වලින් කිවහොත්, එය සැලසුම් කර ඇත්තේ ළමුන් අතර අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වය සහ විෂය ඉගෙනීම එකවර ප්‍රවර්ධනය කිරීම සඳහා ය.

## 3.3 පාසල්වල මූලික යටිතල පහසුකම් සංවර්ධනය

අන්තර්කරණ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ දී පාසල් පහසුකම් සහ පරිසරයේ ප්‍රවේශ්‍යතාව ඇති කිරීම අත්‍යවශ්‍ය පියවරකි. සියලු ම පාසල්වලට ප්‍රවේශ පහසුකම්, පන්ති කාමර, සනීපාරක්ෂක ස්ථාන ආදියට ප්‍රවේශතා පහසුකම් සැලසීම පාසල් ගොඩනැගිලි ඉංජිනේරුවරු, විදුහල්පති සහ අධ්‍යාපන බලධාරීන්ගේ වගකීමක් බව **37/2020** චක්‍රලේඛයේ සඳහන් වේ.[14] ඒ අතරම, මෙමගින් පමණක් දුබලතා සහිත සියලු ම සිසුන්ට ප්‍රධාන ධාරාවේ/සාමාන්‍ය පන්ති කාමරවල ඉගෙනීමට හැකියාවක් නොලැබෙන බව සඳහන් කළ යුතුය. වෙනත් විවිධ ප්‍රයත්නයන් සමඟ එක්ව පාරිසරික සැකැස්ම ප්‍රවර්ධනය කිරීම අවශ්‍ය වේ.

### 3.3.1 වර්තමාන තත්ත්වය

පාසල් පරිසරයේ වැදගත්කම, 33/2022 චක්‍රලේඛයේ මනාව විස්තර කර ඇත. සාර්ව සැලසුම් මූලධර්මවලට අනුව, සියලු ම පාසල්වල පන්තිකාමර ඇතුළු ව, පුස්තකාල, ක්‍රීඩා පිටි, විද්‍යාගාර, සනීපාරක්ෂක ස්ථාන ආදිය සෑම කෙනෙකුට ම හැකි උපරිමයෙන් ප්‍රවේශ විය හැකි පරිදි සකස් කිරීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, ප්‍රවේශතා පහසුකම් ඇති බොහෝ පාසල්වල පවා එම පහසුකම් භාවිතයට අපහසු බව නිරීක්ෂණය වී ඇත. වි. අ. ඒකක බොහෝ විට ප්‍රධාන පාසල් ගොඩනැගිලිවල කෙළවරක හෝ පිටුපස හෝ වෙනම

[14] 14.3 වගන්තිය, 37/2020 චක්‍රලේඛය

ගොඩනැගිල්ලක,[15] පිහිටා ඇති අතර ප්‍රවේශතා වැසිකිළි සහ බෑවුම්(ramp) දක්නට ඇත්තේ වි. අ. ඒකක අතළොස්සක පමණි. වි. අ. ඒකකවලින් පිටත, ප්‍රවේශ්‍යතාව පිළිබඳ සලකා බැලිය යුතු ප්‍රධාන ස්ථාන කිහිපයක් ඇත. එනම්, පන්තිකාමර, කොරිඩෝ, සාමාන්‍ය වැසිකිළි සහ පඩි පෙළ ඇතුළු ප්‍රධාන පාසල් පහසුකම් ය. මින් අදහස් වන්නේ වි. අ. ඒකක නොමැති ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වලින් 91.4% ක ඇත්තේ දුබලතා සහිත සිසුන්ට ප්‍රවේශ විය නොහැකි පරිසර බව ය[16].

### 3.3.2 ඵලදායී මැදිහත් වීම්

වත්මන් තත්ත්වය පිළිබඳ ඉහත හඳුනාගැනීම මත පදනම් ව, ව්‍යාපෘතිය මගින් "පාසල් යටිතල පහසුකම් සහ පාරිසරික විධිවිධාන පිළිබඳ මාර්ගෝපදේශය" සකස් කරනු ලැබීය. අන්තර්කරණ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ අදහසින් පාසල් පහසුකම් සහ උපකරණ වැඩිදියුණු කිරීමේ දී සැලසුම් කිරීමේ දී අත්‍යවශ්‍ය දෘෂ්ටිකෝණ එහි අන්තර්ගත වේ. මෙය **2024** ජනවාරි මාසයේ දී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් චක්‍රලේඛ අංක 02/2024 ලෙස නිකුත් කරන ලදී. මාර්ගෝපදේශය මගින් පහත කරුණු හතර කෙරෙහි විශේෂ අවධාරණය යොමු කරයි[17]:

- වි. අ. ඒකක පමණක් නොව, වි. අ. ඒකක සහිත ව හෝ රහිත ව මුළු පාසල් පරිසරය ම ප්‍රවේශ විය හැකි ලෙස සැලසුම් කිරීම අවශ්‍ය වේ:
- වි. අ. ඒකක පන්තිකාමරය වෙනම ගොඩනැගිල්ලක හෝ දුරස්ථ ස්ථානයක ස්ථාන ගත කරනවාට වඩා හැකිතාක් සාමාන්‍ය පාසල් සැකසුම් තුළ පිහිටා තිබීම අවශ්‍ය වේ;
- ඉවත් කළ යුතු අවහිරතා සහ බාධක සලකා බලන විට භෞතික පහසුකම් පමණක් නොව තොරතුරු සහ සන්නිවේදන පහසුකම් ද ඇතුළත් විම අවශ්‍ය වේ; සහ
- විවිධ ඉගෙනුම් අන්තර්ගත සහ පන්තියේ සිසුන් සංඛ්‍යාව වෙනස් කිරීම, කණ්ඩායම් ඉගැන්වීම, කණ්ඩායම් ඉගෙනීම, තනි පුද්ගල ඉගැන්වීම් සහ ඉගෙනුම් ප්‍රතිඵල ඉදිරිපත් කිරීම වැනි ආකෘති සඳහා නම්‍යශීලී ව ඉඩ සැලසෙන පරිදි පන්ති කාමර සැලසුම් කිරීම අවශ්‍ය වේ.

ඒ අනුව, පහත දැක්වෙන වැඩිදියුණු කිරීම්, ව්‍යාපෘතියේ නිර්දේශ මත නියමු පාසල් විසින් බොහෝ අවස්ථාවල දී පාසල් ප්‍රජාවගේ මූල්‍ය, ද්‍රව්‍යමය සහ ශ්‍රම සහයෝගය ඇතිව සාක්ෂාත් කර ගන්නා ලදී.



වි. අ. ඒකක ඉදිරිපිට ප්‍රවේශ මාර්ගය
(අලුත්වැඩියා කිරීමට පෙර)



වි. අ. ඒකක ඉදිරිපිට ප්‍රවේශ මාර්ගය
(අලුත්වැඩියා කිරීමට පසු)

---

[15] සත්‍ය වශයෙන් ම වි. අ. ඒකක සිසුන්ගේ සංවේදී සංවේදීතාව සහ අවධානය වෙනතකට යොමු වීමේ ප්‍රවණතාව නිසා ඔවුන් සඳහා නිහඬ පන්ති කාමර පරිසරයක් නිර්මාණය කිරීම සලකා බැලීම අවශ්‍ය නමුත් නියමු පාසල් අතර මෙම සංකල්පය සහ සලකා බැලීම නිරීක්ෂණය වී නොමැත.

[16] 2022 ජූනි මස වන විට රට පුරා පිහිටි රජයේ පාසල් 10,146 කින් වි. අ. ඒකක සහිත පාසල් 871 ක් ඇති අතර එයින් පෙන්නුම් කරන්නේ රජයේ පාසල්වලින් 8.6% වි. අ. ඒකක සහිත බවයි..

[17] **විශේෂතා සහ විස්තර සඳහා කරුණාකර මාර්ගෝපදේශය බලන්න.**



වැසිකිළිය ඉදිරිපිට ප්‍රවේශ මාර්ගය
(අලුත්වැඩියා කිරීමට පෙර)



වැසිකිළිය ඉදිරිපිට ප්‍රවේශ මාර්ගය
(අලුත්වැඩියා කිරීමට පසු)





වි. අ. ඒකක පන්ති කාමරය බෙදීමට රාක්ක සැකැස්ම

පාසල්වලට ප්‍රවේශ විය හැකිද නැද්ද යන්න දුබලතා සහිත සිසුන් සඳහා අතිශයින් ම වැදගත් කරුණකි, නමුත් "අන්තර්කරණය" යන්නෙහි අර්ථය වඩාත් පුළුල් ලෙස සලකා බැලීමේ දී, සාර්ව සැලැස්ම කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. එය දුබලතා සහිත පුද්ගලයන්ට පමණක් සීමා නොවී, ඔවුන් ද ඇතුළත් වන සේ පුළුල් පරාසයක අවශ්‍යතා ඇති පුද්ගලයින්ට හැකි උපරිමයෙන් භාවිත කිරීමට පහසු ආකාරයේ පරිසරයක් නිර්මාණය කිරීම පිළිබඳ සංකල්පයකි. එබැවින් මාර්ගෝපදේශ මාලාව පුළුල් ලෙස භාවිත කරමින් ක්‍රියාත්මක කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

රජය මගින් පාසල් සඳහා වෙන් කරන මූල්‍ය ප්‍රතිපාදන සෑම විටම සීමිත බැවින්, එවැනි විශේෂ අවශ්‍යතා සහිත දරුවන් පාසලට ඇතුළත් වන සෑම අවස්ථාවක ම මූලික පාසල් යටිතල පහසුකම් පිළිබඳ ව අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. නැතහොත් දිගු-කාලීන සැලැස්මක් හරහා ක්‍රම ක්‍රමයෙන් යාවත්කාලීන කිරීම අවශ්‍ය වේ. එබැවින් පාසල් මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමුඛතා අනුව වෙන් කර වියදම්/ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. එමෙන්ම, සමහර විකල්ප, ප්‍රතිසංස්කරණ හෝ උපකරණ සෑදීම සුළු මුදල් ප්‍රමාණයකින් සහ වෑයමකින් කළ හැකි බව ද සඳහන් කළ යුතු ය. මෙය පාසල්වල මූලපිරීම් මත රඳා පවතී. ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ ප්‍රායෝගික උදාහරණ එක් රැස් කිරීම සහ බෙදා ගැනීම, මෙතෙක් රට තුළ එතරම් උත්සාහ කර නොමැති නව මූලපිරීමක් නිසා පාසල් ප්‍රවේශ්‍යතා වැඩිදියුණු කිරීමේ අදහස් ව්‍යාප්ත කිරීමට ප්‍රයෝජනවත් පියවරක් වනු ඇත.

## 4 වන පරිච්ඡේදය - ගුරුවරුන්ගේ නිපුණතා සංවර්ධනය

මැදිහත් වීමේ තුන්වන කුළුණ වන්නේ "ගුරුවරුන්ගේ කුසලතා වර්ධනය" යි. මෙම කුළුණ සංරචක තුනකින් සමන්විත වේ: 1) "විශේෂ අධ්‍යාපන ඒකක ගුරුවරුන්ගේ නිපුණතා සංවර්ධනය", 2) "ප්‍රධාන ධාරාවේ ගුරුවරුන්ගේ නිපුණතා සංවර්ධනය" සහ 3)" ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ තුළ අන්තර්කරණ අධ්‍යාපනය ප්‍රධාන ප්‍රවණතාව ලෙස."

### 4.1 විශේෂ අධ්‍යාපන ඒකක ගුරුවරුන්ගේ නිපුණතා සංවර්ධනය

37/2020 චක්‍රලේඛයේ 4 වැනි වගන්තියේ විස්තර කර ඇති පරිදි, විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා පුද්ගල අවශ්‍යතා අනුව පාඩම් අවශ්‍ය වේ. අන්තර්කරණ අධ්‍යාපනය යනු විශේෂ අවශ්‍යතා ඇති සිසුන් ප්‍රධාන ධාරාවේ පන්තිවලට ඒකීකරණය කර අනුගත කිරීම නොවේ. අන්තර්කරණ අධ්‍යාපනය යනු විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ට නිසි සහයෝගයක් සහ සැකසුමක් ඇතිව ප්‍රධාන ධාරාවේ පන්තිවල ඉගෙනීම දිගටම කර ගෙන යා හැකි පාසල් පද්ධතියක් ලෙස ගොඩ නැගීම අවබෝධ කර ගැනීමට අවශ්‍ය වේ. ඒ අනුව, වි. අ. ඒකක යනු විශේෂ අවශ්‍යතා සහිත සෑම සිසුවෙකුට ම යෝග්‍ය ඉගෙනුම් ක්‍රමවේද ගුරුවරුන් සොයා ගන්නා අවකාශයක් වේ.

#### 4.1.1 වර්තමාන තත්ත්වය

<u>**පාඩම් පරිචය/පුහුණුව**</u>

SEU පාඩම් භාවිතයන්හි ප්‍රධාන වශයෙන් අභියෝග දෙකක් තිබේ

1. විවිධ අවශ්‍යතා සහිත සියලු ම සිසුන්ට ගුරුවරුන් එකම පැවරුම් ලබා දෙයි;
2. බොහෝ ඉගෙනුම්-ඉගැන්වීම් ආධාරක සංජානන/ශාස්ත්‍රීය කුසලතා වර්ධනය කිරීම සඳහා වේ.

පළමු කරුණ සලකන විට, බොහෝ වි. අ. ඒකක ගුරුවරුන් විවිධ ඉගෙනුම් මට්ටම් සහ විවිධ දුබලතා සහිත සිසුන් සමඟ බලවත් පරිශ්‍රමයක් දරමින් සිටියහ. 37/2020 චක්‍රලේඛයේ සඳහන් වන්නේ එක් එක් ශිෂ්‍යයාගේ ශාරීරික, මානසික සහ චිත්තවේගී තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් ඔහුගේ/ඇයගේ ඉගෙනුම් මට්ටම අනුව IEP අරමුණු සකස් කළ යුතු බවයි[18]. 33/2022 චක්‍රලේඛයට අනුව, අනුමත IEP වලට අනුකූලව සිසුන්ට ඉගැන්වීම අවශ්‍ය වේ[19]. විශේෂ අවශ්‍යතා සහිත සෑම සිසුවෙකුගේ ම ඉගෙනීම වර්ධනය කිරීම සහ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා පුද්ගල අවශ්‍යතාවලට අනුව පාඩම් ප්‍රතිචාර දැක්විය යුතු බව මෙහි පෙන්වා දී ඇත[20]. සෑම සිසුවෙකුගේ ම අවශ්‍යතා වෙනස් වුව ද, ගුරුවරුන් සියලු සිසුන්ට එකම වේලාවක කොලාජ් සහ වර්ණ ගැන්වීම වැනි සරල පැවරුම් ලබා දීමට නැඹුරු වෙති.

වි. අ. ඒකක තුළ පාඩම් භාවිතයන්හි දෙවන අභියෝගය වන්නේ අධ්‍යයන/ශාස්ත්‍රීය කුසලතා ගැන පමණක් අවධාරණය කිරීමයි. බොහෝ අවස්ථාවන්හි දී, වි. අ. ඒකකයෙන් ඒකීකරණය වූ සිසුන්, විශේෂයෙන් බුද්ධිමය දුබලතා සහිත, ප්‍රධාන ධාරාවේ පන්තිවලට සම්බන්ධ වීමේ දුෂ්කරතාවන්ට මුහුණ දෙති. ඇත්ත වශයෙන් ම, මෙයට හේතුව වන්නේ ඔවුන්ගේ සංවර්ධන අවධීන් සහ වේගයෙහි වෙනස්කම් ඇති බැවින් සාධාරණ ඉඩ හසර සැපයීමේ අවශ්‍යතාව සහ සූදානම් වීමේ පන්තියක් ලෙස වි. අ. ඒකක ස්ථාන ගත කිරීම සමාලෝචනය කිරීම

[18] 7.8 වගන්තිය, 37/2020 චක්‍රලේඛය

[19] 9.2 වගන්තිය, 37/2020 චක්‍රලේඛය

[20] 37/2020 චක්‍රලේඛයේ, 11 වැනි වගන්තියේ සඳහන් වන්නේ, "එකම බුද්ධි මට්ටමේ හෝ සංවර්ධන මට්ටමේ හෝ එකම දුබලතා වර්ගයේ දරුවන්ට වෙනම සැලසුම් තිබුණ ද, ඉගැන්වීමේ දී එකම පාඩමක් ගැළපෙන සේ සකස් කර ඉගැන්විය හැකිය." ලෙසය.

සාධාරණීකරණය කිරීමයි. 37/2020 චක්‍රලේඛයේ 7 වැනි වගන්තියේ දක්වා ඇති පරිදි, ප්‍රධාන ධාරාවේ පන්තිවලට ඇතුළත් වීමට පෙර, උපකාරයකින් තොරව ඉගෙන ගැනීමට නොහැකි දරුවන් සඳහා පෙර සූදානම් වීමේ කාල සීමාවක්/අවකාශයක් ලෙස වි. අ. ඒකක ස්ථාන ගත කර ඇත. ප්‍රධාන ධාරාවේ පන්තිවල SEN සහිත සිසුන් මුහුණ දෙන තවත් බාධාවක් වන්නේ ඔවුන්ගේ සංජානන නොවන කුසලතා (සමාජ සහ චිත්තවේගී කුසලතා) හි අසමතුලිත වර්ධනයයි. ශ්‍රී ලංකාවේ නව විෂය මාලා රාමුව තුළ ද හඳුන්වා දී ඇති ගෝලීය වශයෙන් පිළිගත් "21 වැනි සියවසේ නිපුණතා රාමුව", සාක්ෂරතා පදනම සහ අන්තර් පුද්ගල කුසලතා ලෙස කොටස් දෙකකට බෙදා ඇත. සංජානනය පමණක් නොව සමාජීය සහ චිත්තවේගී ලක්ෂණ මත රඳා පවතින කුසලතා පරාසයක් සිසුන්ට ලබා දීම සඳහා වෙනසක් ඇති කිරීම මෙහි අරමුණයි. SEN සහිත සිසුන්, ඔවුන්ගේ චර්යාත්මක ගැටලු හේතුවෙන් ප්‍රධාන ධාරාවේ පන්ති ගුරුවරුන් විසින් ප්‍රතික්ෂේප කර වි. අ. ඒකකය වෙත ආපසු යැවීම හෝ සමාජ/සන්නිවේදන කුසලතා නොමැතිකම හේතුවෙන් ඔවුන්ට පන්තිවලට නොගැළපීම සහ ඔවුන් පාසල් යාම නතර කිරීම සාමාන්‍යකරණය වී ඇත. වි. අ. ඒකකයෙහි පැවරුම් හෝ වැඩ ක්‍රියාත්මක වන්නේ ගුරුවරුන් සහ සිසුන් අතර පමණක් වන අතර සිසුන් අතර සීමිත අන්‍යෝන්‍ය ක්‍රියාකාරකම් පවතී.

**<u>පන්තිකාමර පරිසරය</u>**

33/2022 චක්‍රලේඛයේ 18 වැනි වගන්තියේ සඳහන් වන පරිදි, පාසල් පරිසරයේ වෙනස් කිරීම් එක් එක් ශිෂ්‍යයාගේ විවිධ ඉගෙනුම් විලාසයන්ට අනුගත ව සිදු කිරීම අවශ්‍ය වේ. වි. අ. ඒකක සලකන විට, විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ගේ අධ්‍යාපනය සඳහා සුදුසු ඉඩකඩ සහිත සහ ප්‍රසන්න ස්ථානයක් ලෙස වි. අ. ඒකක සකසා ගැනීමට පාසල් බලධාරීන් සහ ඉංජිනේරුවන් එක්ව කටයුතු කල යුතු වේ. වි. අ. ඒකක පන්ති කාමර පරිසරයන් විවිධාකාර වේ. වි. අ. ඒකකයෙහි ස්ථාන ගත කිරීම සහ ප්‍රවේශය සඳහා අවශ්‍ය පහසුකම් අංක 02/2024 චක්‍රලේඛයේ "පාසල් යටිතල පහසුකම් සහ පාරිසරික විධිවිධාන පිළිබඳ මාර්ගෝපදේශ" සොයා ගත හැකිය. 33/2022 චක්‍රලේඛයේ පාසල් පහසුකම් පිළිබඳ සඳහන් වන පරිදි, එක් එක් සිසුවෙකු සඳහා හඳුනාගත් ඉගෙනුම් ක්‍රමවේදයට අනුව ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදු කිරීම අවශ්‍ය වේ[21]. වි. අ. ඒකක පරිසරය සඳහා මූලික අවශ්‍යතාව වන්නේ විවිධ හැකියාවන් ඇති සිසුන්ගේ සුවිශේෂී අවශ්‍යතා සපුරාලීමට ගුරුවරුන් විසින් පාඩම් ඉගැන්වීමට හැකි වීමයි.[22]



සාම්ප්‍රදායික පාඩම් විලාසය සහ පන්ති පරිසරය

[21] 15 වගන්තිය, 33/2022 චක්‍රලේඛය

[22] 17 වගන්තිය, 33/2022 චක්‍රලේඛය

### 4.1.2 ඵලදායී මැදිහත් වීම්

පාසල් වෙත ගොස් වැඩමුළු පැවැත්වීම මගින් නියමු පාසල්වල වි. අ. ඒකක තුළ පාඩම් භාවිතයන් වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘතිය සෘජු ලෙස මැදිහත් වීම් කිහිපයක් සිදු කර ඇත.

**IEP**

IEP යනු ඒක පුද්ගල විශ්ලේෂණයක්, ඉලක්ක සැකසීමක් සහ ඉගැන්වීමේ ක්‍රම අවශ්‍ය වන දුබලතා සහිත තනි සිසුන් සඳහා උපදෙස් සැපයීම සඳහා සැලසුම් ලේඛනයකි. මෙම ව්‍යාපෘතිය විසින් නියමු වි. අ. ඒකකවල IEP සංවර්ධනය පිළිබඳ පහත පියවර සහ කරුණු හඳුන්වා දුන් අතර IEP භාවිත කිරීමට සහ යාවත්කාලීන කිරීමට වි. අ. ඒකක ගුරුවරුන්ට අඛණ්ඩව සහාය ලබා දී ඇත. විස්තර සඳහා, කරුණාකර උපග්‍රන්ථය III "IEP සකස් කිරීම සඳහා මෙවලම් කට්ටලය" වෙත යොමු වන්න.

- **තක්සේරුව**

IEP සංවර්ධනය කිරීමේ පළමු පියවර වන්නේ තක්සේරුවයි. නිපුණතා අනුව ශිෂ්‍යයාට කළ නොහැකි දේ සරල ව නිරීක්ෂණය කර විස්තර කරනවාට වඩා ශිෂ්‍යයාට කළ නොහැකි දේ සහ ශිෂ්‍යයාට කළ හැක්කේ කුමන ප්‍රමාණයට ද යන්න තේරුම් ගෙන වාර්තා කිරීම වැදගත් ය. ශිෂ්‍යයාට ඉගැන්වීමේ ක්‍රමය/පාඩම් සැලැස්ම සලකා බැලීමේ දී ඔහු/ඇය කැමති දේ සහ ඔහු/ඇය උනන්දුව ඇත්තේ කුමකට යන්න ප්‍රයෝජනවත් තොරතුරු වේ.

- **දිගු කාලීන අරමුණු සැකසීම**

එක් එක් IEP සඳහා විවිධ දිගු කාලීන අරමුණක් තිබීම අවශ්‍ය වේ, මන්ද එය පුද්ගලබද්ධ සැලැස්මක් වන අතර බුද්ධිමය දුබලතා සහිත සෑම සිසුවෙකුට ම සුවිශේෂී සංවර්ධන ගමන් මාර්ගයක් ඇත. කෙසේ වෙතත්, බොහෝ වි. අ. ඒකක ගුරුවරුන් සෑම වි. අ. ඒකක ශිෂ්‍යයෙකු සඳහා ම එක් දිගු කාලීන අරමුණක් තැබීමට නැඹුරු වන අතර එය "1 ශ්‍රේණියට ඒකීකරණය කිරීම" වේ[23]. මෙම හේතුව නිසා, ව්‍යාපෘතිය විසින් එක් එක් ශිෂ්‍යයාගේ වර්තමාන තත්ත්වය සැලකිල්ලට ගනිමින්, "1 ශ්‍රේණියට ඒකීකරණය කිරීම" අමතරව, සාක්ෂාත් කර ගත හැකි යැයි උපකල්පනය කරන තවත් දිගු කාලීන අරමුණක් තැබීමට නිර්දේශ කරන ලදී. කියවීම, ලිවීම, ගණිතය වැනි අධ්‍යයන කුසලතා ලබා ගැනීමේ අදියරේ තවමත් නොමැති බුද්ධිමය දුබලතා සහිත සිසුන් සඳහා සමාජ කුසලතා හෝ ජීවන කුසලතා වැනි සංජානන නොවන කුසලතා අරමුණු කර ගත යුතු ය.

- **කෙටි කාලීන අරමුණු සැකසීම**

දිගු කාලීන අරමුණ සපුරා ගැනීම සඳහා කෙටි කාලීන අරමුණු සකසා ඇත. කෙටි කාලීන අරමුණු සාක්ෂාත් කර ගත් විට දිගු කාලීන අරමුණු සාක්ෂාත් වන සේ කෙටි කාලීන අරමුණු නිර්මාණය කළ යුතු ය. සියලු ම නිපුණතා සඳහා කෙටි කාලීන ඉලක්ක අවශ්‍ය නොවන අතර ඉහළ ම ප්‍රමුඛතාව ඇති ක්ෂේත්‍ර සඳහා කෙටි කාලීන ඉලක්ක තැබීම අවශ්‍ය වේ. කෙටි කාලීන ඉලක්ක නිශ්චිත හා මැනිය හැකි ආකාරයෙන් සකස් කිරීමට අවශ්‍ය වේ. නිදසුනක් වශයෙන්, ඒවා ප්‍රකාශ කළ යුත්තේ "පූර්ව ගණිතමය කුසලතා වැඩි දියුණු කිරීම" වැනි වියුක්ත වචනවලින් නොව "ඇඟිලි ගණන් නොකර 10 දක්වා ගණන් කළ හැකි වීම" වැනි සංයුක්ත වචනවලින් ය.

[23] 7.1 වගන්තිය සහ 10.1 වගන්තිය, 37/2020 චක්‍රලේඛය, 12.1 වගන්තිය, 33/2022 චක්‍රලේඛය

අධ්‍යයන වාරයක් අවසන් වූ පසු, අත්පත් කර ගත් ප්‍රගතිය මත පදනම් ව ඊළඟ අධ්‍යයන වාරය සඳහා කෙටි කාලීන අරමුණු යාවත්කාලීන කිරීමට අවශ්‍ය වේ. මෙම ක්‍රියාවලිය නැවත කිරීමෙන් දිගු කාලීන අරමුණු සාක්ෂාත් කර ගත හැකිය. එබැවින් දිගු කාලීන හා කෙටි කාලීන අරමුණු සඳහා එකම කාල සීමාවක් වෙන් කිරීමෙන් වැළකෙන්න. නියමිත කාල සීමාව අවසන් වන විට කෙටි කාලීන අරමුණු සාක්ෂාත් කර නොගන්නේ නම්, එයට හේතු ලෙස අරමුණු තැබීම හෝ ඉගැන්වීමේ ක්‍රමය සුදුසු හෝ ප්‍රමාණවත් නොවීම මිස ඉලක්ක කර ගත් ශිෂ්‍යයාගේ වරදක් නොවන බව අර්ථ දැක්විය යුතුය. ඊළඟ අධ්‍යයන වාරය සඳහා ඉගැන්වීම වැඩිදියුණු කිරීම සඳහා මෙම විශ්ලේෂණය භාවිත කිරීම යෝග්‍ය වේ.

- **වාර සටහන් සහ පාඩම් සැලසුම්**

එක් එක් කෙටි කාලීන ඉලක්කය සඳහා වාර සටහන් සහ පාඩම් සැලසුම් නිර්මාණය කර ඇත .ඉලක්ක පුද්ගලීකරණය කර ඇති බැවින්, පාඩම් අන්තර්ගතය ද පුද්ගලීකරණය කිරීම වැළැක්විය නොහැකිය .කෙසේ වෙතත්, සිසුන් කිහිප දෙනෙකු එකම පන්තිකාමරයක ඉගෙන ගන්නා බැවින්, ගුරුවරුන්ට එකවර සිසුන් කිහිප දෙනෙකුට පුද්ගලාරෝපිත උපදෙස් ලබා දීම සඳහා ශිල්පීය කර්ම භාවිත කිරීමට අවශ්‍ය වේ. මෙය එක් එක් සිසුවා  සම්පූර්ණයෙන්ම හුදකලා කිරීමට නොවේ. නිදසුනක් වශයෙන්, ගණිත පාඩමක "වෙනස් හැඩ හඳුනා ගැනීම" සිදු කරන විට, සියලු සිසුන්ට විවිධ හැඩතලවල සංකල්පය සහ වර්ග පැහැදිලි කිරීමෙන් ආරම්භ කිරීම වඩාත් සුදුසු ය, ඉන් පසු සෑම සිසුවෙකුට ම ඔහුගේ හෝ ඇයගේ මට්ටමින් සම්පූර්ණ කිරීමට වෙනස් කාර්යයක් ලබා දෙන්න.

**<u>ඉගෙනුම්-ඉගැන්වීම් ආධාරක</u>**


විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ දී පුද්ගල වෙනස්කම්වලට ඉඩ සැලසීම අවශ්‍ය වේ. බොහෝ වි. අ. ඒකක ගුරුවරුන් තම සිසුන්ට සංජානන කුසලතා, සියුම් චාලක කුසලතා සහ ස්වයං-ආධාරක කුසලතා සඳහා සහය සපයන නමුත් කිහිප දෙනෙක් පමණක් සන්නිවේදන කුසලතා සහ සමාජ කුසලතා සඳහා ආධාර සපයයි. මෙය 1 ශ්‍රේණිය වෙත ඒකීකරණය කිරීම සඳහා වන අවශ්‍යතා තුළ කියවීම, ලිවීම සහ අංක ගණිතය අවධාරණය කිරීම නිසා විය හැක. මෙම පසුබිමට එරෙහිව, පහත සඳහන් කරුණු පිළිබඳ ව ගුරුවරුන්ට නව අදහස් ලබා දීමේ අරමුණින් ව්‍යාපෘතිය මගින් ඉගෙනුම්-ඉගැන්වීම් ආධාරක වැඩමුළු පවත්වා ඇත.

1) ඔවුන්ගේ පුද්ගල අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වන පුද්ගලීකරණය කළ පාඩම්
2) සංජානන නොවන කුසලතා කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් පාඩම් භාවිතය
3) සන්නිවේදන/සමාජ කුසලතා සඳහා උපකාරක උදාහරණ

වැඩමුළු මගින් සිසුන්ගේ පුද්ගල අවශ්‍යතා හෝ සංවර්ධන අවධීන් මත පදනම් ව උපදෙස් සැපයීම සඳහා සැලැස්මක් හෝ දැක්මක් සහිත ව, ඉගෙනුම්-ඉගැන්වීම් ආධාරක අරමුණු සහගත ව භාවිත කිරීමේ වැදගත්කම පිළිබඳ ව වි. අ. ඒකක ගුරුවරුන් දැනුවත් කරන ලදී. ව්‍යාපෘතිය මගින් හඳුන්වා දී ඇති ආධාරක "විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා  ඉගෙනුම්-ඉගැන්වීම් ආධාරක එකතුව" නම් වූ පොත් පිංචක සවිස්තරාත්මක විස්තර සහ රූප සහිත ව සම්පාදනය කර ඇත.[24]


[24] NIE වෙබ් අඩවිය https://sites.google.com/nie.edu.lk/special-needs-education/home

**<u>පන්ති කාමර පරිසරය</u>**



**රූප සටහන 6**: වේදිකා ශෛලිය

පුද්ගලාරෝපිත පාඩම් සඳහා, ගුරුවරුන් සාම්ප්‍රදායික වේදිකා ශෛලියේ මේස සැකැස්මට වඩා, තම සිසුන්ට සමීප වීමට ඉඩ සලසන මේස සැකැස්මක් අවශ්‍ය වේ. ඒ අතරම, සිසුන් අතර ස්වයං සිද්ධ සන්නිවේදනය ප්‍රවර්ධනය කිරීම සඳහා කණ්ඩායම් ක්‍රියාකාරකම් වැදගත් වන අතර එමගින් වි. අ. ඒකක සිසුන්ට තීරණාත්මක වන සන්නිවේදන / සමාජ කුසලතා වර්ධනය වේ.





**රූප සටහන 7**: U-හැඩයේ මේස සැකැස්ම

මෙම විවිධ ඉගෙනුම් තත්ව ආමන්ත්‍රණය කිරීම සඳහා, පවතින තත්ව තුළ සිසුන් සඳහා පන්තිකාමර පරිසරය වැඩිදියුණු කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව ව්‍යාපෘතිය SEU ගුරුවරුන්ට උපදෙස් දී ඇත. U-හැඩයේ මේස සැකැස්ම තනි තනි පාඩම් සඳහා වඩාත් සුදුසු වේ. වේදිකා ශෛලියේ දී, මේස අතර ඇති පටු ඉඩ නිසා එක් එක් ශිෂ්‍යයා වෙත ළඟා වීම සහ පරීක්ෂා කිරීම අපහසු වේ. කමිටු මණ්ඩල කාමර ශෛලිය කණ්ඩායම් වැඩ සඳහා සුදුසු වන නමුත් සිසුන් අතර අන්‍යෝන්‍ය මැදිහත් වීම් සිදු වීමේ හැකියාව හේතුවෙන් පුද්ගලබද්ධ ක්‍රියාකාරකම් සඳහා සුදුසු නොවේ. ඒ අනුව, පන්තිකාමරයේ මේස සැකැස්ම, ඉගෙනුම් අන්තර්ගතයේ සහ විලාසයේ වෙනස්කම්වලට අනුගත වන සේ නම්‍යශීලී වන පරිදි සැලසුම් කිරීමට අවශ්‍ය වේ. සිසුන් සඳහා මේස/පුටු ගැන අමුතුවෙන් කිව යුතු නැත, නමුත් ගුරුවරුන් සඳහා මේස/කොට බිත්ති සැහැල්ලු සහ එහා-මෙහා කළ හැකි විය යුතු අතර ස්ථාවර නොවිය යුතු ය.

ව්‍යාපෘති ක්‍රියාකාරකම් හරහා, විශේෂ අවශ්‍යතා සහිත සෑම සිසුවෙකුගේ ම කුසලතා වැඩි දියුණු කිරීම සඳහා පුද්ගලබද්ධ ඉගෙනීම ද අවශ්‍ය බව වි. අ. ඒකක ගුරුවරුන් පැහැදිලිව හඳුනාගත්හ. විශේෂයෙන්ම, IEP ක්‍රියාත්මක කිරීම වි. අ. ඒකක ගුරුවරුන්ට තනි තනි සිසුන්ගේ ඉගෙනුම් තත්ත්වය ග්‍රහණය කර ගැනීමටත්, ඒ අනුව තනි පාඩම් පැවැත්වීමටත්, ඔවුන්ගේ ඉගැන්වීමේ විලාසය සඳහා වඩා හොඳ පන්ති පරිසරයක් නිර්මාණය කිරීමටත් උපකාර විය. විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා වි. අ. ඒකකයෙහි දැනට නොමැති සංජානන නොවන කුසලතා, විශේෂයෙන් සන්නිවේදන සහ සමාජ කුසලතා වර්ධනය කිරීමේ වැදගත්කම ද වි. අ. ඒකක ගුරුවරුන් හඳුනා ගෙන ඇත.

මෙම සොයා ගැනීම් මත පදනම් ව, සිසුන්ගේ පුද්ගල අවශ්‍යතා/ සංවර්ධන අවධීන් අනුව සිසුන්ගේ ඉගෙනීම වැඩිදියුණු කිරීම සඳහා සැලැස්මක් හෝ දැක්මක් ඇතිව ඉගෙනුම්-ඉගැන්වීම් ආධාරක අරමුණු සහගත ලෙස භාවිත කිරීම පිළිබඳ නව අදහසක් ගුරුවරුන් විසින් ලබා ගන්නා ලදී.

## 4.2 ප්‍රධාන ධාරාවේ ගුරුවරුන්ගේ නිපුණතා සංවර්ධනය

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනික සන්දර්භය තුළ, යහපත් අන්තර්කරණ අධ්‍යාපනය ප්‍රගුණ කිරීමට වැදගත් කරුණු දෙකක් තිබේ; (1) හොඳ පන්තිකාමර පරිසරයක් සහ (2) පන්තියක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ගුරුවරයාගේ සලකා බැලීම යන කරුණු ය. පන්තියක ගුරුවරුන් හා සිසුන් අතර සහ සිසුන් අතර හොඳ පරිසරයක් සහ වාතාවරණයක් ඇති විට, හොඳ අන්තර්කරණ අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීම වඩාත් පහසු වේ. මීට අමතරව, පන්තිය/පාඩම අතරතුර සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය පිළිබඳ ව ගුරුවරයා හොඳින් සලකා බැලීම ද හොඳ අන්තර්කරණ අධ්‍යාපනයක් ස්ථාපිත කිරීම සඳහා සැලකිය යුතු ලෙස අවශ්‍ය වේ. ඉහත කරුණු දෙක 2-1 වගුවේ දැක්වෙන පරිදි විශේෂිත අංග කිහිපයකට බෙදිය හැකිය. ඇත්ත වශයෙන් ම, මෙම අංගයන් ශ්‍රී ලංකාව තුළ අලුතින් හඳුන්වා දෙන ඉගෙනීම සඳහා සාර්ව සැලැස්ම / Universal Design for Learning (UDL) හැඩගැසීමේ උපාංග ලෙස හැඳින්විය හැකිය.

**වගුව 2**: ශ්‍රී ලංකාව තුළ ඵලදායී අන්තර්කරණ අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීම සඳහා වැදගත් අංග

| වැදගත් කරුණු | සැලකිය යුතු අංශ |
|---|---|
| (1) හොඳ පන්ති කාමර පරිසරය  | (1-1) කණ්ඩායම තුළ විවිධත්වය මත පදනම් වූ සහෝදරත්වය |
| | (1-1) අන්‍යෝන්‍ය සබඳතාව |
| | (1-2) සුව පහසු පන්තිකාමරය |
| (2) පන්තිය/පාඩම ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරයාගේ සලකා බැලීම  | (2-1) ගුරුවරයාගේ විෂය දැනුම සහ ඉගැන්වීමේ ක්‍රම |
| | (2-2) සිසුන්ගේ ඉගෙනීම සහ අවබෝධය සම්බන්ධයෙන් ගුරුවරයාගේ ආකල්පය |
| | (2-3) ඉගෙන ගන්නා සහ එකිනෙකා සමඟ සන්නිවේදනය කරන පන්තියක් |
| | (2-4) සිසුන්ට සාධනය සහ ඉටු වීම පිළිබඳ තෘප්තිය ලබා දෙන පන්තියක් |
| | (2-5) සාධාරණ ඉඩ හසර |

### 4.2.1 වර්තමාන තත්ත්වය

<u>**පන්ති කාමර පරිසරය**</u>

ශ්‍රී ලංකාවේ, ප්‍රධාන ධාරාවේ පන්තිවල පරිසරය තරමක් යහපත් වන්නේ බොහෝ ගුරුවරුන්, සිසුන් කණ්ඩායම තුළ විවිධත්වය පිළිගෙන ඔවුන් අතර අන්‍යෝන්‍ය සබඳතාවක් ගොඩ නගන බැවිනි, නමුත් තවමත් ප්‍රදේශය සහ පාසල් මත රඳා පවතින සැලකිය යුතු පරතරයක් පවතී. නිදසුනක් වශයෙන්, ADHD, ශ්‍රවණ ඌනතා හෝ ශාරීරික දුබලතා සහිත සිසුන් වැනි විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් සිටින අතර, ගුරුවරුන් ඔවුන් සඳහා පන්ති කාමරයේ විශේෂ අසුන් ලබා දෙයි (උදා: ඔවුන්ගේ ඉගෙනීමේ තත්වයන් නිරීක්ෂණය කිරීම සහ අවශ්‍ය විට ඔවුන්ට උපකාර කිරීමට පහසු නිසා ගුරුවරයාගේ මේසය අසල ඇති අසුන). මීට අමතරව, ඔවුන්ට යමෙකුගේ ශාරීරික සහාය අවශ්‍ය වූ විට ඔවුන්ට උපකාර කිරීමට ගුරුවරයා සිසුන් කිහිප දෙනෙකු පවරයි (උදා: වැසිකිළියට යාම සහ කඩදාසිවල සමහර දෑ ලිවීම).





විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යයෙකු සහ සාමාන්‍ය ශිෂ්‍යයෙකු අතර සහයෝගිතාව අවශ්‍ය විට දී ස්වාභාවික ව ඇති වේ.

ගුරුවරුන් එය පන්තියේ සියලු ම සිසුන් සමඟ බෙදා ගන්නේ ඔවුන් සියල්ලන් හා සමාන ලෙස සලකමින් වුව ද, සමහර අවස්ථාවල දී අනෙක් සියල්ලන්ට වඩා ඔවුන්ට ටිකක් වැඩි සහයෝගයක් අවශ්‍ය වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, කණ්ඩායම තුළ විවිධත්වය මත පදනම් වූ සහෝදරත්වය ස්ථිරව තහවුරු වන අතර පන්තිය තුළ ද අන්‍යෝන්‍ය සබඳතා ගොඩනැගේ. එබැවින්, විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා පමණක් නොව අනෙකුත් සියලු ම සිසුන් සඳහා ද සුවපහසු පන්තිකාමර බිහි වේ.

**<u>පන්තියක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ගුරුවරයාගේ සලකා බැලීම</u>**

සිසුන්ගේ ඉගෙනීම සහ අවබෝධය, එකිනෙකා සමඟ සහයෝගීව ඉගෙන ගන්නා සහ සන්නිවේදනය කරන පන්තියක් පිහිටුවීම (සහයෝගී ඉගෙනීම), සිසුන්ට ජයග්‍රහණය සහ තෘප්තිය පිළිබඳ හැඟීමක් ලබා දෙන ආකාරයේ පන්තියක් නිර්මාණය කිරීම සම්බන්ධයෙන් ගුරුවරයාගේ ආකල්පය තවමත් දුර්වල බැවින් එම සංකල්ප වැඩිදියුණු කිරීමට තවමත් ඉඩ තිබේ. සිසුන්ගේ ඉගෙනීම සහ අවබෝධය සම්බන්ධයෙන් ගුරුවරයාගේ ආකල්පය සලකන විට සාමාන්‍යයෙන් බොහෝ ගුරුවරුන් සිසුන්ගේ අවබෝධ කර ගැනීමේ මට්ටම පොදුවේ මුළු පන්තියක් ලෙස හඳුනා ගන්නා නමුත් තනි තනි සිසුවාගේ මට්ටමින් හඳුනා ගැනීම ඉතා අවම වේ. එබැවින් උපකාර ඉල්ලා සිටින සිසුන් සහ උපකාර අවශ්‍ය සිසුන්ට කාලෝචිත ලෙස සහාය වීමට ගුරුවරුන්ට නොහැකිය.



උපකාර අවශ්‍ය ශිෂ්‍යයෙක් ගුරුවරයා දෙස බලයි.

ඉගෙන ගනිමින් සහ එකිනෙකා සමඟ සන්නිවේදනය කරන පන්තියක් පිහිටුවීම සඳහා (සහයෝගී ඉගෙනීම), බොහෝ ගුරුවරුන් විශාල කණ්ඩායම් (සිසුන් හය සිට අට දක්වා) සංවිධානය කරයි. මෙවැනි විශාල කණ්ඩායමක් තුළ, සාමාන්‍යයෙන් සිසුන් කිහිප දෙනෙකු පමණක් කාර්යයට සම්බන්ධ වන අතර අනෙක් සිසුන් කිසිවක් නොකර ක්‍රියාශීලී ශිෂ්‍යයෙකු කරන්නේ කුමක් දැයි බලා සිටිති. මෙය අනෙකුත් සිසුන් සඳහා සැබෑ ඉගෙනීමක් නොවේ.



විශාල කණ්ඩායමක (සිසුන් 8), සිසුන් කිහිප දෙනෙකු ක්‍රියාකාරකම සමඟ කටයුතු කරන අතර අනෙක් සිසුන් කිසිවක් නොකරයි

සිසුන්ට ජයග්‍රහණය සහ තෘප්තිය පිළිබඳ හැඟීමක් ලබා දෙන පන්තියක් නිර්මාණය කිරීමේ දී, ගුරුවරුන් සාමාන්‍යයෙන් හොඳින් ඉගෙන ගන්නා සිසුන් කෙරෙහි අවධානය යොමු කරයි. ප්‍රශ්නවලට පිළිතුරු දීමට සහ තම අදහස් ඉදිරිපත් කිරීමට ගුරුවරයා විසින් සෑම විටම හොඳ සිසුන් තෝරා දෙනු ලැබේ. එනම්, විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සහ හොඳින් ඉගෙන නොගන්නා සිසුන් සෑම විටම පන්ති අතරතුර ගුරුවරයා විසින් නොසලකා හරිනු ලැබේ. මෙම තත්වය යටතේ, සියලු ම සිසුන්ට පන්තියෙන් පසු ජයග්‍රහණ සහ තෘප්තිමත් හැඟීම් ඇති විය නොහැක.

### 4.2.2 ඵලදායී මැදිහත් වීම්

මෙම ව්‍යාපෘතිය තෝරා ගත් සියලු ම නියමු පාසල් වෙත ගොස් විශේෂ අවශ්‍යතා සහිත සිසුන් ඉගෙන ගන්නා ප්‍රධාන ධාරාවේ පන්තිවල, පන්ති භාවිතයන් නිරීක්ෂණය කර ඇත. පන්ති නිරීක්ෂණයේ දී, ව්‍යාපෘතිය මගින් යහපත් අන්තර්කරණ අධ්‍යාපනයක් ක්‍රියාත්මක කිරීම සඳහා ඉහත සඳහන් කළ අංග අට තහවුරු කරන ලද අතර, ශ්‍රී ලංකාවේ ගුරුවරුන් විශේෂයෙන් දුර්වල වන අංග තුන පිළිබඳ ව විශ්ලේෂණය කරන ලදී: සිසුන්ගේ ඉගෙනීම සහ අවබෝධය පිළිබඳ ගුරුවරයාගේ ආකල්පය, එකිනෙකා අතර ඉගෙන ගන්නා සහ සන්නිවේදනය කරන පන්තියක් පිහිටුවීම, සහ සිසුන්ට සාධනය සහ තෘප්තිය පිළිබඳ හැඟීමක් ලබා දෙන පන්තියක් නිර්මාණය කිරීම යි.

විශේෂයෙන්, පන්තිය නිරීක්ෂණය කිරීමෙන් පසුව, ව්‍යාපෘතිය විසින් විශේෂ අවශ්‍යතා සහිත සිසුන් පන්තියේ ආරම්භයේ සිට අවසානය දක්වා ඉගෙන ගන්නා දේ අනුගමනය කරන දළ පින්තූර නිදර්ශකයක් නිර්මාණය කරන ලදී. ඉන් පසුව ව්‍යාපෘතිය මෙම පින්තූර නිදර්ශකය පන්තිය තුළ ඔවුන්ගේ සැබෑ ඉගෙනීම අවබෝධ කර ගැනීමට ගුරුවරයා, විදුහල්පතිවරයා සහ IE සම්බන්ධීකාරක සමඟ බෙදා ගත්තේය. පන්තිය අතරතුර එක් එක් සිසුන්ගේ සවිස්තරාත්මක ඉගෙනුම් තත්ත්වය පන්තිය මෙහෙයවන ගුරුවරයාට ක්ෂණිකව ග්‍රහණය කර

ගැනීමට අපහසු වූ බැවින්, පන්ති නිරීක්ෂකයින් හරහා මෙම තොරතුරු ලබා දීමෙන් ගුරුවරයාට ඔහුගේ/ඇයගේ ම පන්තිය, විශේෂයෙන් කුමන සිසුවා පන්තියේ ඉගෙන ගෙන ඇත්තේ කොපමණ ද යන්න තේරුම් ගැනීමට හැකි විය.



1. මුලදී, කුමක් කළ යුතුද යන්න ගැන ඇය මදක් ව්‍යාකූල වූවාය



2. කෙසේ වෙතත්, කළ යුතු දේ දැනගත් විට ඇය අවධානයෙන් පාඩම් කිරීමට පටන් ගත්තාය.



3. ඇය තම කණ්ඩායමේ අනෙකුත් සිසුන් සමඟ ක්‍රියාකාරී ව කතා කළාය



4. සිසුන් අතර ඇවිද යන විට අකුර නිවැරදිව ලිවීමට ගුරුවරයා ද උදව් කළා ය



5. මුළු පන්තිය ම සමඟ උච්චාරණ පුහුණුව අතරතුර, ගුරුවරිය වචන උච්චාරණය කිරීම සඳහා ඇගේ තොල් බොහෝ චලනය කළ නිසා එය කිරීමට පහසු විය.



6. අවසානයේ දී, ගුරුවරිය සිසුවිය වචන නිවැරදිව උච්චාරණය කරනවා ද නැද්ද යන්න තහවුරු කළා ය.

**රූප සටහන** 8: ශිෂ්‍යයෙකුගේ පන්තිය අතරතුර ඉගෙනීම දැක්වීම සඳහා පින්තූර නිදර්ශක උදාහරණයක්

මීට අමතර ව, 37/2020 චක්‍රලේඛයේ අන්තර්කරණ අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී මෙවලමක් ලෙස UDL පැහැදිලි ව හඳුන්වා දී ඇති බැවින්, ව්‍යාපෘතිය විසින් UDL දෘෂ්ටි කෝණයෙන් එවැනි අංශ තුනක් වැඩිදියුණු කිරීම සඳහා ගුරුවරුන්ට ප්‍රයෝජනවත් ඉඟි ලබා දුන්නේය[25]. උදාහරණයක් ලෙස, සිසුන්ගේ ඉගෙනීම සහ අවබෝධය සම්බන්ධයෙන් ගුරුවරයාගේ ආකල්පය වැඩිදියුණු කිරීම සඳහා, "එක් උපදෙස් සහ එක් ක්‍රියාවක්", "තනි තනිව ප්‍රතිපෝෂණ සැපයීම", "පරීක්ෂා කිරීමට කාලය වෙන් කරන්න" සහ "කියවීමට සහ ලිවීමට සහාය" (රූපය 2-3 හි ②, ④, ⑦ සහ ⑩) යන විශේෂිත ක්‍රියා ඉතා වැදගත් වේ. සිසුන්ගේ ඉගෙනීම සහ එකිනෙකා සමඟ සන්නිවේදනය වැඩිදියුණු කිරීම සඳහා, "සම වයසේ මිතුරන්ගේ සහායක පද්ධතියක් ස්ථාපිත කිරීම" සහ "දක්ෂ සිසුන් සංවර්ධනය කිරීම" (රූපය 2-3 හි ⑥ සහ ⑨) සැලකිය යුතු ලෙස වැදගත් තවත් විශේෂිත ක්‍රියාවන් වේ. තවද, සිසුන්ගේ ජයග්‍රහණ සහ තෘප්තිය පිළිබඳ හැඟීම වැඩි දියුණු කිරීම සඳහා, "පාඩම අතරතුර හිඩැස් තැන් නොතබන්න", "සෑම සිසුවෙක් ම දැනුවත් කරන්න" සහ "ප්‍රමාණවත් තරම් ඉගෙනුම් ද්‍රව්‍ය, වේලාව සහ ස්ථානය සූදානම් කරන්න" (රූප සටහන 2-3 හි ①, ⑤ සහ ⑧) යන ක්‍රියාවන් ද සැලකිය යුතු ලෙස අවශ්‍ය වේ. වැඩි විස්තර සඳහා කරුණාකර උප ග්‍රන්ථය IV "UDL පුහුණු කිරීම සඳහා මෙවලම් කට්ටලය" බලන්න

[25] 24 වගන්තිය, 37/2020 චක්‍රලේඛය



හොඳ පන්ති කාමර පරිසරයක්



පන්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ගුරුවරයාගේ සලකා බැලීම

**ඉගෙනීම පිළිබඳ සාර්ව සැලැස්ම**
**Universal Design for Learning (UDL)**

**1 වන මූලධර්මය: විවිධ ප්‍රකාශන ක්‍රම සැපයීම**
**2 වන මූලධර්මය: විවිධ ක්‍රියාකාරකම් සහ චිත්තවේගීය ප්‍රකාශන මාධ්‍යයන් සැපයීම**
**3 වන මූලධර්මය: සහභාගී වීමට විවිධ මාර්ග ලබා දෙයි**

**විශේෂිත ක්‍රියා :**

① පාඩම අතරතුර හිඩැස් නොතබන්න
② එක් උපදෙසක් සහ එක් ක්‍රියාවක්
③ පන්තිය තුළ රීතියක් තීරණය කරන්න
④ තනි තනිව ප්‍රතිපෝෂණ සපයන්න
⑤ සෑම සිසුවෙක් ම දැනුවත් කරන්න
⑥ සම වයසේ සහායක පද්ධතියක් ස්ථාපිත කරන්න
⑦ පරීක්ෂා කිරීමට කාලය වෙන් කරන්න
⑧ ප්‍රමාණවත් ඉගෙනුම් ද්‍රව්‍ය, කාලය සහ ස්ථාන සකස් කරන්න
⑨ ඉහළම සිසුන් සංවර්ධනය කරන්න
⑩ කියවීම සහ ලිවීම සඳහා සහාය වන්න

**රූප සටහන 9**: හොඳ අන්තර්කරණ අධ්‍යාපනය සහ UDL අතර සම්බන්ධය

මෙම ප්‍රයත්නයන් ක්‍රමානුකූලව අඛණ්ඩව කර ගෙන යාමෙන්, පන්තිය අතරතුර එක් එක් සිසුන්ගේ ඉගෙනීමේ තත්ත්වය දැකීම/නිරීක්ෂණය කෙතරම් වැදගත් දැයි ගුරුවරුන්ට ක්‍රම ක්‍රමයෙන් හඳුනා ගත හැකි වූ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන්, බොහෝ ගුරුවරුන් හැකි තාක් තනි තනිව සිසුන්ගේ ඉගෙනීම දැකීමට උත්සාහ කිරීමේ ආකල්පය වර්ධනය කර ගත්හ. එවැනි ක්‍රියාශීලී ආකල්පයක් වර්ධනය කළ පසු, ඉගැන්වීම් භාවිතයේ ගුණාත්මක භාවය, විශේෂයෙන්ම ඵලදායී අන්තර්කරණ අධ්‍යාපනයේ භාවිතය විශාල වශයෙන් වෙනස් විය.

ව්‍යාපෘති ක්‍රියාකාරකම් හරහා ශ්‍රී ලාංකේය ගුරුවරුන්ට දියුණු වීමට ඉඩකඩ තිබෙන අංශ තුන විශාල ලෙස වැඩිදියුණු වී ඇත. ප්‍රදේශය, පාසල සහ ගුරුවරයා අනුව වැඩිදියුණු වීමේ ප්‍රමාණය වෙනස් වුවද, එය ව්‍යාපෘතිය ආරම්භ කළ කාලයට වඩා බෙහෙවින් යහපත් යැයි සැලකේ.



විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ට ගුරුවරයා නියමිත වේලාවට උපකාර කරයි.

පළමුව, බොහෝ ගුරුවරුන් පාඩම අතරතුර එක් එක් සිසුන්ගේ ඉගෙනුම් තත්ත්වය හැකිතාක් නිරීක්ෂණය කිරීමට උපරිමයෙන් උත්සාහ කර තිබේ. ගුරුවරුන් විශේෂයෙන්ම සාමාන්‍ය සිසුන්ට වඩා විශේෂ අවශ්‍යතා සහිත සිසුන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට පටන් ගත් අතර, පසුගිය කාලයේ ගුරුවරුන් ඔවුන් කෙරෙහි එතරම් අවධානයක් යොමු නොකළ තත්ත්වය මේ වන විට බොහෝ සෙයින් වෙනස් වී ඇත. මීට අමතරව, මෙය සිදු කිරීමෙන්, පන්තියේ දී විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ගේ අවශ්‍යතා මොනවාදැයි ගුරුවරුන් ක්‍රමානුකූලව අවබෝධ කර ගෙන ඇති අතර, ඔවුන්ට අවශ්‍ය ඉගෙනුම් සහාය නියමිත වේලාවට ලබා දීමට ඔවුන්ට හැකි වේ.

දෙවනුව, බොහෝ ගුරුවරුන් සිසුන් හතර දෙනෙකු සිටින කුඩා කණ්ඩායම් සංවිධානය කිරීමට උත්සාහ කරති. මෙය සිදු කිරීමෙන්, සෑම කණ්ඩායමක ම සිසුන්ට වඩාත් ක්‍රියාශීලී ව සන්නිවේදනය කළ හැකි අතර කාර්යය විසඳීම සඳහා එකට සහයෝගයෙන් කටයුතු කිරීමට පහසු විය.

අවසාන වශයෙන්, බොහෝ ගුරුවරුන් එක් එක් සිසුවාගේ ඉගෙනුම් තත්ත්වය වඩාත් පැහැදිලිව නිරීක්ෂණය කිරීමට සහ ඔවුන්ට සුදුසු ඉගෙනුම් සහාය ලබා දීමට සමත් විය. ගුරුවරුන්ගේ එවැනි වැඩිදියුණු කළ ආකල්ප තුළින්, එක් එක් සිසුන්ට වැඩි ඉගෙනුම් අන්තර්ගතයන් අවබෝධ කර ගැනීමටත්, පන්තියේ ක්‍රියාකාරකම් හා පාඩම් වැඩවලින් වැඩි තෘප්තියක් ලැබීමටත් හැකි විය.

## 4.3 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ තුළ අන්තර්කරණ අධ්‍යාපනය ප්‍රධාන ප්‍රවණතාව ලෙස

අන්තර්කරණ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා ගුරු අධ්‍යාපනයේ ප්‍රධාන ධාරාව තුළ අන්තර්කරණ අධ්‍යාපනය අත්‍යවශ්‍ය වේ. නියමු පාසල්වල ගුරුවරුන් ඉලක්ක කර ගත් ක්‍රියාකාරකම්වලට අමතරව, මෙම ව්‍යාපෘතිය ගුරු පුහුණු ආයතන වෙත ළඟා වීමේ ප්‍රයත්නයේ කොටසක් ලෙස තෝරා ගත් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල (NCoEs) කථිකාචාර්යවරයන්ට ද සහාය ලබා දෙන ලදී.

### 4.3.1 වර්තමාන තත්ත්වය

1965 දී, දෙවසරක පුහුණුව (සේවාව තුළ) සඳහා ගුරු පුහුණු විද්‍යාල විසිපහක් පිහිටුවන ලදී. 1985 න් පසු මෙම ආයතන, තෙවසරක පූර්ව සේවා පුහුණුව ලබා දෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ (NCoEs) විසින් ක්‍රම ක්‍රමයෙන් ප්‍රතිස්ථාපනය කරන ලදී. 2019 නිකුත් කරන ලද රජයේ ගැසට් පත්‍රයට[26] අනුව දැනට NCoE 19 ක් පවතින අතර භාෂා මාධ්‍ය තුනකින් (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි) පාඨමාලා 23 ක් ඇත. විශේෂ අධ්‍යාපන පාඨමාලාව, මෙම පාඨමාලා 23න් එකක් වන අතර, එය දැනට විද්‍යාපීඨ හතරක එනම්, හාපිටිගම සහ මහරගම විද්‍යාපීඨවල සිංහල මාධ්‍යයෙන් ද, අඩලච්චේන සහ යාපනය විද්‍යාපීඨවල දෙමළ මාධ්‍යයෙන් ද ක්‍රියාත්මක වේ. 2008 දී, ජාතික අධ්‍යාපන ආයතනය (NIE)[27] විසින් සකස් කරන ලද විෂය නිර්දේශය යටතේ සියලු ම NCoE වල ප්‍රාථමික අධ්‍යාපන පාඨමාලාවල "විශේෂ අධ්‍යාපනය" විෂය අනිවාර්ය කර ඇති බව වාර්තා විය. කෙසේ වෙතත්, මෙය ප්‍රායෝගික ව සිදු නොවන බව ව්‍යාපෘතිය විසින් 2021 වර්ෂයේ දී අනාවරණය කර ගන්නා ලදී.

### 4.3.2 ඵලදායී මැදිහත් වීම්

තෝරා ගත් **NCoEs** සඳහා අන්තර්කරණ අධ්‍යාපන සංකල්පය සහ ක්‍රමවේදය ප්‍රධාන ප්‍රවණතාව ලෙස හඳුන්වා දීමට දෙදින සම්මන්ත්‍රණයක් සැලසුම් කරන ලදී. නුදුරේ දීම අනිවාර්ය විෂයයක් ලෙස **NCoEs** විෂය මාලාවට අන්තර්කරණ අධ්‍යාපනය ඇතුළත් වන සේ නව විෂය මාලාවක් සංවර්ධනය කිරීමට හොඳින් සූදානම් වීම ද එහි එක් අරමුණකි. එසේම, මෙම සම්මන්ත්‍රණය හරහා **NCoE** හි කථිකාචාර්යවරුන් අන්තර්කරණ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ දී ඔවුන්ගේ කාර්යභාරය අවබෝධ කර ගැනීම සහ පාසල්වල අන්තර්කරණ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රායෝගික ක්‍රම කිහිපයක් ඉගෙන ගැනීම ව්‍යාපෘතියේ අපේක්ෂාව විය.

භූගෝලීය සහ වාර්ගික සමතුලිතතාව සැලකිල්ලට ගනිමින්, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ හතරක් තෝරා ගන්නා ලදී, එනම් වයඹ පළාතේ වයඹ (සිංහල මාධ්‍යය), බස්නාහිර පළාතේ මහරගම (සිංහල මාධ්‍යය), මධ්‍යම පළාතේ මහවැලි (සිංහල මාධ්‍යය) සහ උතුරු පළාතේ යාපනය (දෙමළ මාධ්‍යය) ලෙස ය. සම්මන්ත්‍රණය සඳහා **NCoE** හි පීඨාධිපති, කළමනාකරණ කාර්ය මණ්ඩලය සහ සියලු ම විෂය කථිකාචාර්යවරු සහභාගී විය. කථිකාචාර්යවරුන් බහුතරයකට දුබලතා සහිත දරුවන් සමඟ සම්බන්ධ වීමේ අත්දැකීම් ඉතා අඩු බවත්, ඒ නිසා දුබලතා සහිත දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳ දැනුම අඩු බවත් උපකල්පනය කරන ලදී.

සහභාගිවන්නන්ට අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ පුළුල් අවබෝධයක් සහ දැනුමක් ලබා දීමේ අරමුණින් ව්‍යාපෘතිය විසින් සැසි දහයකින් සමන්විත වැඩසටහනක් සකස් කරන ලදී. දේශන, කණ්ඩායම් සාකච්ඡා, ඉදිරිපත් කිරීම් සහ ප්‍රත්‍යවේක්ෂණ එකතුවක් හරහා සහභාගිවන්නන්ගේ අවබෝධය ගැඹුරු කිරීම එහි අරමුණ විය.

---

26 ශ්‍රී ලංකා රජය (2020) I කොටස: (II අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය-2020.09.04. 1241-1280 පිටු

27 Furuta H. and Sethunga. P. (2003) Special education introduced in the National Colleges of Education (NCoEs) towards inclusive education in Sri Lanka. Bulletin of the Faculty of Education, Kumamoto University, 57, 167-174.

වගුව 3: සම්මන්ත්‍රණයේ අන්තර්ගතය

| දිනය | අංකය | ක්‍රියාකාරකම් |
|---|---|---|
| 1 | 1 | විශේෂ අධ්‍යාපනයේ ඉතිහාසය/ දුබලතාව යනු කුමක් ද? |
| | 2 | අන්තර්කරණ අධ්‍යාපනය යනු කුමක් ද?/ ශ්‍රී ලංකාවේ අන්තර්කරණ අධ්‍යාපනය සංවර්ධනය |
| | 3 | අන්තර්කරණ අධ්‍යාපනය තුළ ගුරුවරයාගේ කාර්යභාරය |
| | 4 | SEN සහිත සිසුන්ගේ අධ්‍යාපනය: සිරස් සහ තිරස් දෘෂ්ටිකෝණ |
| | 5 | අන්තර්කරණ අධ්‍යාපනය සඳහා පාසල් යටිතල පහසුකම් සහ පාරිසරික විධිවිධාන |
| 2 | 6 | අන්තර්කරණ අධ්‍යාපනය සඳහා පන්තිකාමර කළමනාකරණය 1 කොටස |
| | 7 | අන්තර්කරණ අධ්‍යාපනය සඳහා පන්තිකාමර කළමනාකරණය 2 කොටස |
| | 8 | විෂය ඉගැන්වීම සඳහා අන්තර්කරණ අධ්‍යාපනය හඳුන්වා දීම |
| | 9 | කණ්ඩායම් සාකච්ඡාව |
| | 10 | සහභාගිවන්නන් විසින් ඉදිරිපත් කිරීම |

කෝවිඩ්-19 හේතුවෙන් පනවන ලද සංචාරක සීමාවන් හේතුවෙන්, සමහර දේශන පූර්ව පටිගත කර, එම ස්ථානයේ වීඩියෝ මගින් සපයනු ලැබූ අතර, ප්‍රශ්නෝත්තර සැසියේ දී ප්‍රශ්නවලට පිළිතුරු දීමට දේශකයින් අන්තර්ජාලය හරහා වේදිකාවට පිවිසියේය. පිළිවෙළින් 2021 දෙසැම්බර් මාසයේ දී වයඹ (සහභාගිවන්නන් 38) සහ මහරගම (33) ද, 2022 ජූනි මාසයේ දී මහවැලි (46) සහ 2022 ජූලි මාසයේ දී යාපනයේ දී (45) මුහුණට මුහුණ සහ මාර්ග ගත සැසිවල එකතුවක් ලෙස සම්මන්ත්‍රණ පවත්වන ලදී.

**සටහන: යාපනය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ පැවති සම්මන්ත්‍රණය**

යාපනය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ දී 2022 ජූලි මස සම්මන්ත්‍රණයක් පැවැත්විණි. පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් ඇති වී තිබෙන දැඩි ඉන්ධන හිඟය නොතකා කථිකාචාර්යවරයන්ගෙන් 87%ක් පැමිණ සිටියහ. මෙම දෙදින සම්මන්ත්‍රණය තුළ පැවති ප්‍රශ්නෝත්තර සැසි සජීවී විය: බොහෝ කථිකාචාර්යවරු තම අදහස් අන් අය ඉදිරියේ ප්‍රකාශ කළ අතර කණ්ඩායම් ක්‍රියාකාරකම්වලට ධනාත්මක ව සහභාගී වූහ. සම්මන්ත්‍රණයෙන් පසු ලබා දුන් ප්‍රශ්නාවලියට ලැබුණු ප්‍රතිචාරවලට අනුව, සම්මන්ත්‍රණය පිළිබඳ තෘප්තිමත් බව, අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ අවබෝධය සහ සියල්ලටත් වඩා එය දෛනික පන්තිවලට හඳුන්වා දීමට ඇති කැමැත්ත, ඉහළින් ශ්‍රේණිගත කර ඇත. මෙම සම්මන්ත්‍රණය නුදුරු අනාගතයේ දී වඩාත් අන්තර්කරණ ගුරු පුහුණු ආයතනයක් සංවර්ධනය කිරීම සඳහා පදනම සාර්ථක ලෙස ගොඩ නගන ලදී. කෙසේ වෙතත්, ප්‍රතිචාර දැක්වූවන් අනාගතයේ දී තවත් ප්‍රායෝගික වැඩමුළු සහ සිදුවීම් සඳහා සැබෑ පන්ති කාමර තත්වයන් පිළිබඳ වීඩියෝ භාවිත කරන ලෙස ඉල්ලීමක් කළහ.



MOE මගින් සැසියක්



යාපනය NCoE හි දෘෂ්ටි ඌනතා සහිත කථිකාචාර්යවරයකු සමඟ සැසියක්



කණ්ඩායම් ඉදිරිපත් කිරීමක්

නියමු NCoEs හතරේ සියලු ම කථිකාචාර්යවරු සඳහා මෙම පුහුණුව පැවැත්වීමෙන්, 1) අන්තර්කරණ අධ්‍යාපනය ප්‍රධාන ප්‍රවාහයට එක් කිරීම සඳහා කථිකාචාර්යවරයන්ගේ සූදානම ගොඩනැගීම සහ 2) අධ්‍යාපන අමාත්‍යාංශයේ NFSE ශාඛාවේ අනාගත දිශාව පැහැදිලි කිරීමට ව්‍යාපෘතිය සමත් විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස NFSE ශාඛාවේ අධ්‍යක්ෂ සහ ව්‍යාපෘතිය විසින් 2022 නොවැම්බර් 28 වැනි දින "ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල අනිවාර්ය පාඨමාලාවක් ලෙස අන්තර්කරණ අධ්‍යාපනය ඇතුළත් කිරීම සඳහා මූලික හේතුව" යන මාතෘකාව යටතේ ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) වෙත ලිපියක් ඉදිරිපත් කරන ලදී.

## පාසල් ප්‍රජාව දැනුවත් කිරීම සඳහා මෙවලම් කට්ටලය

---

**පෙළ ගැසුම**

1) දුබලතාව පිළිබඳ සංකල්පය අවබෝධ කර ගැනීම
2) අන්තර්කරණ අධ්‍යාපනය අවබෝධ කර ගැනීම
3) අන්තර්කරණ අධ්‍යාපනය වෙනුවෙන් පාසල් ප්‍රජාවේ කාර්යභාරය අවබෝධ කර ගැනීම

සහ

4) <u>ඔබේ පාසල වඩාත් අන්තර්කරණ පාසලක් කිරීමට ක්‍රියාමාර්ග ගැනීම ආරම්භ කිරීම.</u>

---


1)දුබලතාව පිළිබඳ සංකල්පය අවබෝධ කර ගැනීම


---

**දුබලතාව යනු කුමක් ද?**

"දුබලතාව යනු කුමක් ද?"

පළමු ව, අපි පහත පින්තූරය දෙස බලන අතර දුබලතාව යනු කුමක් දැයි සලකා බලමු.





කණ්ඩායම් සාකච්ඡාව 1


“දුබලතා ඇත්තේ කොතැන ද?

පාසල් පරිශ්‍රය නිරූපණය කරන පින්තූරයේ, දුෂ්කරතා ඇත්තේ කොතැන දැයි සොයා බලන්න.

සිසුන්ට පමණක් නොව පාසල් පරිසරයට ද අවධානය යොමු කරන්න!




## දුබලතාව යනු කුමක් ද?




## 2) අන්තර්කරණ අධ්‍යාපනය අවබෝධ කර ගැනීම


## එක්ව හොඳින් උගනිමු

**විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයෙකුට විශේෂ සැලකිලි අවශ්‍ය වේ.**



Source: https://interactioninstitute.org/illustrating-equality-vs-equity/

## එක්ව හොඳින් උගනිමු



එක්ව හොඳින් උගනිමු

අන්තර්කරණ අධ්‍යාපනය යනු;

1. සෑම දරුවෙකුටම අනන්‍ය අධ්‍යාපන අවශ්‍යතා ඇති බව පිළිගනිමින්,
2. පුද්ගල අවශ්‍යතාවල විවිධත්වය ආමන්ත්‍රණය කිරීම,

සහ

3. (ඉතා මැනවින්) සාමාන්‍ය පන්ති/පාසල් වල ඉඩකඩ ලබා දීම ය.

## 3) අන්තර්කරණ අධ්‍යාපනය වෙනුවෙන් පාසල් ප්‍රජාවේ කාර්යභාරය අවබෝධ කර ගැනීම

කණ්ඩායම් සාකච්ඡාව 2


“අප මෙම සිසුන්ට සහය දක්වන්නේ කෙසේ ද?”

විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන්

↑

විශේෂ අධ්‍යාපන ප්‍රතිපාදන

<u>එය කෙබඳු ද?</u>



| | A | B | C | D | E | F |
|---|---|---|---|---|---|---|
| විදුහල්පති | | | | | | |
| ගුරුවරුන් (සාමාන්‍ය පන්තිය) | | | | | | |
| ගුරුවරුන් (විශේෂ අධ්‍යාපන ඒකකය) | | | | | | |
| සිසුන් | | | | | | |
| දෙමව්පියන් | | | | | | |

## අප මෙම සිසුන්ට සහය දක්වන්නේ කෙසේ ද?

**ඔවුන්ට සහය දැක්වීම සඳහා,**

- අවශ්‍ය/සුදුසු වෙනස් කිරීම්/ගැළපීම් සැපයීම අවශ්‍ය වේ.
- සමහර අවස්ථාවල එය තනි ව ලබා දීම අවශ්‍ය වේ.
- එය ලබා නො දී, ඔහුට / ඇයට අධ්‍යාපනයට නිසි ලෙස සහභාගී විය නො හැක.

මෙය <u>පහසුකම්/උපකරණ</u> පිළිබඳ <u>පමණක් නොවේ</u>

මෙය <u>ඉගැන්වීම/ඉගෙනීම</u> මෙන් ම <u>මානව සම්පත් වෙන් කිරීම</u> පිළිබඳ ව ද වේ.

## 4) ඔබේ පාසල වඩාත් අන්තර්කරණ පාසලක් කිරීමට ක්‍රියාමාර්ග ගැනීම ආරම්භ කිරීම.

## නිමාව:

"මෙය කාගේ කාර්යභාරය ද?"

- සෑම කෙනෙකුගේ ම උත්සාහයෙන් පමණක් අන්තර්කරණ පාසලක් නිර්මාණය කළ හැකිය.
- විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්ට ඉගැන්වීමේ වගකීම, එක් ගුරුවරයෙකුගේ පමණක් නොවේ.

<u>ගුරුවරුන්ට පාසල් ප්‍රජාවේ පූර්ණ සහයෝගය ලැබිය යුතුය.</u>

# අන්තර්කරණ අධ්‍යාපන සම්බන්ධීකාරකවරු සජීවිකරණය සඳහා මෙවලම් කට්ටලය

1

## පෙළ ගැස්ම


1) අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ දැනුවත් කිරීම
2)"සාමූහික ප්‍රයත්නය" වැදගත්කම අවබෝධ කර ගැනීම
3) අන්තර්කරණ පන්ති කළමනාකරණය සමඟ හඳුනා ගැනීම සම්බන්ධ කරන්නේ කෙසේ දැයි ඉගෙන ගැනීම
4) වේදිකා නාට්‍ය තුළින් ඔබ උගත් දේ ප්‍රතිදානය කිරීම


2

## 1) අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ දැනුවත් කිරීම

3


## දුබලතාව යනු කුමක් ද?







එක්ව හොඳින් උගනිමු

**විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයෙකුට විශේෂ සැලකිලි අවශ්‍ය වේ.**



Source: https://interactioninstitute.org/illustrating-equality-vs-equity/

එක්ව හොඳින් උගනිමු




එක්ව හොඳින් උගනිමු

- අන්තර්කරණ අධ්‍යාපනය යනු;
  1. සෑම දරුවෙකුටම අනන්‍ය අධ්‍යාපන අවශ්‍යතා ඇති බව පිළිගනිමින්,
  2. පුද්ගල අවශ්‍යතාවල විවිධත්වය ආමන්ත්‍රණය කරමින්,
  3. සෑම සිසුවෙකුට ම සාමාන්‍ය පන්ති/පාසල් වල ඉඩකඩ ලබා දීම ය (පරමාදර්ශය).

## විශේෂ අවශ්‍යතා ඇති සිසුන්ට අප සහය දක්වන්නේ කෙසේ ද?

**ඔවුන්ට සහය දැක්වීම සඳහා,**

- අවශ්‍ය/සුදුසු වෙනස් කිරීම්/ගැළපීම් සැපයීම අවශ්‍ය වේ.
- සමහර අවස්ථාවල දී එම සහය තනි තනිව ලබා දීම අවශ්‍ය වේ.
- සහය ලබා නො දී, ඔහුට / ඇයට අධ්‍යාපනයට නිසි ලෙස සහභාගී විය නො හැක.

මෙය පහසුකම්/උපකරණ පිළිබඳ පමණක් නොවේ.

මෙය ඉගැන්වීම/ඉගෙනීම මෙන් ම මානව සම්පත් වෙන් කිරීම පිළිබඳ ව ද වේ.

## 2) කණ්ඩායම් ප්‍රයත්නය වැදගත් වන්නේ ඇයි?

10

## පාසලට (මුලින්ම) අන්තර්කරණ අධ්‍යාපනය හඳුන්වා දුන් පසු,

- ගුරුවරුන්ට "අන්තර්කරණ අධ්‍යාපනයේ වාසි" නොදැනේ නම්, ඔවුන් එය නතර කරනු ඇත



- ගුරුවරුන්ට ඔවුන්ගේ සගයන්ගෙන්, පාසලෙන්, ප්‍රජාවෙන් කිසිදු සහයෝගයක් නොලැබුණහොත් ඔවුන් එය නතර කරනු ඇත



11


## "කණ්ඩායම" වැදගත් ඇයි?

- කණ්ඩායමක් ලෙස ඔබට පාර්ශ්වකරුවන් අතර පොදු අවබෝධතාවයක් ඇති කර ගත හැකිය.
- කණ්ඩායමක් ලෙස ඔබට සිසුන් පිළිබඳ තොරතුරු හුවමාරු කර ගත හැකි අතර, එක් එක් සිසුවා කෙරෙහි සැලකිල්ලක් දැක්වීමේ හැකිමක් වර්ධනය කිරීමට හැකි වේ.

⇒ "කණ්ඩායම් ප්‍රවේශය" "අන්තර්කරණය" ඉහළ නැංවීමට හොඳම ක්‍රමය වේ.

12

## IE සම්බන්ධීකාරක සමඟ කණ්ඩායම් සංවිධානය




13

## කණ්ඩායම් සාමාජිකයින්ගෙන් අපේක්ෂිත භූමිකාවන්


| | අපේක්ෂිත භූමිකාවන් |
|---|---|
| අන්තර්කරණ අධ්‍යාපන සම්බන්ධීකාරක | • සහාය කාර්ය මණ්ඩලය පත් කිරීම<br>• තොරතුරු රැස් කිරීම<br>• භාරකරුවන් සමඟ උපදේශනය<br>• පාසල් කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම<br>• බාහිර පාර්ශවකරුවන් සමඟ සම්බන්ධනය/සන්නිවේදනය සහ සම්බන්ධීකරණය |
| විදුහල්පති | • අන්තර්කරණ අධ්‍යාපන සම්බන්ධීකාරක පත් කිරීම<br>• IE සම්බන්ධීකාරකට අවශ්‍ය සහාය ලබා දීම<br>• බාහිර පාර්ශවයන්ගෙන් සම්පත් ඉල්ලීම |
| පන්ති භාර ගුරුවරයා | • දරුවන් ගැන තොරතුරු බෙදා ගැනීම (පන්තිකාමරය තුළ)<br>• සාධාරණ ඉඩ හසර සැපයීම (ආසන, මිතුරු සහාය, විෂයමාලා අනුවර්තනය ආදිය) |
| ගුරුවරයා | • දරුවන් ගැන තොරතුරු බෙදා ගැනීම (පාසල තුළ)<br>• IE සම්බන්ධීකාරකට තාක්ෂණික සහාය ලබා දීම(විශේෂ අධ්‍යා. ගුරුවරයා) |
| භාරකරු | • දරුවන් ගැන තොරතුරු බෙදා ගැනීම (ගෙදර දී) |
| පාසල් සංවර්ධන සමිතිය, ආදි ශිෂ්‍ය සංගමය | • මූල්‍ය ආධාර හෝ/සහ ශ්‍රම දායකත්වය ලබා දීම |
| කලාප අධ්‍යාපන කාර්යාලය/ප්‍රාදේශිය ලේකම් කාර්යාලය | • තාක්ෂණික උපදෙස් ලබා දීම<br>• මුදල්/ සහාය උපකරණ සැපයීම |

14

# 3) හඳුනා ගැනීම සහ අන්තර්කරණ පන්ති කළමනාකරණය

15

## අන්තර්කරණ පන්ති කාමර කළමනාකරණය සඳහා හඳුනා ගැනීම





16

## පුද්ගලබද්ධ ඉගැන්වීම් සැලසුම් (IEP) නිර්මාණය කිරීම සඳහා කරුණු

1. ඉලක්ක නිශ්චිත හා මැනිය හැකි ඒවා විය යුතු ය.
2. යමක් කිරීමට හෝ සම්පූර්ණ කිරීමට නොහැකි වීම ගැන සිසුන්ට දොස් නොකියන්න.
3. ඉලක්ක පමණක් නොව සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන උත්සාහය ද ඇගයීමට ලක් කරන්න.
4. උපදෙස්/ඉගැන්වීමේ ඉතිහාසයක් පවත්වා ගන්න.
5. IEP වල 'සැලසුම් කිරීම -කිරීම- පරීක්ෂා කිරීම- ක්‍රියාත්මක කිරීම' [Plan-Do-Check-Action (PDCA)] චක්‍රය විෂය මාලා කළමනාකරණය සම්බන්ධ කරන්න.
6. IE සම්බන්ධීකාරක සහ අනෙකුත් පාර්ශවකරුවන්ට IEP සකස් කිරීමට විශේෂ ඒකක ගුරුවරයාට සහාය විය හැකිය

## මූලික පාරිසරික සැකැස්ම

මූලික පාරිසරික සැකැස්ම
උපකරණ සහ පහසුකම්




18

# 4) වේදිකා නාට්‍ය

19

## උපදෙස්

- කරුණාකර අන්තර්කරණ අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා ගැටලුව විසඳා ගන්නේ කෙසේ දැයි කණ්ඩායම තුළ සාකච්ඡා කර ඒ සියල්ල බෙදා ගැනීමට නාට්‍යයක් සකස් කරන්න.
- සාකච්ඡාව සඳහා අද දේශනය උපයෝගී කර ගන්න.
  - ✓කවුරුන් කුමන වගකීම භාර ගන්නේ ද?
  - ✓ඔබ මුහුණ දෙන අභියෝග මොනවා ද?
- කරුණාකර පහත අවස්ථා 4 අතරින් එක් අවස්ථාවක් තෝරා ගන්න.
- සෑම කණ්ඩායමක් ම අවම වශයෙන් IE සම්බන්ධීකාරක, විදුහල්පති, ගුරුවරයා සහ දෙමාපියන් භූමිකා තිබිය යුතු ය.

20

## ඔබ පහත ගැටලු විසඳන්නේ කෙසේ ද?

### වේදිකා නාට්‍ය සඳහා සූදානම් වීම (කණ්ඩායම් ක්‍රියාකාරකම්)

1. ළමයෙකු SEU සිට සාමාන්‍ය පන්තියකට මාරු කර ඇත, නමුත් පන්ති භාර ගුරුවරයා දරුවාගේ අනන්‍ය අවශ්‍යතා/ලක්ෂණ ගැන අවබෝධයක් නොමැති අතර දරුවා සමඟ කුමක් කළ යුතු දැයි නොදනියි
2. ශාරීරික දුබලතා සහිත දරුවෙකුට පන්ති අතරතුර වැසිකිළියට යාමේ ගැටලුවක් ඇත (වැසිකිළියට දුරයි, පන්ති කාමරය දෙවන මහලේ තිබීම යනාදිය)
3. පන්තියේ අනෙක් සිසුන්ට වඩා වයසින් වැඩි SEN ශිෂ්‍යයෙක් සිටී. ඔහුගේ වර්තමාන මේසය සහ පුටුව ඔහුට සුදුසු ප්‍රමාණයේ නොවේ. අපි ඔහුගේ අවශ්‍යතාවයන්ට ගැළපෙන මේසය සහ පුටුව ලබා දීමට කැමති නමුත් ඔහුට ගැළපෙන ප්‍රමාණයේ මේස සහ පුටු සොයා ගැනීම දුෂ්කර වී ඇත.
4. අවසාන විභාගය කර විභාග ප්‍රතිඵල අඩු ශිෂ්‍යයෙක් සිටියි. ඔහු සෑම දිනක ම පන්තියට පැමිණි අතර ඔහු ඔහුට ඉගෙනීමෙ දුෂ්කරතා පිළිබඳ කිසිදු සලකුණක් නොවීය.

21

### කරුණාකර ඔබේ නාට්‍යය රස විඳින්න සහ බෙදා ගන්න!

- එක් කණ්ඩායමකට විනාඩි 10 ක කාලයක් ලැබේ
- නාට්‍යයක කොටසක් වුවත් ප්‍රමාණවත් වේ.

22

# පුද්ගලබද්ධ ඉගෙනුම් සැලසුම (IEP) සකස් කරන්නේ කෙසේද: පියවර ඇතුළත් මාර්ගෝපදේශය

### IEP කුමක් සඳහා ද?

- <u>අරමුණු සපුරා ගැනීම සඳහා</u> සැලසුම් සකස් කරයි.
- මෙම අරමුණු, ළඟා කර ගෙන තිබේ ද නැද්ද යන්න <u>විනිශ්චය කළ හැකි දෙයක්</u> විය යුතු ය.
- අරමුණු සාක්ෂාත් කර ගැනීම පිළිබඳ ඇගයීමකින් තොර ව, සැලැස්ම අර්ථ විරහිත ය.

2

## IEP කුමක් සඳහා ද?

IEP යනු:

දුබලතා සහිත සිසුන් සඳහා මාර්ගෝපදේශ සැපයීම ඇතුළත් වන සැලැස්මක් වේ. මෙහි

- උපදේශන ඉලක්ක, සහ
- ඉගැන්වීමේ ක්‍රමවේද

ඇතුළත් වේ.

3

## IEP කුමක් සඳහා ද?

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය යනු පුද්ගල අවශ්‍යතා සපුරාලීම සඳහා වන අධ්‍යාපනයයි. එය සාමාන්‍ය අධ්‍යාපනය මෙන් පෙළ පොතක් අනුගමනය නොකරන අතර එය සෑම කෙනෙකුට ම එක හා සමාන ද නොවේ.

ශාස්ත්‍රීය විෂයයන්හි දී මෙන් නොව, ලිඛිත පරීක්ෂණවලින් පමණක් ශිෂ්‍යයාගේ සැබෑ තත්ත්වය ග්‍රහණය කර ගැනීම කළ නොහැක.

ශිෂ්‍යයෙකුගේ ලක්ෂණ (ශක්තීන් සහ අවශ්‍යතා), ඔහුට/ඇයට කුමන ආකාරයේ ඉගෙනුම් ඉතිහාසයක් තිබේ ද සහ කුමන ආකාරයේ සහයෝගයක් ඵලදායි වී ඇත්ද යන්න සටහන් කිරීම අවශ්‍ය වේ.

4

## IEP සකස් කිරීමේ ක්‍රියාවලිය

**① තක්සේරුව**

**② විශේෂිත ඉලක්ක තීරණය කිරීම**

**③ IEP ගොඩ නැංවීම**

**④ IEP ක්‍රියාත්මක කිරීම**

**⑤ IEP සමාලෝචනය සහ යාවත්කාලීන කිරීම**

5

## IEP සකස් කිරීමේ ක්‍රියාවලිය

**① තක්සේරුව**

මනෝවිද්‍යාත්මක පරීක්ෂණය, තක්සේරු මෙවලම

තක්සේරුව
- විධිමත් තක්සේරුව
- නොවිධිමත් තක්සේරුව

ඉගෙනීම, සෙල්ලම් කිරීම, හැසිරීම් ආදී සුපුරුදු දර්ශන නිරීක්ෂණය / වාර්තා කිරීම

6

IEP සකස් කිරීමේ ක්රියාවලිය

## ① තක්සේරුව

| | | | |
|---|---|---|---|
| ශාරීරික සෞඛ්‍යය | ශ්‍රවණය | | |
| | දෘෂ්ටිය/පෙනීම | | |
| | චාලක කුසලතා | දළ චාලක කුසලතා | ස්වයං ආධාරක කුසලතා |
| | | සියුම් චාලක කුසලතා | |
| | සනීපාරක්ෂාව | | |
| | ආහාර පුරුදු | | |
| සන්නිවේදන/සමාජ කුසලතා | සමාජ නිපුණතාව | | |
| | හැඟීම් කළමනාකරණය | | |
| | සංවිධානාත්මක කුසලතා | | |
| ප්‍රජානන කුසලතා | කථනය | | |
| | කියවීම | පෙර-කියවීම | |
| | | කියවීම | |
| | ලිවීම | පෙර ලිවීම | |
| | | ලිවීම | |
| | ගණිත කුසලතා | | |
| | මතකය | | |
| චර්යා කළමනාකරණය | මූලික / විෂය බාහිර ක්‍රියාකාරකම්වල දී හැසිරීම | | |
| | අවධානය | | |



IEP සකස් කිරීමේ ක්‍රියාවලිය

## ① තක්සේරුව

අධ්‍යයන/ශාස්ත්‍රීය ජයග්‍රහණ සහ ක්‍රියාකාරී කාර්ය සාධනයේ වර්තමාන මට්ටම පිළිබඳ විධිමත් හා අවිධිමත් තක්සේරුව

පුද්ගල ගැටළු, ශක්තිය සහ දුර්වලතා උනන්දුව (කැමත්ත සහ අකමැත්ත) හඳුනා ගන්න ← දෙමාපියන්/භාරකරුවන්ගෙන් තොරතුරු ලබා ගන්න



IEP සකස් කිරීමේ ක්‍රියාවලිය

## ② විශේෂිත ඉලක්ක තීරණය කිරීම

දෙමව්පියන්ගේ අපේක්ෂාවන් පිළිබිඹු කරමින් වසරක් තුළ සාක්ෂාත් කරගත හැකි යැයි සැලකෙන අකාරයට <u>දිගු කාලීන අරමුණු</u> සකස් කළ යුතුය.

<u>කෙටි-කාලීන අරමුණු</u>, එක් පාසල් වාරයක් තුළ ළඟා විය හැකි වන සේ සහ නිශ්චිත හා මැනිය හැකි ආකාරයෙන් සකස් කළ යුතුය



IEP සකස් කිරීමේ ක්‍රියාවලිය

③ IEP ගොඩ නැංවීම

④ IEP ක්‍රියාත්මක කිරීම

## IEP හි මූලික ව්‍යුහය

ශිෂ්‍ය තොරතුරු

තක්සේරු වාර්තාව

දිගු-කාලීන අරමුණ

| කෙටි-කාලීන අරමුණ | කෙටි-කාලීන අරමුණ | කෙටි-කාලීන අරමුණ |
|---|---|---|
| වාර සටහන් | වාර සටහන් | වාර සටහන් |

11

## ශිෂ්‍ය තොරතුරු (උදාහරණය)

| ශ්‍රේණිය සහ පන්තිය | ශිෂ්‍යයාගේ නම | ස්ත්‍රී/පුරුෂ බව, වයස | පන්ති භාර ගුරුවරයා | ඇතුළත් කළ දිනය |
|---|---|---|---|---|
| විශේෂ අධ්‍යාපන ඒකකය | | පුරුෂ, 9 | | 2025 ජනවාරි 25 |

| | |
|---|---|
| දුබලතාව | ඔටිසම් පරාසීය දුබලතාව (ASD) |
| කැමති දෑ | • බෝල ක්‍රීඩාව වැනි ශාරීරික ක්‍රියාකාරකම් |
| අකැමති දෑ | • විශේෂයෙන් ලිවීමේ කාර්යයන් සඳහා දිගු කාලයක් බලා සිටීම සහ අවධානය යොමු කිරීම |
| දෙමාපිය අපේක්ෂණය | • අන් අයට ඇහුම්කන් දීමට සහ ආවේගශීලී නොවී කටයුතු කිරීමට හැකි වීම<br>• පන්තියේ මිතුරන් සමඟ ඉගෙන ගැනීමට සහ සෙල්ලම් කිරීමට |

12

## තක්සේරුකරණ ප්‍රතිඵල

| | |
|---|---|
| දළ චාලක කුසලතා | • ඔහු ශාරීරිකව ක්‍රියාකාරී වීමට කැමතියි<br>• උපදෙස් ලබා දුන් විට ඔහුගේ ඉරියව්ව නිවැරදි කළ හැකිය |
| සියුම් චාලක කුසලතා | • තනිවම සිතීමට හා අත්කම් කිරීමට හැකියාව ඇත |
| සන්නිවේදනය | • ඔහු මිතුරන් සමඟ ගැටළු/කරදර ඇති අතර සමහර විට තනිව සිටියි |
| ස්වයං-ආධාරක කුසලතා | • ඔහු නිතර වැසිකිළියට යයි හෝ පාඩම් අතරතුර ඇවිදියි |
| ශ්‍රවණය | • ඔහු ඇතැම් විට ගුරුවරයාගේ උපදෙස් පිළිපදින්නේ නැති අතර තනිව ක්‍රියා කරයි |
| කථනය | • කෙනෙක් පවසන දේ ඔහු නැවත කියයි<br>• ඔහු පැකිළෙමින් හඬ නගා කියවයි. |
| කියවීම | • අකුරු ලිවීමට හැකිය, නමුත් ලියා ඇති වගන්ති අවබෝධ කර ගැනීමේ දුෂ්කරතා ඇත. |
| ලිවීම | • වචන රැසක් එකවර පිටපත් කිරීමට දක්ෂ නැත |
| ගණිතය | • 10 දක්වා ඇඟිලි ගණන් කරයි.<br>• මුදල් ගණනය කිරීම අපහසු ය. |
| චර්යාව | • හැඟීම් පාලනය කිරීමට අපහසු වීම.<br>• වටපිටාව නිසා පහසුවෙන් අවධානය වෙනතකට යොමු කිරීම, පිරිසිදු කිරීමට සහ කාර්යයන් කෙරෙහි අවධානය යොමු කිරීමට අපහසු වීම. |

13

### දිගු-කාලීන අරමුණු (වර්ෂ 1)
### 2025 ජනවාරි සිට 2025 දෙසැම්බර් දක්වා

1. අන් අය සමඟ ස්ථායි පාසල් ජීවිතයක් ගත කිරීමට සහ අන් අය සමඟ කටයුතු කරන ආකාරය ඉගෙන ගැනීම
2. මූලික අධ්‍යයන කුසලතා ලබා ගැනීමට

### කෙටි-කාලීන අරමුණු (වාර 1)
### 2023 ජනවාරි සිට අප්‍රේල් දක්වා

1. කෙටි කාර්යයන් සඳහා ගුරුවරයාගේ උපදෙස් වලට සවන් දීම සහ අනුගමනය කිරීම
2. පාඩම් වල දී පන්තියේ මිතුරන් සමඟ එකට වාඩි වී වැඩ කිරීම
3. කෙටි වාක්‍ය ලිවීමට සහ කියවීමට පුරුදු වීම
4. මුදල් (මූලික) එකතු කිරීම සහ අඩු කිරීම සඳහා පුරුදු වීම

14

| විෂය | වර්තමාන තත්වය | අධ්‍යාපන ක්‍රමය |
|---|---|---|
| කෙටි-කාලීන අරමුණු #1 සහ #2<br><br>සන්නිවේදනය චර්යාව කථනය | • ඔහු නිතර වැසිකිළියට යයි හෝ පාඩම් අතරතුර ඇවිදියි | • වැසිකිළියට යාමට හේතුව හඳුනා ගන්න<br>• ටයිමරයක් භාවිතා කරමින් විනාඩි 5 ක් තුළ විවිධ කාර්යයන් ලබා දෙන්න<br>• සෑම කාර්යයක් ම සම්පූර්ණ කිරීමෙන් පසු සංකේතාත්මක ත්‍යාග ලබා දෙන්න |
| | • ඔහු මිතුරන් සමඟ ගැටළු/කරදර ඇති අතර සමහර විට තනිව සිටියි<br>• හැඟීම් පාලනය කිරීමට අපහසු වීම. | • ඔහුගේ ප්‍රියතම ක්‍රීඩාව ඔහු කැමති එක් අයෙකු සමඟ කෙටි කාලයක් සඳහා කිරීමට දෙන්න. ක්‍රමයෙන් කාලසීමාව සහ ක්‍රීඩා කරන පුද්ගලයින් ගණන වැඩි කරන්න<br>• විවිධ දර්ශන සහිත පින්තූර හරහා චිත්තවේගීය තත්වයන් අවබෝධ කර ගැනීම වැනි සමාජ කුසලතා අභ්‍යාස කිරීම |
| | • පිරිසිදු කිරීම අපහසු ය | • එදිනෙදා කාලසටහනට අනුව කුඩා පියවර වලින් ඔහුගේ බඩු බාහිරාදිය පිරිසිදු කිරීම සඳහා විවිධ කාර්යයන් හඳුන්වා දෙන්න |

15

| | | |
|---|---|---|
| කෙටි-කාලීන අරමුණු #3<br><br>ලිවීම කියවීම | • වචන රැසක් එකවර පිටපත් කිරීමට දක්ෂ නැත<br>• කිරීමට බොහෝ දේ ඇති විට අවධානය පහසුවෙන් වෙනතකට යොමු වේ | • කෝඩුවක් භාවිතා කර, ලිවීමට ඇති වචන පෙන්වමින්, සීමිත වචන පිටපත් කිරීමේ අභ්‍යාස කරන්න<br>• සෑම කාර්යයක් ම සම්පූර්ණ කිරීමෙන් පසු සංකේතාත්මක ත්‍යාග ලබා දෙන්න |
| කෙටි-කාලීන අරමුණු #3<br><br>ගණිතය | • 10 දක්වා ඇඟිලි ගණන් කරයි.<br>• කිරීමට බොහෝ දේ ඇති විට අවධානය පහසුවෙන් වෙනතකට යොමු වේ | • අංක බ්ලොක් භාවිතයෙන් 1 සිට 10 දක්වා එකතු කිරීම පුහුණු වීම<br>• බ්ලොක් සංයෝජනය සහ ෆ්ලෑෂ් කාඩ් වල ඇති කුඩා කාර්යයන් කරන්න |

16

## ප්‍රධාන පණිවිඩ

- IEP හි විස්තර කර ඇති සියලු ම ක්‍රියාකාරකම්/උපදෙස්/පාඩම් දිගු-කාලීන අරමුණ සපුරා ගැනීම සඳහා සැලසුම් කළ යුතු ය. එයට <u>හේතු කාරක සම්බන්ධය අවශ්‍ය වේ</u>
- ඉගෙනීමේ දී හෝ එදිනෙදා ජීවිතයේ දී ශිෂ්‍යයාට වඩාත් ම දුෂ්කරතා ඇති දැ විසඳීමට කෙටි-කාලීන අරමුණු සකස් කළ යුතුය. සියලු ම ක්ෂේත්‍ර/නිපුණතා සඳහා කෙටි-කාලීන අරමුණු සැකසීම අත්‍යවශ්‍ය නොවේ

19

## IEP සකස් කිරීමේ ක්‍රියාවලිය

### ⑤ IEP සමාලෝචනය සහ යාවත්කාලීන කිරීම

අරමුණු සාක්ෂාත් කර ගැනීම සිදු නොවන්නේ නම්, එය ඉලක්ක කරගත් ශිෂ්‍යයාගේ වරදක් නොව අරමුණු සැකසීම හෝ ඉගැන්වීමේ ක්‍රම ක්‍රියාත්මක කිරීම නිසියාකාර සිදු නොවීම නිසා බව වටහා ගත යුතුය. එමෙන්ම,

1) ශිෂ්‍යයාගේ තත්ත්වය පිළිබඳ නිවැරදි අවබෝධය මත පදනම් ව නිසි අරමුණු සැකසීම

සහ

2) IEP හි සැලසුම් කර ඇති පරිදි නියමිත පාඩම් ක්‍රියාත්මක කිරීම

අවශ්‍ය බව සිහි තබා ගන්න.

17

ප්‍රධාන පණිවිඩ

- ශිෂ්‍යයාට වඩා හොඳ සහ ඵලදායී ඉගෙනීම ලබා දීම සහ ප්‍රගතිය බෙදා ගැනීම සඳහා IEP ඇත. මෙහි අරමුණ ලේඛන ගත කිරීම ම නොවේ.
- IEP හැකි උපරිමයෙන් සරල හා නිශ්චිත විය යුතු ය
- අරමුණු සැකසීමේ ක්‍රියාවලියේ දී දෙමාපියන්ගේ අපේක්ෂාවන් පිළිබිඹු විය යුතු ය.

18

## ඉගෙනීම සඳහා සාර්ව සැලැස්ම පුහුණු කිරීම සඳහා මෙවලම් කට්ටලය

1

පෙළ ගැස්ම

1) UDL යනු කුමක් ද?
2) UDL හි විශේෂිත ව්‍යවහාර හත (7)
3) සාරාංශය

2

## 1. UDL යනු කුමක් ද?

3

## UDL යනු කුමක් ද?

- 1980 කාලයේ: **"සාර්ව සැලැස්ම (UD)"** රොනල්ඩ් මේස් (1941-1998, ඇ. එ. ජ., ගෘහ නිර්මාණ ශිල්පී සහ අධ්‍යාපනඥ)

- **අධ්‍යාපනික භාවිතයන්හි දී UD භාවිත කළ හැකි ද?**

**ඔව්!**

**එබැවින්, එය "ඉගෙනීම සඳහා සාර්ව සැලැස්ම (UDL)" ලෙස හැඳින්වේ.**



රොනල්ඩ් මේස් (ඇ. එ. ජ.)



කැරොල් ඈන් ටොම්ලින්සන් (අධ්‍යාපනඥ, ඇ. එ. ජ.) සහ වෙනත් අය

4

## UD සහ UDL හි මූලධර්ම

- **UD සඳහා මූලධර්ම හත (7)**

(1) සාධාරණ භාවිතය
(2) භාවිතයේ නම්‍යශීලී බව
(3) සරල සහ අවබෝධාත්මක භාවිතය
(4) අවබෝධ කර ගත හැකි තොරතුරු
(5) දෝෂ සඳහා සහනය
(6) අඩු ශාරීරික වෙහෙස
(7) ප්‍රවේශය සහ භාවිතය සඳහා ප්‍රමාණය සහ ඉඩ.

➡ **හැකි තාක් පුද්ගලයින්ට** **පහසුවෙන් භාවිතා කිරීමට සැලසුම් කිරීම**




- **UDL සඳහා මූලධර්ම තුන** ➡ **සියලු ම දරුවන්ට පහසුවෙන් සහභාගී විය හැකි පන්ති**

(1) විවිධ **ප්‍රකාශන** ක්‍රම සපයයි
(2) විවිධ **ක්‍රියාකාරකම් සහ චිත්තවේගීය ප්‍රකාශන** මාධ්‍යයන් සැපයීම
(3) **සහභාගී වීමට** විවිධ මාර්ග ලබා දෙයි

5

## UDL හි ශාස්ත්‍රීය පදනම්




ඇල්බට් බැන්ඩුරා (1925-2021, කැනඩාව)

ලෙව් විගොට්ස්කි (1896-1934, රුසියාව)

## 2. UDL හි විශේෂිත ව්‍යවහාර හත (7)

7

## UDL සමඟ පාඩම ක්‍රියාත්මක කිරීම




(1) අද ඉගෙනීමේ/පාඩමේ අන්තර්ගතය පැහැදිලි කරන්න
(2) සෑම සිසුවෙක් ම දැනුවත් කරන්න

(3) එක් උපදෙසක් සහ එක් ක්‍රියාවක්
(4) තනි තනිව ප්‍රතිපෝෂණ සපයන්න
(5) පාඩම අතරතුර හිඩැස් නොතබන්න
(6) සම වයසේ සහායක පද්ධතියක් ස්ථාපිත කරන්න

(7) පරීක්ෂා කිරීමට කාලය වෙන් කරන්න

8

## (1) අද පාඩමේ අන්තර්ගතය පැහැදිලි කරන්න

ඔටිසම් පරාසීය දුබලතාව (ASD/ Autism Spectrum Disorder) සහ ADHD (ඌන අවධානිත අධි ක්‍රියාකාරීත්ව දුබලතාව)
ඇති **ළමුන්ගේ කාංසාව පිළිබඳ සලකා බැලීම**



**අද පාඩමේ දී සිසුන් කරන්නේ කුමක් දැයි කියන්න.**
**<උදාහරණ>**
පළමු ව: වචන එකට උච්චාරණය කරන්න.
දෙවනුව: මෙම වචන සටහන් පොත් මත ලියන්න.

9

## හැඳින්වීම: අද පාඩමේ අන්තර්ගතය පැහැදිලි කරන්න

◆ ගුරුතුමිය අද පාඩමේ අරමුණු සියලු ම සිසුන්ට පැහැදිලි ව පෙන්වා දුන්නා ය.



1 ශ්‍රේණියේ සිංහල පාඩම 4 ශ්‍රේණියේ සිංහල පාඩම

10

## (2) සෑම සිසුවෙක් ම දැනුවත් කරන්න

ප්‍රමාණවත් අවධානයක් නොමැති
**දරුවන් වෙනුවෙන් සලකා බැලීම/**
**අවධානය යොමු කිරීම**



ගුරුවරයා පැහැදිලි කරන විට,
**සෑම කෙනෙකු ම සවන් දෙන බවට වග බලා ගන්න.**

"කරුණාකර මා දෙස බලන්න"
"කරුණාකර නිශ්ශබ්දව සිට මට සවන් දෙන්න."

11

## හැඳින්වීම: සෑම සිසුවෙකු ම දැනුවත් කරන්න

- ගුරුවරයා උස් හඬින් නමුත් මෘදු ලෙස කතා කරමින් සිටි නිසා සියලු ම සිසුන්ගේ අවධානය යොමු විය.

**"අපි මේකට නිහඬව මුහුණ දෙමු."**

**"ඔබේ ගුරුවරයාගේ දෑස් දෙස බලන්න."**



1 ශ්‍රේණියේ සිංහල පාඩම

12

## (3) එක උපදෙසක් සහ එක ක්‍රියාවක්

අඩු ක්‍රියාකාරී මතකය සහිත සහ ADHD සහිත **ළමුන් වෙනුවෙන් සලකා බැලීම**



ගුරුවරයාගේ පැහැදිලි කිරීම් කෙටි ව කරන්න.
පන්තියේ **ළමයින්ට ක්‍රියාවට නැගිය හැකි සේ විස්තර කරන්න**

ගුරුවරයා: "පෙළ පොත කියවන්න."
*සිසුවා: එය කියවයි.*
ගුරුවරයා: "පෙළ පොත වසන්න."
*සිසුන්: පොත් වසා දමති.*

13

## අන්තර්ගතය: එක උපදෙසක් සහ එක ක්‍රියාවක්

- ගුරුතුමිය ඇයගේ උපදෙස් එකින් එක ලබා දුන්නා ය.
- එක් උපදෙසකින් පසු ගුරුතුමිය සිසුන් ලවා උපදෙස් දුන් ක්‍රියාව සිදු කළා ය.
- ගුරුතුමිය සිසුන්ගේ හැසිරීම තහවුරු කළා ය.

**"ඔබේ පෙළ පොතේ 32 පිටුව විවෘත කරන්න."**

=> සියලු ම සිසුන් එය විවෘත කරයි දැයි ගුරුවරයා පරීක්ෂා **කරයි.**

**"මේ වාක්‍යය එකට කියවන්න."**

=>ගුරුවරයා සිසුන්ගේ කියවීමට හොඳින් සවන් දෙයි.

**"මේ ගැටළු විසඳන්න."**

=>ගුරුවරයා සිසුන්ට විසඳිය හැකි ද නැද්ද යන්න පරීක්ෂා කරයි.

14

## (4) තනි තනිව ප්‍රතිපෝෂණ සපයන්න

ASD සහ ADHD සහිත **ළමුන් වෙනුවෙන් සලකා බැලීම**



**ළමයින් තමන් ඉගෙන ගත් දේ කොතරම් හොඳින් අවබෝධ කර ගෙන ඇත් ද** යන්න පිළිබඳ ව ගුරුවරුන් **තනි පුද්ගල ප්‍රතිපෝෂණ** ලබා දෙයි.

තමන්ගේ කාර්යසාධනය/ජයග්‍රහණ ගැන දැන ගත් විට දරුවන් වඩාත් උනන්දු වෙයි.

15

## අන්තර්ගතය: තනි තනිව ප්‍රතිපෝෂණ සපයන්න

- පාඩම අතරතුර, ගුරුතුමිය සෑම සිසුවෙකුට ම තේරෙනවා ද නැද්ද යන්න හොඳින් පරීක්ෂා කළා ය.
- එසේ නොකළ සිසුන්ට ගුරුතුමිය උපකාර කළා ය.


1 ශ්‍රේණියේ පරිසර අධ්‍යයන


5 ශ්‍රේණියේ චිත්‍ර

16

## (5) පන්තියේ හිස් වෙලාවක් ඇති කරන්න එපා



**ළමයින් කුමක් කළ යුතු දැයි නොදන්නා හිස් කාලය** තුළ බොහෝ විට ගැටලු ඇති වේ.

↓

**සිසුන් කුමක් කළ යුතු දැයි නොදන්නා තත්වයක් ඇති නොකරන්න.**

පැවරුම ඉක්මනින් අවසන් කරන සිසුන් සඳහා ගුරුවරුන් මීළඟ ක්‍රියාකාරකම සූදානම් කළ යුතු ය.

17

## අන්තර්ගතය: පාඩම අතරතුර හිඩැස් නොතබන්න

- තම පැවරුම් ඉක්මනින් අවසන් කළ සිසුන් පන්ති පුස්තකාලයේ පොත් කියවමින් සිටිති.



1 ශ්‍රේණියේ සිංහල පාඩම

18

## (6) සම වයසේ සහායක පද්ධතියක් ස්ථාපිත කරන්න



ශාරීරික දුබලතා සහිත **දරුවන් වෙනුවෙන් සලකා බැලීම** සහ ASD සහිත **දරුවන්ගේ** සන්නිවේදන කුසලතා වැඩි දියුණු කිරීම සඳහා **සලකා බැලීම**

↓

**යම් උපකාරයක් අවශ්‍ය** දරුවන් **උදව් ඉල්ලීමට පැකිළෙයි.**

**පන්තියේ දී නිතිපතා උපකාර ඉල්ලා සිටීමේ පුරුද්දට යොමු වන්න.**

19

## අන්තර්ගතය: සම වයසේ සහායක පද්ධතියක් ස්ථාපිත කරන්න

- ඇස් පෙනීම දුර්වල ශිෂ්‍යයෙක් සිටියි.
- දෘෂ්ටි ඌනතා සහිත සිසුවාට පන්තියේ දී කරදරයක්/ ගැටලුවක් වූ විට ඔහුට උපකාර කිරීමේ කාර්යභාරයක් ඔහු අසල වාඩි වී සිටින සිසුවා ඉටු කරයි.



4 ශ්‍රේණිය ගණිතය පාඩම

සහාය ලබා දෙන ශිෂ්‍යයාට උපකාර කරන අතරතුර අන්තර්ගතය වඩාත් ගැඹුරින් තේරුම් ගැනීමට හැකි වේ.

## (7) පරීක්ෂා කිරීමට කාලය වෙන් කරන්න



ඉගෙනුම් දුෂ්කරතා සහිත **දරුවන් පිළිබඳ සලකා බැලීම**

↓

ගුරුවරුන් පන්ති අතරතුර **එක් එක් ශිෂ්‍යයාගේ අවබෝධතා මට්ටම පරීක්ෂා කළ යුතු ය.**

ගුරුවරුන් විසින් සිසුන්ගේ ඉගෙනීමේ **හොඳ ලක්ෂණ කිහිපයක්** ප්‍රශංසාවට ලක් කළ යුතු ය

## අවසානය: පරීක්ෂා කිරීමට කාලය වෙන් කරන්න

- පන්තිය/පාඩම අවසානයේ දී, ගුරුතුමිය සිසුන්ගේ සටහන් පොත් (අවබෝධතා මට්ටම) පරීක්ෂා කළා ය.
- ගුරුතුමිය සිසුවියකට නැවත වචන කිහිපයක් උච්චාරණය කරන ලෙස ඉල්ලා සිටියා ය.



1 ශ්‍රේණියේ සිංහල පාඩම



① "මම මොනා ගස් ද අඳින්නේ? මට කිසිම හොඳ අදහසක් ගැන හිතන්න බැහැ."



② මේ වගේ පැලයක් හරි යයි ද කියලා මට හිතා ගන්න බැහැ. දැනට ඒක අඳිමු."



③ "මම ඉස්කෝලෙ මිදුලේ දැක්ක දේට වඩා ටිකක් වෙනස්. ඒක නිසා නැවත අඳිමු."



④ "අනිත් සිසුන් අඳින්නේ මොනා වගේ පැල ද?"



⑤ "අන්තිමට මම ඒක ඇන්දා! මේක ටීචර්ට පෙන්නන්න යමු"



⑥ "මගේ ටීචර් මට ප්‍රශංසා කළා! මට හරිම සතුටුයි!"

# 3. සාරාංශය



## UDL හි ප්‍රතිලාභ


- සියලු ම සිසුන්ට **ක්‍රියාකාරී ව පන්තියට සහභාගී විය හැක.**
- සියලු ම සිසුන්ට **පාඩම හොඳින් තේරුම් ගත හැකිය.**
- විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවෙකුට උපකාර කරන සිසුන්ට ඔහුට/ඇයට ඉගැන්වීම තුළින් **පාඩම් අන්තර්ගතය ගැඹුරින් අවබෝධ කර ගත** හැක.
- පන්තියේ **අන්‍යෝන්‍ය උපකාර සහ සහයෝගීතා** වාතාවරණයක් ඇත
- **මුළු පන්තියේ ම අධ්‍යන කාර්ය සාධනය දියුණු වේ**








## IE සහ UDL අතර සම්බන්ධතාව






## අපි UDL භාවිතා කරමු

UDL **අන්තර්කරණ අධ්‍යාපනයේ** වඩා හොඳ භාවිතයට මග පාදනු ඇති නිසා, කරුණාකර ඔබේ පන්ති කාමරයේ **වැඩි වැඩියෙන් UDL භාවිතා කරන්න!**